## වර්ෂ 2025. 09.16 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී.මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු අංකය | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා | 08.10 |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා | 08.10 |
| 3. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා | 08.20 |
| 4. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල මහතා | 08.21 |
| 5. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික | එච්.එම්. සිසිර සේනාරත්න මහතා | 08.31 |
| 6. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා | 08.32 |
| 7. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන් මල්කාන්ති ලියනගේ | 08.33 |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා | 08.35 |
| 9. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා | 08.36 |
| 10. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා | 08.37 |
| 11. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.වී.ආර්.ධරම්සිරි මහතා | 08.37 |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.පී. මහින්ද ජයලාල් පතිරණ මහතා | 08.39 |
| 13. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එච්.වී. මහින්ද මහතා | 08.40 |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඉරෝෂා උදයංගනී විජේසිංහ | 08.45 |
| 15. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ඊ. රනිල් එදිරිසිංහ මහතා | 08.47 |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා | 08.50 |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා | 08.55 |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා | 09.05 |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා | 09.06 |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා | 09.07 |
| 21. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා | 09.07 |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා | 09.07 |
| 23. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය | 09.15 |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා | 09.18 |
| 25. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා | 09.19 |
| 26. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එල්. සුධීරා සේමිනි ලියනගේ | 09.20 |
| 27. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති මිය | 09.21 |
| 28. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදූභාෂිනී මිය | 09.22 |
| 29. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති මිය | 09.23 |
| 30. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -1 | ඩී.එච්.හරිසිංහ මහතා | 09.24 |
| 31. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ජී. රංගනාත් ගහබඩගේ මහතා | 09.25 |
| 32. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි මිය | 09.28 |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා මිය | 09.30 |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා | 09.30 |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි මිය | 09.30 |
| 36. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මල්කැකුල මහතා | 09.30 |
| 37. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | බී.ඒ. එස්.පී. කැලුම් ශ්‍රී ධර්මදාස මහතා | 09.36 |
| 38. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය | 09.36 |
| 39. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා | 09.37 |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා | 09.35 |
| 41. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා | 09.43 |
| 42. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා | 09.45 |
| 43. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා | 09.41 |
| 44. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා | 09.20 |
| 45. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා | 10.25 |

**01.පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා -

2025.08.12 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා:-**

2025.08.12 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙන්ගොල්ල මහතා-**

**පසුගිය සභා වාර්තාවේ පිටු අංක 13 හි කිරිඇල්ලනගරයේ ප්‍රධානම ගැටළුව පොදු වැසිකිලියක් නොමැතිකම හා ඉංගිරිය රත්නපුර අතර කි.මී.40 ක අතර ප්‍රධාන නගරය කිරිඇල්ල බවට සඳහන් විය යුතුයි. 43 පිටුවේ යෝජනාව දෙවරක් දක්වා ඇත. එහි හියුම් පයිප්ප දමා කොන්ක්‍රිට් කළ යුතු ලෙස සඳහන් විය යුතුයි. අද දින පැමිණ නොමැති එම්.කේ. විජේසිරි මන්ත්‍රීතුමා මාවෙත ලබාදුන්නා සංශෝධනයක්. අංක 49 පිටුවේ තුන්වන ජේදයේ ග්‍රාමනිලධාරිතුමාගේ කටයුත්තට නිසි වේලාවේ සහාය නොදුන් නිසා යනුවෙන් සඳහන් වී ඇති බවත් එය ග්‍රාම නිලධාරිට වතු සුභ සාධක නිලධාරීගේ සහාය ගැනීමට බැරිඋනා ලෙසත් සංශෝධනය විය යුතුයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

48 පිටුවේ දෙවන ජේදය මාගේ ප්‍රකාශයක් නොවේ. 82 පිටුවේ අපේ ඉඩමක් කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම්ට දීලත් ගැටළුවන් උනා ලෙස සඳහන් විය යුතුයි. 97 පටුවේ දිර්ඝකාලීන බදු ඉඩම් ලබාදීමේදි කමිටුවක් පත් කරලා පරික්ෂා කරලා දිය යුතුයි ලෙස සටහන් විය යුතුයි. ඉස්සර දුන්නේ එහෙමයි. සභා රීති 7 යටතේ දක්වා තියෙනවා සභාවේ රැස්වීම හෝ කාරක සභාවකට එන සභිකවරයෙකු අඳුම සම්බන්ධව පිලිපැදිය යුතු ආකාරය. නමුත් මේ සභාවේ රීතිවලට පටහැනිව ඇඳුමක් සහිතව පැමිණෙනවා. ඒ සම්බන්ධව ගන්නා පිළිවෙත කුමන්ද කියා මා විමසුවා. එය සඳහන් විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා-**

68 පිටුවේ මා විසින් ප්‍රකාශ කල සියල්ල වාර්තාවේ සටහන් විය යුතුයි. එය මෙලෙස විය යුතුයි. දැනට ඉදිවෙමින් පවතින මාර්ගයක් තියෙනවා කොස්ගල කොටසේ කිතුල්පේ වසමේ. මේ පාරේ වැඩ පටන් ගන්නකොට මාත් ගියා. පාරේ කොටස් දෙකටම. කොස්ගල පූනාව කියන කොටසේ. අටවෙනිදා පාර අරිනවා කිව්වට පාරේ භාගයක් වත් කරලා නෑ. මේ මාසේ 18 ට කල් ගිහින් . පාසැල් ළමයි 100 ක් විතර යනවා. හල්පෙ, කොස්ගල පාසැල් වලට යනවා. ගුරුවරු එන්නෙත් ඒකේ. ළමයින්ට පන්ති යන්න විධිහක් නෑ. හිතාමතා වහගෙන ඉන්නවා. අඩු සේවක පිරිසකි දාගෙන වැඩ කරනවා. බෝක්කු එක එක වරින් වර දාන්නේ. මේ පාර ඉක්මනට අරින්න කියලා දැනුවත් කරන්න. කොස්ගල ඉතුරු පාර කම්මල හන්දියේ ඉඳන් බැමි කඩලා. බැමි හදලා දෙනවා කිව්ව නිසා ඒ වෙලාවේ බැමි කැඩුවා. කොස්ගල කම්මලේ හන්දියේ ඉඳන් බැම්මත් කැඩුවා. ඊට එහා බැම්මත් කැඩුවා. අඩි 11 ක් උස පස් කණ්ඩියකුත්

කැපුවා. අඩි 11 කියන්නේ අනාරක්ෂිතයි. ඒක කඩා වැටුනොත් ඊට පහල ගේ යට වෙනවා. මම ඉල්ලීම් කරන්නේ කාණු, බෝක්කු , බැමි සියළු දේ කරද්දි රටේ නිතියක් තියෙනවා. ඒ නිතිය අනුව කරන්න කියලා. එසේම දැන් මාර්ගේ බෝක්කුව සම්බන්ධ ගැටළුව. මේ මාර්ගේ කටයුතු භාර අපිට නෙමේ. කාර්මික නිලධාරී, ඉංජිනේරුවරු. ඒ අයට අයිති කටයුතු. අපි කිව්වනේ අඩි තුනේ බෝක්කුවක් දාන්න කියලා. නමුත් දාන්නේ නෑ. ඒ ලඟ ගෙදර කෙනා කිව්වා බෝක්කුවක් ගෙනත් දෙන්නම් දාන්න කියලා. ඒ දාන්නෙත් නෑ. උඩ පැත්තෙන් සාමාන්‍යයෙන් පාරවල් හදනකොට කාණුව දාන්නේ යටි පැත්තෙන්. මේ ගැටළු ටික නිරාකරණය කර දෙන්න, ලෙස සංශෝධන වලට ඇතුලත් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.උමේෂා මල්කාන්ති මිය -</u>

50, 51 පිටුවල යෝජනාවේ කිරිගල ලෙස සඳහන් විය යුතුයි.

**02.සභාපතිතුමා විසින් සභාව වෙත ඉදිරිපත් කල යුතු නිවේදන -**

**1.හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. ලීලානන්ද මහතා වෙනුවට කේ.වි.ආර්. ධර්මසිරි මහතා පැමිණ සිටිනවා. අද දින සිට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කරනවා.**

**2. ගියවර මහා සභාවේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා ඉල්ලීමක් කලා , මාර්ග ඉදිකිරිමක් නොකර මුදල්ගැනීමක් පිළිබඳව ඇත්නම් සොයා බලා ප්‍රකාශයක් සිදු කරන ලෙස. විෂය නිලධාරි විසින් ලබාදුන් තොරතුරු අනුව සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ගෙවීමේදි අදාල ව්‍යාපෘතිය සිදුකල ගිවිසුම්ගත ප්‍රජා පාදක සංවිධානය හෝ කොන්ත්‍රාත් ආයතනය විසින් වැඩ අවසන් බවට ලිඛිතව සභාව වෙත දැන්වූ පසු කාර්මික නිලධාරි විසින් ඒ සම්බන්ධව පරික්ෂාකර නිකතු කරනු ලබන වැඩ අවසන් වාර්තාව අනුව වැඩ විෂය නිමකර ඇති බවට සනාථ කල පසුව අදාළ පරික්ෂා කිරිම් නිමකර ලැබෙන බිල්පත් අනුව විෂය නිලධාරි විසින් ගිවිසුම්ගත වටිනාකම යටතේ ගෙවිම් වවුචර් සකස්කර ඉදිරි ගෙවිම් කටයුතු සඳහා යොමු කරන බවත් මෙම සභාවේ සඳහන් කර ඇති කාරණාව නිශ්චිතව සදහන් කර්මාන්තයක් නොමැති අතර මාර්ගයක නම හෝ කාලවකවානුවක් නොමැති බවද දක්වමි.**

**03. සභා රැස්විමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා -**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්වල මහතා-**</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා හට අද දින අසනීප තත්වයක් මත රෝහල්ගත විමට සිදුව ඇති නිසා නිවාඩු අයදුම්කර ඇති අතර නිවාඩු ලබාදීමට යෝජනා කරමි.**

**උප සභාපති අනිල් ලියනගේ මහතා -යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා හට අද දින අසනීප තත්වයක් මත රෝහල්ගත විමට සිදුව ඇති නිසා නිවාඩු අයදුම්කර ඇති අතර නිවාඩු ලබාදීමට මහා සභා තීරණය විය.**

**04. ප්‍රාදේශීය සභාව අමතා එවනලද සංදේශ ,පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.**

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා -

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

**06-01.** කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ නිසි පරිදි කළමණාකරණය කිරීම සඳහා විධිමත් සැළැස්මක් සැකසීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u> -
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා</u> -

පරිසර හා පහසුකම් කමිටුවේදි මේ සම්බන්ධව සාකච්ඡා කලා. එසේම යම් වැඩපිලිවෙලක් සකස් කලා. අපි බලාපොරොත්තු වෙනවා අවසන් වාර්ථාව සැකසීමට පෙර ගරු සභාවේ මන්ත්‍රීතුමන්ලා තුමියන්ලාගේ තුමන්ලාගේ අදහස් සැලකිල්ලට ගන්න. කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය කසලින් තොරව පිරිසිදු පරිසරයක් සහිතව තිබිය යුතුයි. ඒ සඳහා අපි කුරුවිට නගරය, තදාසන්න නගර, වගේම ගම්වල ජනතාවගේ කසළ සම්බන්ධ විශේෂ ඉල්ලීම් අවශ්‍යතා ඉටුකරන්න වෙනවා. අපි මේ සියල්ල ඇතුලත් වෙන ලෙස ගැලපෙන අවසන් වාර්තාව සැසිය යුතුයි. ප්‍රධාන නගර වගේම පරිවාර නගරත් පවිත්‍ර විය යුතුයි. මේ සියළු කටයුතු වලට ඔබතුමන්ලාගේ අදහස් වැදගත් වෙනවා. සියළු දෙනා එක්ව අපේ බල ප්‍රදේශය පිරිසිදුව තබාගන්න දායක වෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂන නාපාවල මහතා</u> -

ගරු සභාපතිතුමා පැවසූ ආකාරයෙන් අපි මේ සම්බන්ධව පරිසර හා පහසුකම් කමිටුවේදි සාකච්ඡා කළා. මූලික ලෙස මෙම සභාවේ කසළ කලමණාකරනය පිළිබඳව නිශ්චිත දත්ත ලබාගැනීමට හැකි තොරතුරු හෝ දත්ත පද්ධතියක් සභාව සතුව නෑ. මාසෙකට සභාවෙන් කසළ කළමණාකරනය වෙනුවෙන් වැය වන මුදල, ඉන්ධන ප්‍රමාණය, සෞඛ්‍ය සේවක වැටුප් හා දීමනා, ආදිය පිලිබඳව නිශ්චිතව දත්ත නෑ.

මේ වන විට සේවකයින් සම්බන්ධ අඩුපාඩු තියෙනවා. කසළ කළමණාකරණය කරන සියළු සේවකයින් මෙන්ම කසළ ලබාදෙන ජනතාවත් දැනුවත් කළ යුතුයි. කසළ තෝරා ගැනීම වැදගත්. නැත්නම් ගැටළු රැසක්. වැඩිම තියෙන්නේ ඉඳුල්. ඒවා එන්නේ පොලිතීන්, ෂොපිං කවර එක්ක. පරිසර කමිටුවේදි අපි සාකච්ඡා කළා සියළු තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් හදන්න. එසේම සැළසුමක් අනුව මේ කසළ කළමණාකරන කටයුත්ත සිදු කරන්න. එහිදි කෙටි කාලීන, මධ්‍යකාලීන, දිර්ඝ කාලින ලෙස මේ සැළසුම ක්‍රියාත්මක කිරිමට. එහිදි මූලික වශයෙන් මේ කටයුත්ත පිළිබඳව සුදුසු දැණුවත් අයෙක්
යොමු කරලා ඔහු මගින් තොරතුරු ලබාගත යුතුයි. ඉදිරියේදී ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් තොරතුරු දුන්නාම විධිමත් සැළැස්මක් සකසා ඉදිරි සභාවට යොමු කල හැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -

කසළ ජනනය වන තැන නිවස. ගෘහණිය තමා වැඩිම දායකත්වයක් දෙන්නේ. මම යෝජනා කරනවා මන්ත්‍රී තුමියන් 11 ක් ඉන්නවා මේ සභාවේ. කාන්තා කමිටුව හරහා දැනුවත් කිරිම් කරන්න. කසළ ජනනය අඩු කරන්න. තමන්ගේ කසළ ටික කාබනික පොහොර බවට පත්කරගන්න උපදෙස් දෙන්න. ඒ පිළිබඳව හසල දැනුමක් තියෙන අය මේ සභාවේ ඉන්නවා. ඒ අයගේ දායකත්වය අරන් මේ කටයුත්ත කඩිනම් කරමු. අපි මේ කසළ දෙන ජනතාව වෙන වෙනම පොකැට් රැස්වීම් වගේ කුඩා කණ්ඩායම් රැස්වීම් තියලා දැනුවත් කරලා කසළ ජනනය විම අඩු කරවමු. කාන්තාවන්ට පුහුණුවක් දිමට යම් කුඩා මුදලක් වෙන් කරලා පුහුණුවක් ලබා දෙමු. ක්‍රමවේද හදමු. කාන්තා කමිටුවට යම් කර්තව්‍යයක් මේ සම්බන්ධයෙන් පවරන්න. මේ කසල කළමණාකරන සැලැස්ම හදද්දි අපේ දායකත්වයත් ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -

මේ වන විට කසල අපි හැමෝටම ගැටළුවක් වෙලා. කසල වර්ග කරද්දි අපි භාවිතයට ගන්නා දේ, භාවිතයට නොගන්නා දේ අතරින් භාවිතයට නොගන්නා දේ කසල වෙනවා. ඒත් මේ කසළ අතරේ අපිට ඉපයිම් කරන්න පුළුවන්. ලෝකයේ දියුණු ක්‍රමවේද තියෙනවා.කසළ ගැටළුවක් නොවී ඒකට හොඳ උත්තරයක් දෙන්න පුවවන් ආකාරයට සැළසුම් කරමු. ත්‍රී ආර් ක්‍රමය හොඳ සංකල්පයක්. කසළ අවම ජනනය, නැවත භාවිතය හා ප්‍රතිචක්‍රිකරනය යන සංකල්ප තුන ඇතුලත කටයුතු කරන්න ජනතාව දැණුවත් කරමු. කසළ ගොඩවල් ගොඩ ගැහෙන එක වලක්වමු. හැම ගෙදරකම අනවශ්‍ය දේවල් ගොඩ ගැහිලා. සමහරු පොලිතින් පුච්චනවා. පාරිසරික හානියක් ඒක. ඒ දුම ආශ්වාස කිරිම අහිතකරයි. ඒ පිළිබඳව ජනතාවගේ දැණුම අල්පයි. ප්ලාස්ටික් දහනයත් අහිතකරයි. අපි 46 ක් ඉන්නවා. ජනතාවට මේ පණිවිඩ ගෙනියන්න පුළුවන්. නොදිරණ කසල පරිසරයට මුදාහැරීම අවම කිරිම සිදුකලයුතුයි. ඒ පිළිබඳව ජනතාව දැනුවත් කල යුතුයි. අපිට ක්‍රමවේද තියෙනවා. උදාහරණයක් විධිහට අපි කඩේට ගියොත් පොලිතීන් මළු දෙනවා ගන්න ද්‍රව්‍යයත් එක්ක. ඒ වෙනුවට අපිට පුළුවන් දිගු කාලීන භාවිතා කල හැකි මල්ලක්, බෑගයක් කඩේට ගෙනියන්න. ඒ තුලින් ගෙදර නොදිරණ කසල ගොඩ ගැහෙන එක අවම කරන්න පුළුවන්. මේ වන විට එකෝ බ්‍රික්ස් ක්‍රමය මගින් මෙගා බෝතලයකට එකතු කරලා ප්‍රතිචක්‍රිකරණය කරනවා. ගෙදර ගෘහස්තව කරන පරිසර හානිය රටටම බලපානවා. අපි පරිසරය එක්ව රැක ගමු. සභාවක් විධිහට වගකීම අරන් කටයුතු කරමු. ලස්සන ගමක්, නගරයක් තුලින් කසලින් තොර රටක් හදමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

මේ කටයුත්ත වැදගත්. ගම් මට්ටමින් ජනතාව පුහුණු කරමු කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිලිබඳව. දිරණ කසල මගින් පෝර සැකසිමටත් නොදිරන කසළ ප්‍රතිචක්‍රිකරණය සඳහා යොමු කරවිමටත් දැනුවත් කරමු. කසළ එකතු කරණ ට්‍රැක්ටර් වතු වලට එන්නේ නෑ. ඒ පිලිබඳව අවධානයක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

අපි කසළ එකතු කලේ ප්‍රධාන නගර හා කුඩා නගර වලත් වරිපනම් සීමාවට අයත් ප්‍රදේශවලත් විතරයි. ගම්බද ප්‍රදේශ වල කසළ ගත්තේ නෑ. ගම්වලටත් ව්‍යාප්ත කරන්න ක්‍රමවේද හදන්න ඕනි. අද වන විට ගම් වල ජනතාවත් පාරට කසල දාන තත්වයට ඇවිත්. මිනිස්සු වෙනස් කරන්න වෙනවා. ඒ නිසා සියළු දෙනා එකතු වෙලා මේ කටයුත්ත කරමු. දැනට සභාවේ කසළ බැහැරකරන පොහොරබාවේ ඉඩම අක්කර 10 ක් පමණ ගන්න කටයුත් කලා. ඒක අවසන් අධියරේ ඇත්තේ. එතන ප්‍රශ්න තියෙනවා. ඒවාට උත්තර ඕනි. ඒ දවස්වල අපි සාකච්ජා කරලා විසඳුවා. බන්ධනාගාරේ එකට නම් මම කැමැත්තක් නෑ. අනුන්ගේ ඉඩමක ආයෝජනය කරලා . බන්නාගාර අධිකාරිට පූළුවන්ද ගිවිසුම අත්සන් කරන්න. බලය පවරලාද? ඉස්සර අපි උත්සහා කලා කසළ වෙන් කරලා ගන්න. තෝරලා දෙන්න කියලා අපි දැනුවත් කිරිම් කලා. නමුත් ඒක දීර්ග කාලීනව සාර්ථක උනේ නෑ. කසළ තෝරලා හරි කොහොමහරි කසළ පිලිබඳව වගකීම සභාවට තියෙනවා. පාරේ කසළ දාලා තිබුනත් සභාවට වග කියන්න වෙනවා. අපිට සාර්ථක කසළ කළමණාකරන ව්‍යාපෘතියක් අවශ්‍යයි. ඒ කටයුත්තට අපි සියළු දෙනාම සහාය වෙනවා. මේ කටයුත්තට පොහොරබාව ඉඩම ගැලපෙන්නේ නැත්නම් වෙන තැනක හරි ගැලපෙන විධිහට ව්‍යාපෘතියක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි දයා කස්තුරි මිය -

මම කාබනික පොහොර හදලා අලෙවිකළා. ප්‍රමිතියෙන් යුක්තව ඒ කටයුත්ත කලේ. ගෙවල් වලින් කසළ ගන්නකොටම වෙන් කරලාම ගන්න ඕනි. සේරම එකට දාලා එකතු කරලා බෑ. ගෙවල් වල කසල වෙන්කරලා එකතු කලත් මෙහේ ට්‍රැක්ටරෙන් ඇවිත් ඒවා එකට දාගෙනයි යන්නේ. ඉදිරියේදි එහෙම බෑ. කසළ වෙන්කරලාම ගමු. ඒක මේ කටයුත්තට පහසුවක්. ගම්වල ඉන්න කතුන්ට ගෙවත්තෙම පෝර හදලා ගෙවතු වගා කල හැකියි. කසල වෙන් කිරිම ගැන දැනුවත් විම් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -

ඉතා හොඳ යෝජනාවක්. මේ සභාවේ වරිපනම් සීමා, ට්‍රැක්ටර්, කම්කරු ගැටළු කාලයක් තිස්සේ තියෙන ප්‍රශ්ණ. දැනුවත් කිරිම් ඉතා අවශ්‍යයි. මේ කටයුත් පෙර පාසැලේ සිටම කල යුතු දේවල්. දහම් පාසල් , රාජ්‍ය ආයතන, එකතු කරගෙන කසළ කළමණාකරණය කටයුතු ඇරඹිය හැකියි. කුරුවිට නගරයේ විශාල කඩ ප්‍රමාණයක් තියෙනවා. වෙළඳ ප්‍රජාව දැනුවත් කරමු. නගරයේ පාසැල් ඉදිරිපිට කසල කලමණාකරනය පිලිබද දැන්විම් පුවරු දාමු. මන්ත්‍රීතුමා කීවා වගේ ගෙදර තමා කසළ එකතු වන මුල. එතනින් පූළුවන් කසල එලියට දාන ප්‍රමාණය අඩු කරන්න. කසල පොහොර කරන භාජන ගෙවීමේ ක්‍රමයට හෝ නොමිලේ හෝ වෙනත් ක්‍රමවේදයකට ජනතාවට දීලා මේ කටයුත්ත ඉදිරියට ගෙන යමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

මිට පෙරත් හිටපු සභාපතිතුමා අපිව බලංගොඩ එක්ක ගියා කසල කලමණාකරන ව්‍යාපෘතියක් බලන්න. ආදර්ශයක් විධිහට බලංගොඩ නගර සභාව ඒ කටයුත්ත සාර්ථකව කරනවා. ඒත්

පොහොරබාව ඉඩමේ ඒ කටයුත්ත කරන්න බැරිඋනා. ඒ කාලේ තුල අවශ්‍ය විධිහට කසල ගැටළුව විසඳුවා. දිර්ඝ කාලීනව විසඳීමක් වැදගත්. එරත්න පැත්තේ අක්කර දෙකට එක ගෙයයි. මෙහේ පර්චස් කීපයක් තුල කසල කලමණාකරනය කරගන්නේ අමාරුවෙන්. පොලිතින් පුච්චනවා. ඒක විශාල පරිසර හානියක්. ගෙනිහින් දාන්න තැනකුත් නෑ. නොදිරන දේවල් දාන්න තැනක් නෑ. වරිපනම් ප්‍රදේශ දීර්ඝ කරලා දෙන්න. කුඩා බිම්වල තියෙන ගෙවල් වලට දෙන උපදේශය මොකක්ද? මේක කාර්මික කමිටුවේ හරි කතා කරන්න. පුළුස්සන්නෙත් නැතිව දාන්න තැනකුත් නැතිව ඊළඟට පාරේ දමලා යනවා. රට එකතු වෙන කසළ උදේට පාරට දාලා යනවා. කුරුවිට නගරයේ අර බිල්ඩිමේ බුලත් කෙළ ගහලා හැම තැනම ආකල්ප වෙනස් කල යුතුයි. උදාහරණයක් විධිහට සූදාගල නම් කුඩා කාණ්ඩ විධිහට එකතු වෙලා සාකච්චා කරලා මේවා ක්‍රියාත්මක කරන්න ඕනි. නීති ක්‍රියාත්මක කරන්න ඕනි. හැමදාම සභාපතිවරු මාරු වෙනවා. ගැටළුවත් ඒ එක්කම මාරු වෙනවා. ඒ නිසා මේ අවුරුද හතර තුළ ම මේ ගැටළුවට විසඳුමක් හදමු. කුරුවිට නගරයට එක්නැලිගොඩ පීල්ලෙන් උඩහ නෑ. එතකොට රට එහා පැත්තේ ඉන්න අය කුණු ටික මෙහාට විසි කරනවා. ඒ නිසා මේ සියල්ලට විසඳුම් එක්ක කතා කරලා වාර්තාවක් සැලසුමක් හදමු. කුරුවිට ලස්සන නගරයක් විම අපේ හීනයක්. ඒක ඉටු වෙයි. අපි සහාය දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -</u>

සියළු යෝජනා වැදගත්. පරිබාහිරව අදහසක් ඉදිරිපත් කරන්නේ. දැනට ලංකාව තුල අවිධිමත්ව කසල බැහැර කරනවට විරුද්ධව ගන්න නීතිමය පියවර තියෙනවා. නමුත් ක්‍රියාත්මක වෙන්නේ නෑ. අවිධිමත්ව කසල බැහැර කරන තැන් බොහොමයක් තියෙනවා. නිළධාරීන් නොදැක්කා වගේ ඉන්නවා. කිරිඇල්ල පොලිසියේ මම ඉන්න කොට කෙනෙක් යෝගට් කෝප්ප දෙකක් පාරට දැම්මා. ඇප දුන්නේ නෑ. සියළු දෙනා ආවා ඇප ගන්න. මම විරුද්ධ උනා. පහුවෙනිදා උසාවියට දාලා නීති කටයුතු කලා. දැනට වසර 12 කට පමන පෙර කුණු කන්දක් නාය ගිහින් ජීවිත ගණනක් බිලි ගත්තා. නිතිය ක්‍රියාත්මක විය යුතුයි. මෙවැනි කටයුතු පිලිබඳව මැදිහත්වීමට මන්ත්‍රී වරුන්ටත් බලයක් දිය යුතුයි. අවධානය දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -</u>

ඉදිරිපත් වු සියළු අදහස් වැදගත්. කිරිඇල්ල නගරයටත් කසළ විශාල ප්‍රශ්ණයක්. අපි මේ සම්බන්ධව ගත යුතු පියවර පිළිබඳව ජනතාව දැනුවත් කරමු. මේ වන විට ජනතාව විසින්ම ඇල, දොළ, නාන තොටුපළ අපවිත්‍ර කරලා. ඇත්තටම අපි මේ පරිසරය ආරක්ෂා කරන, පරිසරයට ආදරය කරන සංස්කෘතියක් බිහිකරන්න අවශ්‍යයි. එවැනි තත්වයක් අපේ අතීතයේ තිබුණා. මගේ තාත්තා, මම දොළේ නාලා සබන් කොළේ වතුරට දමලා ආවා කියලා මට දඬුවම් කරලා තියෙනවා. වර්තමානයටත් අපි ඒ තත්වය හදමු. අළුත් ගමනක් යමු. හැමෝම එකතු වෙලා මේ කටයුත්ත සාර්ථකව සිදු කරන්න ශක්තිය දහිරිය ලැබේවා යි පතමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී එච්.තනූජා දීපානි චන්ද්‍රිකා මිය -</u>

මේ කසළ සම්බන්ධව වැරදි කරන අයට විරුද්ධව නීති ක්‍රියාත්මක කළ හැකියි කියලා මම දැනං හිටියේ නෑ. කුරුවිට නගරයේ ආරක්ෂිත කැමරා පද්ධතියක් තියෙනවා. සියළු තොරතුරු ඒවායින් ලබාගන්න පුළුවන්. එහෙම තොරතුරු අරන් නගරය අපවිත්‍ර කරන අයට විරුද්ධව

නීතිය ක්‍රියාත්මක කරන්න. කුරුවිට නගරයේ අර ගොඩනැගිල්ල පුදුම අපවිත්‍රයි. මේ ලඟදි අර ට්‍රේලර් සාප්පුව ඉදිරිපිට ජරා කරලා. අපි පස් දාලා වැහුවා. ඒ පස් ටිකත් එතන දින ගානක් තිබුණා. නීතිය තියේනම් ක්‍රියාත්මක කරන්න. දඩුවම් කරන්න. කුරුවිට ලස්සන නගරයක් වෙන්න කියලා අපි ප්‍රාර්ථනා කළාට බෑ. ක්‍රියාත්මක වෙන්න ඕනි. කුරුවිට ලස්සන කරන්න ඒ අපවිත්‍ර බිල්ඩිම එක්ක බෑ. නගරය පවිත්‍රව තැබීමේ පළමු පියවර ඒ බිල්ඩිමෙන් ආරම්භ කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

ලෝකයේ විවිධ, විශාල සම්මේලන තියලා වැඩමුළු තියලා කසළ කළමණාකරනය ගැන කතා වෙනවා. අපේ රටේත් විවිධ අමාත්‍යාංශ, ආයතන වලත් සාකච්ඡා වැඩමුළු වල ජනප්‍රිය මාතෘකාවක් මේ කසළ කලමණාකරණය. ඒත් එදා ඉඳන් තාමත් මේකට විසඳුමක් දෙන්න බැරි උනා. නීතිය තිබුණත් ප්‍රායෝගිකව නීතිය ක්‍රියාත්මක කරන්නේ නෑ. මිනිස්සු දන්නවා තමන් කරන්නේ වැරදි දෙයක් කියලා. නමුත් නිවැරදි දේ කරන්නෑ. අපි දැනුවත් කරනවා. මේ වෙන කොට වැඩසටහන් කොපමන කරලා ඇත්ද? මිනිස් ජීවිත යාන්ත්‍රික වෙලා. උදේ ඉඳන් රෑ වෙනකල් වැඩ කරලා උපයාගත්ත දේකින් එදිනෙදා ආහාරයට වියදමක් දරන්නෙත් අමාරුවෙන්. කසල කලමණාකරනය වගේ දෙයක් ගැන හිතන්න ඒ මිනිසුන්ට වෙලාවක් නෑ. අපි මේක අළුත් විධිහකට , කසළ ගැන දැනුවත් කරමු. ආකල්ප වෙනසක් ඇති කරමු. විකල්ප වලට යමු. කසළ වලටත් වෙළඳ පළක් හදමු. කසළ මිලදී ගන්න ස්ථාන ස්ථාපිත කරන්න. පනහක් විතර දැම්මොත් මිනිස්සු නොදිරණ කසළ දීලා යම් මුදලකුත් ගනියි. මේ කසළ වෙන් වෙන් ව විකුණලා සභාවට යම් ලාභයක් ගන්න පුළුවන්. සභාවට සේවක වියදම් වගේම එක එක විදිහේ තියෙන කසල පිළිබඳ චෝදනා වලට ත් පිළිතුරක් වෙයි. මිනිස්සු පාරේ කසළ වීසිකරලා
යන එකත් නවතියි. අපි 1991 ඉඳන් මේ කසල පිළිබඳව විවිධ කටයුතු කළා. වැඩමුළු ගියා, දැණුවත් කිරිමට චාරිකා ගියා , ඇතැම් ආයතන ලොකු හෝටල වල ලොකු වියදම් දරලා මේ ගැන කථා කරනවා. විදේශ පුහුණුවීම් පවා දෙනවා. අපි මේ රාමුවෙන් පිටත ප්‍රතිඵල ලැබෙන අළුත් යමක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්.එල්. නිරෝෂා ලියනගේ මිය -

කසළ කළමණාකරණය ගැන වැදගත් බොහෝ කරුණු සාකච්ඡා උනා. මේ කටයුතු පිළිබඳව දැණුවත් අයව සම්බන්ද කරගමු. විශ්‍රාමික මහජන සෞඛ්‍ය පරික්ෂ හේමචන්ද්‍ර මහතාවත් මේ කටයුතු වලට සම්බන්ධ කරගමු. කුරුවිට නගරයට ගැලපෙන සැළසුමක් හදලා ඒ අනුව වැඩ කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා -

කසළ කළමණාකරණය පිළිබඳව ගොඩක් අදහස් දැක්වුවා. මම යෝජනා කරනවා ගම්වල තියෙන ස්වේච්ඡා සංවිධාන ආදිය මේ කටයුත්තට සම්බන්ධ කරගමු. සභාව මගින් කසල කලමණාකරණය සම්බන්ධ විධිමත්ව පත්‍රිකාවක් හදලා ස්වේච්ඡා සංවිධාන වල නිලධාරින්, සාමාජිකයින් දැනුවත් කරලා ඒ තුලින් ප්‍රජාව තුලට පණිවිඩය ගෙනියමු.

මාතෘ සායන, මරණාධාර සමිති, දායක සභා, වගේ දැනුවත් කරලා තම තමන්ගේ ගෘහය තුලම මේ කසළ කලමණාකරණයට නැඹුරු කරවිය යුතුයි. අනුරුද්ධ මන්ත්‍රීතුමා කිව්වා වගේ යම් මුදලකට හෝ ක්‍රමවේදයකට කොම්පෝස්ට් සැකසිය හැකි බඳුන් දුන්නනම් වැදගත්. අවශ්‍ය අය ගනියි. අපි පසුගිය දා මේ සභාව ආසන්නයේ භූමිය පවිත්‍ර කලා. කම්බි වැට කැඩිලා. රෝහල් කසල පවා තිබුණා. ගරු මන්ත්‍රී තුමන්ලා, ලේකම්තුමා ඇතුළුව අපි පිළිවෙලකට හැදුවා. ඉතා අපවිත්‍රවයි තිබුනේ. දැන් තත්වය දන්නේ නැ. මෙතෙක් ප්‍රජාව මේ කාරණා පිලිබදව දැනුවත් වෙලා නැ. ඒ හින්දා ස්වේච්ජා සංවිධාන දැනුවත් කරලා ගම තුලට මේ කාරණා ගෙනියමු. අපි එකතු වෙලා මේ කටයුත්තට ක්‍රමවේදයක් හදමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මදුශංක දේශප්‍රිය මහතා -</u>

කසළ කළමණාකරනය තුලින් අපිට නිරෝගි සමාජයක් බිහි කර ගත හැකියි. කසළ විධිමත්ව බැහැර කිරිම තුලින් පාරිසරික හානිය, පරිසර දූෂණය අවම වෙනවා. එතුලින් නිරෝගී සමාජයක් ඇතිවෙනවා. මේ වන විට බහුලව අපජලය අපද්‍රව්‍ය ජලයට ගංගා ඇළ දොළ වලට මුදා හරිනවා. කසළ වර්ග කිරීමෙන් තොරව භාවිතය නිසා අර්බුද ඇති වෙනවා. එසේ කසළ අවිධිමත්ව බැහැරලන අයට විරුද්ධව අදාල නීති ක්‍රියාත්මක කරවමු. සමාජය මේ සම්බන්ධව දැනුවත් කරමු. රෝහල් ආදියට විවිධ රෝගි තත්වයන් වෙනුවෙන් ප්‍රතිකාර සඳහා දරණ වියදම අති විශාලයි. කසල කලමණාකරනය කර පිරිසිදු පරිසරයක් බිහිකිරිම තුලින් මේ වියදම් යාම වලක්වා ගන්නත් හැකියාව ලැබෙනවා. අයහපත් දූෂිත පරිසරය නිසා මිනිස් ජීවිත පවා අහිමිවීමේ තර්ජනයකට මුහුන දිය හැකියි.
මේ යෝජනාව ඉතා වැදගත්. සභාව තුල ඉදිරිපත් වූ සියළු අදහස් සැළකිල්ලට ගෙන අවධානය දි මේ කසල පිළිබද සැලැස්ම සකසන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

පළාත් පාලන ආයතනයක් ලෙස කසල කලමණා කරණය පිළිබඳව සිදුවිය යුතු දේ පිලිබදව අදහස් රැසක් ඉදිරිපත් කලා. පසුගිය කාල වලත් මේ සම්න්ධයෙන් විවිධ ආකාරයේ කටයුතු කලා. දැනට මේ සමාජයේ හැසිරෙන්න පුළුවන් තත්වයට අරන් ඒ තත්වය පවත්වාගෙන යන්න පසුගිය කාලෙත් කටයුතු කලා. ඒ ක්‍රමවේද පලක් නැතිවෙන්න බෑ. එහෙම පලක් නැති උනා නම් අද අපිට මෙතන ඉන්න බෑ. මේ පරිසරයේ ඉන්නත් බෑ. එදා එල්ලාවල තිබුනේ එක කසල කරත්තයක්. ඊක්කයයි. ඉදලයි. කසළ දාන්න ඉඩකඩ තිබුණා. නමුත් දැන් එහෙම නෑ. කසළ දාන්න තැනක් නෑ. පරකඩුව, පත්බේරිය එදා අපි කුඩා කාලේ නොතිබුණ වෙන්දේසි ඉඩම්වල ගම්මාන බිහි වෙලා. මැල්වත්ත පර්චස් 25 බිම් කට්ටි දැන් පර්චස් 10,05, වගේ වෙලා. කුණු දාන්න තැනක් නෑ. ඒ අයටත් පාරට තමා කසළ දාන්න වෙලා තියෙන්නේ. ෂොපිං කවරෙට දාලා පාරට ගෙනත් දානවා. නිල්මිණි උයන, අරලිය උයන, වගේම මේ පර්චස් 10 විතර ඉඩම් තියෙන ගම්මාන වලට ඇත්තටම ගැටළු. ඒ වගේම මේ වෙන්දේසි ඉඩම් වල පනතේ ප්‍රතිපාදන අනුව කට්ටි කරනවාද කියලා බලන්න. මේවායේ නීත්‍යානුකූල තත්වය පරික්ෂා කරලා බලල කටයුතු කරන්න. මේ වෙන්දේසි ඉඩම් වලටත් කැලිකසළ සම්බන්ධව ක්‍රමවේද හදන්න. පත්බේරිය, පරකඩුව, වටප්පිටිය ප්‍රදේශ වල නිලධාරින් ගිහින් වරිපනම් සීමා පැනවිමට අංකනය කලා. තාම අයකරන්නේ නෑ. එසේම වරිපනම් සීමා පැනවීමේදි ඒ ප්‍රදේශවලට විධිමත් කසල එකතු කිරිම, සැලැස්මක් ඇතිව ඒ පහසුකම් සැපයීම ආදිය ගැනත් කටයුතු කරන්න. නැතිනම් ජනතා අප්‍රසාදයක් ඇති වෙයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

මේ වන විට ලෝකයේම ජනසනත්වය වැඩියි. ලෝකයේ දියුණු රටවල් විවිධ ක්‍රමවේද ඔස්සේ මේ කසල ගැටළුවට විසඳුම් සොයනවා. ලංකාවේත් විවිද ක්‍රමවේද අනුව යමින් ඉන්නේ. 1991 ඉදන් තියෙන ගැටළුවක් . කාලෝචිත ප්‍රශ්ණයක්. වඩාත් වැදගත් ඵලදායි ක්‍රමවේදයක් අනුව අපි සැළසුම් සකස් කරමු. මේ කසල විවිධ ආකාරයෙන් දහනය කරන ආයතන තියෙනවා. ඉටිකොළ, පොලිතින්, වගේම දිරණ කසළ දහනය මගින් බයෝගෑස් නිෂ්පාදන කටයුතු කරනවා. ඒ ආයතන වල උදව් ගමු. අපිත් පොලිතින් වගේ දේ ඒ ආයතන වලට දෙමු. මේ කටයුතු විධිමත්ව කල යුතුයි. පොලිතීන් පිලිස්සීම පිලිකා කාරකයි. ඒ වගේ කටයුතු වලටත් නීතිය ක්‍රියාත්මක කරමු. තවදුරටත් මේ ප්‍රශ්ණය දිගට ගෙනියන්නේ නැතිව විධිමත් පිලියමක් යොදමු. ඉඳුල් ආදියත් ඌරු කොටු ආදියට දීමට හැකියාවක් තියෙනවා. සත්ව ආහාර ලෙස. එවිට කසල අඩුවෙයි. මංගල මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ කසළ පිලිබඳව අපි අළුත් ක්‍රමවේද අරන් දැනුවත් කිරීම් කරමු. දහම් පාසලුත් මේ කටයුත්තට යොදාගන්න පුළුවන්. පෙර පාසැලේ සිටම මේ කසල පිලිබඳව විධිමත් ආකාරයෙන් කටයුතු කල යුතුයි කියලා යහපත් ආකල්ප වර්ධනයක් ළමයාට දෙන්න පුළුවන් නම් ඒක හරි වැදගත්. කසළ එකතු කරන වෙළඳ පලක් තිබ්මත් වැදගත්. මනුසත් බලකායේ මූලිකත්වයෙන් ආරක්ෂක කැමරා පද්දතියක් පිහිටුවා නගරයේ තියෙනවා. එතුමන්ලවත් එකතු කරගෙන මේ කසළ ගැටළු වලට උදව් ගමු. තැඹිලියන ප්‍රෙද්ශයේ ඇතැම් පුද්ගලයින්ගේ පාද තුවාල වෙලා. වතුරට අපවිත්‍ර දේ මුදා හැරලා. පරිසර කමිටුව මුල් කරගෙන අපි මේ ගැටළු වලට ක්‍රමවේද හදලා ක්‍රියාත්මක කරමු. ලස්සන කුරුවිටක් බිහි කරන්න කැප වෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. කපිල මුණසිංහ මහතා -

කාලෝචිත ,වැදගත් යෝජනාවක්. කුරුවිට නගරය මේ කසළ ප්‍රශ්නය නිසා වැඩිම පීඩාවට පත් වෙන නගරය. පසුගිය අගෝස්තු 29 දා සභාවේ කම්කරුවන් වලඳුර මහඇලට බැස්සා. පවිත්‍ර කලා. බෝතල් දාස්ගානක් ඇළේ. පොලිතින් මළු වලට දාපු විවිධ කසල මළු පිරිලා. පාලම අසල ඒවා රැඳිලා. මේ සියළු දේ ගසාගෙන යන්නේ කුරුගඟට. පල්ලිය අසල, ගෝනපිටිය බෝක්කුව ලඟ, ආරක්ෂක කැමරා සවි කරලා තියෙනවා. නීතිය ක්‍රියාත්මක කිරිමට මේවා උපයෝගීකරගන්න පුළුවන්. පුඩ් සිටිය ලඟයි, ටිකිරි වයින් ස්ටෝර්ස් එක ලඟයි ආරක්ෂිත කැමරා දැම්මොත් තවත් විස්තර ගන්න පුළුවන් වෙයි. කුරුවිට නගරය තුල මම වැඩි කාලයක් රැඳී සිටිනවා. නගරයේ ගැටව වලට ජනතාව අපිට ඇඟිල්ල දිගුකරනවා. කෙසේ වෙතත් කසළ දැමිමට ස්ථානයක් නගරයට තියේ නම් වැදගත්. වර්ග කරලාම දමන්න පුළුවන් විධිහට භාජන කිපයක් යම් ආයතනයකින් මිලදී ගැනීම අවශ්‍යයි. නගරයේ ව්‍යාපාරිකයින් දැනුවත් කරමු මේ වැඩසටහන් ගැන. මිනිස් ක්‍රියාකාරකම් නිසා විනාශයට පත් වෙන මේ පරිසරය රැකගැනීම සදහා මේ යෝජනාව ඉතා වැදගත්. කසලවලින් තොර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයක් බිහි කිරිමට අපි එක්ව කටයුතු කරමු.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

උප සභාපතිතුමා ඇතුළුව සියළු මන්ත්‍රීතුමන්ලා විසින් අදහස් රැසක් ඉදිරිපත් කලා. මේක භාරදූර කාර්යයක්. සභාවක් විධිහට අපි බලාපොරොත්තු වෙනවා මේ කටයුත්ත ප්‍රමුඛ කාර්යක්

ලෙස ගෙන කටයුතු කරන්න. පක්ෂ පාට භේදයකින් තොරව මේ කාරණය ඉෂ්ට කරන්න සහාය වෙන්න. ලබාදුන්න අදහස් වැදගත් සහ එයට ස්තුතිය පල කරනවා.
මේ සියළු අදහස් අපි පරිසර කමිටුව විධිහට අදාල සැළසුම්වලට යොදාගන්න බලාපොරොත්තු වෙනවා. මංගල මන්ත්‍රීතුමා කිව්වා වගේ අපිට සමහර කසළ මිලක් දීලා ගන්න පුළුවන්. ආයතන කැමතියි කසළ වෙන් කරලා දෙනවා නම් මිලදී ගන්න.
කසල වලට මිලක් දීලා ගැනීම තුලින් ජනතාව උනන්දු වෙනවා ඒ කටයුත්තට.
දිරන කසල සභාව මගින් එකතු කරනවට වඩා තමන්ගේ පරිශ්‍රය තුලම, ගෙවත්ත තුලම පොහොර බවට පත්කිරිමට දිරිගැන්වීම වැදගත්. නොදිරණ ද්‍රව්‍ය ලබාගන්න මැදිහත් වියයුතුයි. කැළුම් මන්ත්‍රීතුමා කීවා වගේ සමහර ප්‍රෙද්ශවල මේ කසළ දමන්න ඉඩ තියෙනවා. සමහර ප්‍රදේශ වල භූමිය ඉඩක් නෑ. දිරණ කසළ වලට කාබනික පොහොර සැකසිය හැකි බඳුන් ලබා දීම හා ඒ හරහා කසල කළමණාකරනයට යොමුකරගැනීමට බලාපොරොත්තු වෙනවා. ඒ බඳුන් නොමිලයේ ලබාදීමට සභාවට ඇති හැකියාව, නීතිමය තත්වය අදහස් ගත යුතුයි. බොතේජු මන්ත්‍රීතුමා කිව්වා වගේ වෙන්දේසි ඉඩම් වල තත්වය අපි විමසා බැළුවා. හැම ඉඩමකම කසල කළමණාකරණය කල හැකි පරිදි ස්ථානයක් වෙන් කරලා ඒ ඉඩමේ කසල කළමණාකරණ සැලැස්ම දිය යුතුයි. අනුමැතිය දෙන විට එය සලකා බලනවා. ඒ වගේම අපි සාකච්ඡා කළා මහජන සෞඛ්‍ය පරික්ෂක වරුන් එකතු කරගෙන මේකුරුවිට නගරයේ හා වලඳුර ඇළ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න. ආහාර නිෂ්පාදන ආයතන පරික්ෂා කරවලා ඔවුන්ව දැනුවත් කරලා , ඒ ආයතන ශ්‍රේණිගත කරලා ජනතාවට ප්‍රදර්ශනය කරනවා. හෝටල් ආදිය එසේ ශ්‍රේණිගත කල යුතුයි. ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කිරීම සම්බන්ධව ගියවර සභාවට දැම්මා. දර්ශන ලබාගත හැකි පරිදි විධිමත් ආකාරයෙන් ඒ කටයුත්ත කරමු. කසල කලමණාකරනයේදි බයෝගෑස් නිපදවිමටත් තැනක් දෙමු. ඒ ක්ෂේත්‍රයේ ප්‍රවිනයන්ගේ උපදෙස් ලබාගමු. ඉදිරියේදී මේ කටයුත්තට අදාළව ගරු මන්ත්‍රීතුමන්ලා, උනන්දු වෙන පිරිස එකතු කරගෙන දැණුම තියෙන අය අරන් මේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙනියමු. මම විශ්වාස කරනවා මේ කටයුත්ත වෙනුවෙන් සියළු දෙනාම සහාය දෙනවා කියලා. කුරුවිට, කිරිඇල්ල වගේම පරිවාර නගර සියල්ල පිරිසිදුව මනා කසළ කළමනාකරනයෙන් යුතුව පවත්වාගෙන යන සංචාරක ආකර්ශණය දිනාගත් , ජනතාවට සෞඛ්‍යසම්පන්නව ජිවත්වියහැකි බලප්‍රදේශයක් බවට කුරුවිට සභා බල ප්‍රදේශය පත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිනව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ නිසි පරිදි කළමණාකරණය කිරීම සඳහා විධිමත් සැළැස්මක් සැකසීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-02.** ජම්බුගහහේන පොදු ළිඳ ප්‍රතිසංස්කරණය සඳහා රු. **100000.00** ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මෙම ළිඳ පිහිටා තියෙන්නේ පොහොරබාවේ.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිනව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව පොහොරබාව, ජම්බුගහහේන පොදු ළිඳ ප්‍රතිසංස්කරණය සඳහා රු. 100000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

06-03. පොලැල්වත්ත මොරගමුව ගම හරහා පොහොරබාව හන්දිය දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිම හා ප්‍රතිසංස්කරණය කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය ඒකමතිනව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව පොලැල්වත්ත මොරගමුව ගම හරහා පොහොරබාව හන්දිය දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිම හා ප්‍රතිසංස්කරණය කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

06 – 04. එල්ලාවල ප්‍රදේශය ආවරණය වන පරිදි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවිම සඳහා එල්ලාවල පිහිටි මහාභාරකාරතැන සතු රදාගේ වත්ත නමැති ඉඩමේ නිවස හා අක්කර 1/2 ක් පවරාගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මේ ඉඩම අයිතිව තිබුණේ මහාචාර්ය අමරතුංග ප්‍රනාන්දු මැතිතුමාට. ඔහු බුද්ධිමතෙක්. ආනන්දේ ගුරුවරයෙක් ලෙසත් හිටියා. මිය යන විට ඔහු සතුව තිබුන අක්කර 06 ක ඉඩම මහාභාරකාරතැන යටතට පත් කලා. එතුමාගේ අවසන් ඉල්ලිම උනේ මේ ඉඩම අධ්‍යාපන කටයුත්තක් සඳහා භාවිතා කරන ලෙසයි. එල්ලාවල, පොහොරබාව, මුදුන්කොටුව, තලාවිටිය, අමුහේන්කන්ද ළමුන්ට පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් හා කියවීම් ශාලාවක් හදන්න පුළුවන්. මේ ඉල්ලීම මහාභාරකාරතැන වෙත යොමු කරන ගමන් මේ

සම්බන්ධව සබරගමු පළාත් ගරු ආණ්ඩුකාරතුමියටත් ඉදිරිපත් කරන්න. එකඟත්වය ගන්න. මේ මහාභාරකාරතැන සතු දේපළ පවරාගැනීමේ ක්‍රමවේදයක් තියෙනවා. ඉල්ලන්නේ අධ්‍යාපන කටයුත්තකකට නිසා පහසු වෙයි ගන්න.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
අදාල ඉල්ලීම් හා ඉදිරි කටයුතු සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාව අනුව එල්ලාවල ප්‍රදේශය ආවරණය වන පරිදි පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා එල්ලාවල පිහිටි මහාභාරකාරතැන සතු රදාගේ වත්ත නමැති ඉඩමේ නිවස හා අක්කර 1/2 ක් පවරාගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

06-05 . නාමල්දෙනිය ජල යෝජනා ක්‍රමය සඳහා ජල ටැංකියක් ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි කේ.ඩී. චූලා ශාන්ති මිය.
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාව අනුව නාමල්දෙනිය ජල යෝජනා ක්‍රමය සඳහා ජල ටැංකියක් ලබාදිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

06-06. කුරුවිට ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ තොරතුරු තාක්ෂණය පිළිබඳව නිපුණතාවය හා දක්ෂතාවය ඇති අයට හා ඒ පිළිබඳව උනන්දුවක් ඇති අයට රැකියා අවස්ථා ලබාදීමට සුදුසු වැඩපිළිවෙලක් සැකසීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි කේ.ඩී. චූලා ශාන්ති මිය.

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

ප්‍රාදේශිය සභා ආරම්භ කළ අවධියේදි කියවීම් ශාලා, පුස්තකාල වලට ජනතාව උනන්දු උනා. ආවා. නමුත් මේ කාලය වන විට මේ පුස්තකාල වලට එන පාඨක ප්‍රමාණ අඩු වෙලා. කියවීම අඩු වෙලා. ඒ වෙනුවට දුරකථනය, තාක්ෂණය එක්ක බැඳීම් වැඩි වෙලා. ලිපි ගණුදෙණු

තාක්ෂණය හරහා වෙලා. අපි හිතනවා මේ රටේ උන්නතිය සඳහා මේ තාක්ෂනය හා ඒ නිපුණතාවය ඇති පිරිස සහභාගී කරගැනීම වැදගත්. මේ රටේ විසිර ඉන්න ඒ පුද්ගල කොටස් රටේ ආර්ථිකය ශක්තිමත්කරන්න යොදාගත හැකියි. තාක්ෂනය මුළු සමාජයම වසාගෙන. නේපාලය කුඩා රටක්. නමුත් තාක්ෂනය නිසා දියුණුවේ ඉහලටම ගියා. එරත්න සිට කොළඹට ගියොත් වෙලාව කොපමනද? පැය තුනක්. නමුත් එරත්න පරිසනක තාක්ෂන මධ්‍යස්ථානයක් ලෙස යම් පවත්වාගෙන යාමක් කලොත් මෙරට විතරක් නෙමෙයි විදේශ විනිමය උපදවන්නත් ගමේ ඉඳන්ම පුළුවන්. කුරුවිට පුස්තකාලය, කිරිඇල්ල නාමල්දෙනිය පුස්තකා මේ කටයුතු වලට යොදා ගන්නත් පුළුවන්. පරිසනක සාක්ෂරතාවය ඉහල නංවන්නත් යොදාගන්න පුළුවන්. පහසුකම් වැඩි දියණු කරලා යොදා ගන්න පුළුවන්. 1977 න් පසු මේ රටේ ආර්ථිකය වෙනස් උනා. ව්‍යාපාර අඩුයි. ව්‍යාපාර වලට රජය දායකත්වය දුන්නා. පසුකාලීනව ඩොලර් අර්බුධ ඇති උනා. අපනයනය ශක්තිමක් කල යුතුයි. සම්ප්‍රදායික තේ පොල් රබර් විතරක් නෙමෙයි නව තාක්ෂනය සංචාරක කර්මාන්ත වගේ මුලට ගෙනල්ලා රජය හා පුද්ගලික අංශය එකතු වෙලා ආර්ථිකය ශක්තිමත් කරන්න ඕනි. යෝජනා දෙන්න. පළාත් පාලන ආයතනයක් විධිහට අපි මේ ප්‍රගතියේ කොටස් කරුවන් වෙමු. අදහස් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

කාලීන කර්තව්‍යක්. උප සභාපතිතුමා විදාතා ව්‍යාපෘතියේ කටයුතුත් සාර්ථකව කලා. ඉදිරි පරපුරට ඒ තුලින් ද්විතියික අධ්‍යාපනය දුන්නා. ඒ ස්ථානත් ගන්න බැරිද මේ කටයුත්තට?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -

පුස්තකාල වල පරිගනක මධ්‍යස්ථාන පවත්වනවා වගේම පුස්තකාලවලට නව තාක්ෂණය අවශ්‍යයි. අපේ පොතක් හොයාගන්න ගියොත් ඉතාමත් දුෂ්කරයි. පොත පුස්තකාලේ තියේද දන්නෙත් නෑ. අර කොහා තාක්ෂනය වගේ භාවිතා කරලා යම් ක්‍රමවේදයක් අනුව මේ කටයුතුත් කල හැකියි. ඒ කටයුතු වලටත් සහාය ගන්න පුළුවන් විධිහට මේ මධ්‍යස්ථාන ස්ථාපිත කරන්න. මේ සභාව තුලින් කුරුවිටට කල විශාල සේවයක් වෙනවා. ඒ කටයුත්ත කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -

පුස්තකාල කමිටුවේ මේ නයනා මන්ත්‍රීතුමිය දැක්වූ දේ ගැන සාකච්චජා කලා. අපි දත්ත පද්දතියක් නඩත්තු කරන්න කටයුතු කරනවා මේ සියළු තොරතුරු සහිතව. කිරිඇල්ල නාමල්දෙනිය පුස්තකාල වලටත් එක්කම.පොත් විශාල ප්‍රමාණයක් පුස්තකාල සතුව තිබුනත් පාඨකයින් අඩුයි. නව තාක්ෂනය එක්ක මේ කටයුතු කලොත් සමාජය වෙනස් වෙයි. සමාජය ඉල්ලන දේ ඵලදායි විධිහට තාක්ෂනය සමග ලබා දෙමු. අපි කමිටුවේ කතා කලා. ජනතාවට පුස්තකාල පරිහරණ කටයුතු වැඩිවෙන විධිහට මේ කටයුතුත් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -

මේ රජයේ මූලික අරමුණක් ඩිජිටෙල්කරණය. කුරුවිටටත් අවශ්‍යයි. තොරතුරු තාක්ෂනය සමග ඉදිරියට යන්න ජනතාවට පලදායි කයුත්තක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

මේ කටයුත්ත පුස්තකාල වලට විතරක් සීමා නොවී ගම් වලටත් ගෙනියමු. සියව විෂයන්ට අදාල කරගමු. මගේ වසමෙත් තරුණ තරුණියන් නව තාක්ෂනය සමග කටයුතු කරලා විදේශ විනිමය රටට ගේනවා. තරුණ තරුණියන්ට පැල බෙදුවට, පාර හැදුවට නෙමේ ඒ අයගේ ඉල්ලීම ඒ තාරුණ්‍යට වැදගත් වෙන්නේ තාක්ෂණය . සභාවක් විදිහට පුළුවන් තත්වයකින් මේ කටයුතු ආරම්භ කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -

කාලෝචිතයි මේ කටයුත්ත. 2005 වසරේ උප සභාපතිතුමා නැණසල ගැන කථා කලා.

නාමල්දෙනියේ වහලා තිබුණ ගොඩනැගිල්ලක එතුමා මේක ආරම්භ කරලා ඉතා හොඳින් පවත්වාගෙන යනවා. තාක්ෂණය තුලින් නව ලොවක් බිහි කිරීමට ඒ කටයුතු ඉතා වැදගත්. එතුමා ගත් අත්සාහය සාර්ථකයි. මේ කටයුත්තත් සාර්ථකව කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -

අතීතයේ සිට අපේ සංකල්පයක් වැවයි, දාගැබයි, වැවයි පන්සලයි. ඒ වගේ මහජන පුස්තකාල වලටඅළුත් අරමුණක් ලෙස තාක්ෂනය වැදගත්. උප සභාපතිතුමා කීවා වගේම නව තාක්ෂනය මගින් විදේශ විනිමය අතපත් කරගන්න අවශ්‍යයි. දුරකථනය මගින් ඔන්ලයින් ලෙස විදේශ විනිමය ඉපයිම පිලිබඳව දැනුවත් කරලා නව පරපුරට සහායක් දෙමු. පුස්තකාල වලට පරිසනක මධ්‍යස්ථාන සංකල්පයක් ලෙස වැදගත්. සාර්ථකව කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් මහතා -

අපේ රජයේ ප්‍රමුඛ කාර්යක් ඩිජිටෙල්කරණය. ලෝකප්‍රකට, තාක්ෂණය පිලිබඳ විද්වතෙක් විශාල වැටුපකුත් අතහැරලා ලංකාවට ආවේ ඒ කාර්ය ඉටු කරන්න.මේ රටට ඇවිත් ඒ කාර්ය ආරම්භ කරලා. ඉදිරියේදී ජනතාවට පහසු ආකාරයෙන් වගේම වංචාව, දූෂණය නැති වෙන විදිහට සියළු පටිපාටි වෙනස් වෙනස්වෙනවා. අපිත් සභාවක් ලෙස මේ කටයුත්තට සූදානම් වෙමු. වර්තමානයේ ඒ කටයුතු රජය ආරම්භ කරලා තියෙන්නේ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

අල්ලස, දූෂණය පිටු දැකලා ඉදිරි මාවතකට යන්න නව තාක්ෂනය උපයෝගී කරගැනීම වගේම රටක් දියුණු කරලා ගොඩදාන්න මේ තාක්ෂණයට පුළුවන්. අපේ රටේ ඒකපුද්ගල ආදායම අතීතයට වඩා දැන් වැඩියි. තාක්ෂණය යම් යම් අංශ වලට අදාල වෙලා. වර්තමාන රජයත් ඒ වෙනුවෙන් කැප වෙලා. කර්මාන්තපුරයේ ඉඩම් නිදහස්ව තියෙනවා. ඒ වගේ ස්ථාවල හොඳ ආදායමක් ලැබෙන විදිහට මේ නවින තාක්ෂනය ආධාරයෙන් යම් ව්‍යාපෘති ආරඹිය හැකියි. අපනයන ආයෝජන මණ්ඩලයෙන්,ශ්‍රිලංකා තොරුතුරු

තාක්ෂණමණ්ඩලයෙන් සම්පත් දායකත්වයක් අරන් අපිට පුළුවන් වැඩමුළුවක් දමන්න. අපේ ප්‍රදේශයේ තරුණ පිරිසට ඒ අවස්ථාව දෙමු. විදාතා මධ්‍යස්ථානයෙන් නිෂ්පාදනක්‍රියාවලිය වැඩිදියුණුකිරීම කෙරෙනවා. පරිසනක තාක්ෂනයට වඩා ග්‍රාමීය නිෂ්පාදන කටයුතු කෙරේ සක්‍රියයි. ව්‍යවසායකයින් බිහි වෙනවා. මේ කටයුතු පිලිබඳ ප්‍රගතියක් අවශ්‍යයි. පසුගිය සභාවේ ගත් තීරණවල ප්‍රගතිය දැනුම්දෙන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

නවින තාක්ෂනය භාවිතයෙන් ලොව රටවල් ඒ ක්ෂේත්‍ර වලින් ඉදිරියට ඇවිත්. සව්දි තෙල් වලින්, ජපානය වාහන වලින්, වියට්නාමය පෝන් වලින් ,අපි තාමත් තේ,පොල්,රබර්. අපේ රටේ දැනුම තියෙන පිරිස ඉන්නවා. ඒ අයගේ සහාය ඇතිව රට තොරතුරු තාක්ෂණය සමග ඉදිරියට යන්න ඕනි. අපේ රජයේත් ප්‍රධාන අංශ තුනක් යටතේ වන අරමුණු වලින් ඩිජිටෙල්කරණය අදාලයි. අපි සුදුසු ආයතන සම්බන්ධකරගෙන සහාය අරගෙන මේ කටයුත්ත කරමු. අවශ්‍ය අංශ දැනුවත් කරමු, ඉදිරි කටයුතු සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තොරතුරු තාක්ෂණය පිළිබඳව නිපුණතාවය හා දක්ෂතාවය ඇති අයට හා ඒ පිළිබඳව උනන්දුවක් ඇති අයට රැකියා අවස්ථා ලබාදීමට සුදුසු වැඩපිළිවෙලක් සැකසීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරිමට හා අදාළ අංශ දැනුවත් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -</u>

**06-07.** කදිරංදොළ සිට දකුණට ඇති ගුරුපාර මීටර් **300** ක් පමණ කොන්ක්‍රිට් කිරිමට ඇති අතර පළමු අධියරේදි මෙම පාරේ අඩක් හෝ කොන්ක්‍රිට් යොදා සකස් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා ගේ යෝජනාව අනුව කදිරංදොළ සිට දකුණට ඇති ගුරුපාර මීටර් 300 ක් පමණ කොන්ක්‍රීට් කිරිමට ඇති අතර පළමු අධියරේදි මෙම පාරේ අඩක් හෝ කොන්ක්‍රීට් යොදා සකස් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -</u>

**06-08.** නාගොඩ බෝගහවෙල පාර ප්‍රමිතියෙන් තොරව මෙයට වසර කීපයකට පෙර ඉදිකර ඇති අතරදැනට මාර්ගය අබලන්ව ඇති බැවින් මීටර් 100 ක් පමණ කොටසක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -</u>
වසර හතකට පමන පෙර කොන්ක්‍රීට් කරලා. දැන් ඒ මාර්ගයේ යන්න බෑ.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා ගේ යෝජනාව අනුව නාගොඩ බෝගහවෙල පාර ප්‍රමිතියෙන් තොරව මෙයට වසර කීපයකට පෙර ඉදිකර ඇති අතරදැනට මාර්ගය අබලන්ව ඇති බැවින් මීටර් 100 ක් පමණ කොටසක් කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -</u>

**06-09.** හොලිපිටිය වසමේ හොලිප්ටිය ගමේ අළුත්ගෙදර වත්ත දෙසට යන මාර්ගයේ ඇති අනාරක්ෂිත කොටසේ ආරක්ෂිත වැටක් ඉදිකිරිම සඳහා රු. 300000.00ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා ගේ යෝජනාව අනුව හොලිපිටිය වසමේ හොලිප්ටිය ගමේ අළුත්ගෙදර වත්ත දෙසට යන මාර්ගයේ ඇති අනාරක්ෂිත කොටසේ

ආරක්ෂිත වැටක් ඉදිකිරිම සඳහා රු. 300000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

**06 - 10.** වළදූර කිරිගල මාර්ගයේ ඉහල කොටස මාර්ගය ඉතා අබලන් ව ඇති බැවින් අඩි 300 ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

මෙම මාර්ගය සෝදාපාළුවට ලක් වෙලා. වාහනයක් යන්න බෑ. අත්‍යවශ්‍යතාවක්.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව වළදූර කිරිගල මාර්ගයේ ඉහල කොටස මාර්ගය ඉතා අබලන් ව ඇති බැවින් අඩි 300 ක් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

**06 - 11.** වළදූර ප්‍රදේශය සඳහා ප්‍රජා ජල ව්‍යාපෘතියක් සැකසීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

මේ ප්‍රෙද්ශයට නිසි ලෙස ජලය ලබාගන්න ක්‍රමයක් නෑ. ප්‍රජා ජල ක්‍රමයක් ස්ථාපිත කරලා සංවර්ධනය කරන්න. දැනට තියෙන ජල ක්‍රමයේ ජලය ප්‍රමාණවත් නෑ. මීටර් සවිකරලා කටයුතු කලොත් ජලය භාවිතය සීමා වෙයි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු. අවශ්‍ය දැනුවත් කිරිම් ද සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව වළදුර ප්‍රදේශය සඳහා ප්‍රජා ජල ව්‍යාපෘතියක් සැකසීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නිරෝෂා ලියනගේ මිය -</u>**

**06 - 12.** **නඩුකාරදෙනිය ගැමි පුබුදු මාවත කෙළවර සිට පාළුවත්ත දෙසට කුඹුරු මැදින් ගමන් ගන්නා කෙටි මාර්ගය සකසා මීටර් 30 ක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
**ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නිරෝෂා ලියනගේ මියගේ යෝජනාව අනුව නඩුකාරදෙනිය ගැමි පුබුදු මාවත කෙළවර සිට පාළුවත්ත දෙසට කුඹුරු මැදින් ගමන් ගන්නා කෙටි මාර්ගය සකසා මීටර් 30 ක් කොන්ක්‍රීට් කිරීමට සිදුකිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය -</u>**
**06- 13.** **කුරුවිට මලව සමනල පෙදෙස වරිපනම් සීමාව තාවකාලිකව දික්කර ගැනීම සඳහා යෝජනා කරමි.**
**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනී අතුකෝරළ මිය -</u>**

**මේ ප්‍රදේශය නගරයට ආසන්නයි. 2017 තක්සේරුවට ආවත් මීටර් 50 ක වගේ දුරක් තක්සේරු කලේ. පාරේ කොටසක් අතහැරිලා. මේ කොටසේ ඉන්නේ ඉතා අඩු බිම්කොටස්වල පදිංචි අය. පර්චස් 15,10 වගේ තියෙන්නේ. කසල කළමනාකරනයට ඉඩක් නෑ. පිරිස එකතු වෙලා මුදලක් ගෙවලා කීප දෙනෙක් කසල ටැක්ටරය ගෙන්වා ගන්නවා. නමුත් වරිපනම් ප්‍රෙද්ශයක් නොවන නිසා අනෙක් අයගේ කසල ගන්නේ නෑ. ජනතාවගේ ඉල්ලීම මේ ප්‍රෙද්ශයට තාවකාලිකව හෝ වරිපනම් තක්සේරු කරලා කටයුතු කරන්න. මේ ප්‍රදේශය ඒකට සුදුසුයි. මාර්ග හැදිලා සංවර්ධනය වෙලා. වරිපනම් සීමාව දික්කරලා ජනතාවගේ මේ අවශ්‍යතාවය ඉටු කරලා දෙන්න.**
**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
**මේ සම්බන්ධව නීත්‍යානුකූලව ඉදිරි ක්‍රියාමාර්ග ගමු.**

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව කුරුවිට ,මලව සමනල පෙදෙස වරිපනම් සීමාව තාවකාලිකව දික්කර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -

**06- 14.** කුරුවිට මලව මෛත්‍රී මාවත ඉතිරි කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -
එම යෝජනාව ස්ථිර කරමි
.
ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව කුරුවිට මලව මෛත්‍රී මාවත ඉතිරි කොටස සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -

**06- 15.** දොඩම්පෙ, ගොරකඇළ තුන්මං හන්දියේ කබල්මිල්ල පාර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලා ශාන්ති මිය -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව දොඩම්පෙ, ගොරකඇළ තුන්මං හන්දියේ කබල්මිල්ල පාර සංවර්ධනය කිරිමට අනුව ඒකමතිකව මහා සභාවේ තීරණය විය.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා-
**06- 16.** අඩවිකන්ද තෙබුවකන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මයා -
එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතාගේ යෝජනාව අනුව අඩවිකන්ද තෙබුවකන්ද මාර්ගය කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතා-

**06 -17.** එරත්න පැරණි ශ්‍රී පාද මාර්ගය මුල් අධියර කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මයා -
එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
ප්‍රතිපාදන ලැබෙන අයුරින් සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් එදිරිසිංහ මහතාගේ යෝජනාව අනුව එරත්න පැරණි ශ්‍රී පාද මාර්ගය මුල් අධියර කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් කරනු ලබන යෝජනා -

**06- 18.** ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන යනු ලබන විවිධ උසාවි වල ඇති නඩු සම්බන්ධයෙන් විශාල වියදමක් දරණ බැවින් සභාවට සිදුවන වාසි හා අවාසි සම්බන්ධයෙන් අවධානය යොමු කර අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කොට සමතයකට පත්කර ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
මීට ඉහතදිත් මේ පිලිබදව අපි සභාවේ කතා කළා. විකල්ප ලෙස අපි නීතිඥවරයෙක් ව මාසෙකට යම් නිශ්චිත මුදලක් ගෙවීම් කරන්න අරන් අන්තිමට අධිභාරත් උනා. අපි නීතිය දන්නවා. ක්‍රියාත්මක වීමේදි ගැටළු. ඒ අධිභාරය වැරදි තීරණයක්. මේ සභාවට විශාල මුදලක් නඩු වලට යනවා. අපි සභාවට එන්න පෙරම තියෙන නඩු. ලොරිපාක් එකේ නඩුව. තාම තැනතැන නඩු කියනවා. ඇපිල්කරපු නඩු තියෙනවා. මේ අවුරුදු හතරටවත් විසදන්න බෑ. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් අපි බදු ගත්ත ඉඩම් වලත් නඩු. දුම්රිය දෙපාර්තමේන්තුව

දෙපැත්තකට බදු දිලා. 36 බී නඩුව කඩා ඉවත් කරපු තැනකට කියන නඩුවක්. කඩකරු එක්ක අපි නඩු කියනවා. නිතිඥ ගාස්තු අපතේ.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මොන නඩුද ඉවත් කල හැක්කේ. නඩු 25 ක් විතර තියෙනවා. බහා තබා ඇති නඩුත් තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

කිරිඇල්ල සභා දේපලක් පුද්ගලයෙකු භුක්ති විඳිනවා. සන්තකය අපිට ගන්න තිබුන එකක්. සංස්කෘතික මධ්‍යස්ථානයේ අපේ පෙරපාසැල් ගොඩනැගිල්ල. බහා තියෙනවා. සමහරු අපිට නඩු දාලා. අලාභ ඉල්ලා. ඒවා උනත් කතා කරලා ඉවත් කරගන්න පුළුවන්. පක්ෂ විපක්ෂ කමිටුවක් හදලා නඩු පාර්ශව ගෙනල්ලා සාමාදාන වියහැකි බව, තියෙන පාඩුව පෙන්වා දෙමු. සාමාදාන කරන්න බලමු. 1991 ඉඳලා බාලගංගොඩ පාරට නඩු කියනවා. ඒවා විසඳන්න බෑ. ඒවා සමථ වෙමු. මිනිසුස්න්ට යහපතක් වගේම සභාවට වියදම ඉතිරි වෙනවා. නීතිඥ ගාස්තු ඉහලයි. කොළඹ පවා නඩු තියෙනවා. අපි සමථ වියහැකි තරමක් කරගමු. රාජ්‍ය ආයතන එක්කත් නඩු කියනවා. ක්‍රමවේදයක් හදලා කරමු. දිනයක් දාගමු. සුහදව කතා කරලා විසඳා ගමු. මේක සභාවට ලාභයක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>

නඩු සමථ වෙන එක හොඳයි. නමුත් මට දැනගන්න ඕනි මේ සමථ වෙන ඒවා, නොවෙන ඒවා මොනවාද? අපි තාවකාලික කඩයක් දුන්නා. ස්ථිර කඩයක් දුන්න යන්න කිව්වා. හිලව් කඩේ ඉවත් කරන්න ගියා. දිනයක් කල් දෙන්න කිව්වා. මන්ත්‍රී කෙනෙක් උදව් කරලා නඩුවක් දාන්න. ඒ නඩුව පරාදයි. ඒ වගේ නඩු සමථ වෙන්න බෑ. අපි ගිහින් දාපු නඩු නෙමේ. මිනිස්සු දාපු නඩු. අධිහාර උනේ නීතිඥ කෙනෙක් බඳවා ගත්තට. සභාවට විශාල වියදමක් උනා නීතිඥ ගාස්තු. තිස්දාහ,හතලිස්දාහා වගේ එක නඩුවට . ඊටත් වැඩියි. ඉතින් අපි මාසෙට සේරම නඩු කටයුතු වලට රු. 25000.00 ක් ගෙවන්න නිතිඥ කෙනෙක් යෙදෙව්වා. මේ බඳවා ගත්ත ක්‍රමවේදය වැරදිළු. අපේ සමහරු ගෙව්වා. මේ අවුරුදු 10 ටම ආපු එකම අධිහාරය. ගියවර අධිහාර වෙයි කියලා සමහරු කිව්වා. මම කියනවා ඒ කාරණාවට කාට හරි අධිහාර උනොත් ඒ මුදල මම පුද්ගලිකව ගෙවනවා. ඉතින් නඩු සියල්ල සමථ වෙන්න බෑ. ගැලපෙන ඒවා බලන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

සභාවේ නීතිඥ බඳවාගැනීම අධිහාරයට ලියුම් අභාවයට පත්උන කුලරත්න මන්ත්‍රී තුමාටත් ආවා. අපි රු. 2000.00 ගෙව්වා. අනිත් අය ගෙවන්නේ නෑ. මන්ත්‍රීතුමන්ලාත් ගෙව්වා. අපි ඒ යෝජනා අනුමත කලෙත් නෑ. සභා වාර්තාව අරන් බලන්න. ඒ මුදල ගෙව්වේ නැත්නම් නඩු දානවා කිව්වා. අපි ගෙව්වා. නමුත් ඒ කිසිවක් සිදුඋනේ නෑ. ඒ නිසා රු. 2000.00 නැවත දෙන්න. මම කියන්නේ මේ සම්බන්ධව නඩුවක් අධිකරනයේ තියෙනවද? නැත්ද? අයකරනවානම් සියළු දෙනාගෙන් අයකරන්න. නැත්නම් අයකරගත්ත මුදල් ආපසු දෙන්න. ඊළඟ සභාවෙදී මේ ගැන තොරතුරක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

ගිය සභාවෙත් මම කිව්වා. මේ සම්බන්ධව නඩුවක් දානවානම් දාන්න. පෙනී හිටින්නම්. රු. **25000.00** ක් දුන්නේ නීතිඥවරයාට වැඩ කලාට. ඒ වැඩ කල මුදලත් එක්ක වගේ මේ අයකිරිම. මෙතන අසාධාරණයක් තියෙනවා. පනතෙන් තොරතුරුත් ඉල්ලුවා. ගෙවන්න උනොත් ගෙවනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

විටින් විට කතා කරන්න බෑ. රීති අනුව. උස්හඬින් කතා කිරිම එක් පාර්ශවයකට විතරක් සිමා වෙන්න බෑ. සභාවේ අපි හිටියෙත් නැතිවයි මේ අයකිරිම කරලා තියෙන්නේ. මේ විස්තරය නඩුව පිළිබඳව දෙන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

අධිකරණයේ තියෙන නඩු පිළිබඳව මේ සභාවේ තීන්දු අරන් කටයුතු කරන්න බෑ. මේ එක එක නඩු අංක කියන්න එපා. මේවාත් නඩු සාක්කි වෙයි. මෙවැනි යෝජනා ඉදිරිපත් කරද්දි කල්පනා කරන්න. පෙරකලාසි කලාට පස්සේ ඒ කාර්ය නිතිඥයා හරහා කරනවා. ඒ නඩු ඕනි ඕනි විදිහට වෙනස් කරන්න බෑ. අධිකරණ කටයුතු එක්ක එහෙම බෑ. අපි නඩුවෙන් පරාද උනොත් සභාවක් විධිහට හැමෝටම වග කියන්න වෙයි. අපිට වගකිමක් තියෙනවා. අපි අර මුදල්ගෙව්වා අධිහාරයේ. අපිට ලියුම් එනකොට ගෙවල් වලින් බනිනවා. හිටපු මුලාසනය අභියාචනා කරයි. නිදහසට කරුණු කියයි. මේ සභාවේ නඩු පිළිබඳව ක්‍රියාත්මක වෙන්න වෙන ක්‍රම තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -
එදා තීරනයක් ගත්තා සභාවට යන වියදම් අඩුකරගන්න මාසෙ දිමනාවකට නීතිඥවරයෙක් ගන්න. රු.**25000.00**ක් දිලා. දැන් අපිට ගෙවන්න වෙලා. අපි ගෙව්වා. **2160.00**ක්. නිතිය පෙන්නලා නඩුවක් තාම දැම්මේ නැත්නම් ඒ ගෙවපු මුදල අපිට දෙන්න. නීතිය කාටත් පොදු විය යුතුයි. පළාත් පාලනයටත් අපි වාර්තාව අරිනවා. ඒ වෙලාවේ පෙන්වා දෙන්න තිබුනා. ලිඛිතව. කොහොම උනත් මේනඩු කටයුතු කරන්නේ නැත්නම් අපි ගෙවපු මුදල ආපසු දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මේ යෝජනාව ගෙනාවේ අධිහාරඋන මුදලක් ගැන නෙවෙයි. අපි ගෙව්වා ඒ අධිහාරය. එතන යම් වැරදි තියෙනවා. නමුත් නඩුකටයුත්තකට ගියොත් තවත් විශාල මුදලක් යනවා. ඒ නිසා දැම්මේ නෑ. අර **39** බි කඩේ වහලා. කුරුවිට නගරේ තිබුණ කඩයක්. නමුත් තාමත් නඩුවක් කියනවා. මේවා ගැන සොයලා බලල කමිටුවක් පත් කරලා අනවශ්‍ය වියදම් අඩු කරමු. අතිවිශාල මුදලක් සභාවට වැයවෙනවා මේ කටයුතු නිසා. සොයා බලලා කටයුතු කරමු.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

අපිට මේ අවස්ථාවේ මේ නඩු පිලිබඳව නිශ්චිතව කියන්න බැ. ඒනිසා අපි සොයා බලලා පසුව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව අනුව ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන යනු ලබන විවිධ උසාවි වල ඇති නඩු සම්බන්ධයෙන් විශාල වියදමක් දරණ බැවින් සභාවට සිදුවන වාසි හා අවාසි සම්බන්ධයෙන් අවධානය යොමු කර අදාළ පාර්ශවයන් සමඟ සාකච්ජා කොට සමතයකට පත්කර ගැනීම සම්බන්ධව කරුණු සොයාබැලීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**06- 19.** සභාවේ පවතින මූල්‍ය තත්වය අනුව **2025** ඉදිරි කාලය සඳහා ප්‍රාදේශිය සභාවේ නියෝජිතවරුන්, නියෝජිත වරියන් සඳහා සංවර්ධන කටයුතු සඳහා සමාන මුදලක් වෙන් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මේ සභාවත් පරන සභාව වගේමයි. මුදල් ප්‍රතිපාදන තියෙන විධිහට කරමු කියනවා. මේ අළුතෙන් ආපු අයයි පරන අයයි සේරම මන්ත්‍රීතුමන්ලාගේ අපේක්ෂාව ජනතාවට සේවය කිරිම.

නිකම්ම න්‍යායපත්‍රෙය් කොල පිරිලා, ජනතාවට පොරොන්දු දීලා ,ගමේ ගැටළු කතා කරලා විතරක් වැඩක් නෑ. ඒ නිසා සාධාරන මුදලක් මේ හැම මන්ත්‍රිවරයාටම වෙන් කරන්න. ගමට වැඩ කරන්න. ඒ මුදලින් ගමට වීදි පහනක් හරි දමන්න පුළුවන්. නැත්නම් හැමදාම යෝජනා දානවා විතරයි. අපි පත්වෙනකොට දේවින්ද මන්ත්‍රිතුමාත් එක්ක අපි සැලසුම් කලා සභාවේ මන්ත්‍රිලා **46** ටම ලක්ෂ **20** ගානේ සංවර්ධන කටයුතු වලට වෙන් කරන්න. ඊළඟ වසරේ ලක්ෂ **50** ගානේ දෙන්න. නමුත් දැන් විකසිත සභාපතිතුමා ඉන්නවා. හැම මන්ත්‍රිවරයෙකුටම ගමට වැඩක් කරන්න මුදල් ප්‍රතිපාදන ලබාදෙන්න. මුදල් කමිටුවේ කතා කරලා හරි අදහස් අරන් ක්‍රියාත්මක කරමු. සභාපතිතුමාට කියන්න පුළුවන් දළ වශයෙන් දෙන්න පුළුවන් මුදල ගැන.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -

මෙ විධිහට පුද්ගලිකව මුදලක් මන්ත්‍රිතුමාලට නෙමෙයි. කොට්ඨාශයට මුදලක් වෙන් කරන්න. සියළු දෙනාට නියෝජනය වෙනවා. පුද්ගලිකව අවශ්‍ය නෑ. කොට්ඨාශෙ මන්ත්‍රිවරු නායකත්වය අරන් වැඩ කරන්න. මැදිහත්වෙලා වැඩ කරමු. ගම හොඳ තැනකට ගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

සභා වාර්තාවේ සංවර්ධන යෝජනා පිටු ගනන්. මංගල මන්ත්‍රීතුමා කිව්වා වගේ සියළු මන්ත්‍රීතුමන්ලාට වටිනාකමක් දෙන්න. හැම මන්ත්‍රීම කොට්ඨාශෙ ජය අරන් ආවේ. වැඩ කලේ නැත්නම් දිනන්න බෑ. එදා විපක්ෂෙ හිටිය ඔබතුමාට බල්බ් එකක් දාගන්න බැරිඋනා. නමුත් අද සභාවේ ඔබතුමාට සහාය දුන්න අයට වගේම අනිත් අයටත් වැඩ කරන්න සහාය දෙන්න. හැකි ප්‍රමාණයක් දෙන්න. ලක්ෂ 5 උනත් කමක් නෑ. රටේ ජනාධිපතිතුමා කියනවා සැමට එක හා සමානව සලකනවා කියලා. එසේනම් විපක්ෂයටත් ඒ සහාය දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක දේශප්‍රිය මහතා -

දේවින්ද මන්ත්‍රීතුමා කීවා වගේ සහාය දුන්න අයට ප්‍රමුඛත්වයක් දෙන්න ඕනි. අපිටත් පුද්ගලිකව නෙමෙයි ජනතා අභිලාශ වලට තැනක් දෙන්න ඕනි. ජනතාවගේ ඡන්ද අරන් ආවේ. මම දෙවන වරටත් නියෝජනය කලා සභාව. විදිලාම්පුවක්, පාරක් සංවර්ධනය කරන්න කැමතියි. ඒ ජනතාව වෙනුවෙන්. මංගල ඩයස් මන්ත්‍රීතුමා පරිණත දේශපාලන නායකයෙක්. මෙවැනි යෝජනාවක් කිරිම අගය කරනවා. මෙතන ඉන්න 46 ම කැමතියි වැඩ කරන්න. මෙවර හෝ ප්‍රතිපාදන වෙන්කරලා සංවර්ධන කටයුතු කරන්න මම කැමතියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -

කොට්ඨාශෙ ප්‍රතිපාදන දෙනකොට මෙතන ජයගත්අය, පක්ෂ අය, විපක්ෂ අය කියලා එකක් නෑ. ජනතාවගේ තේරිම අනුව පක්ෂ වලින් තෝරලා මේ 46 ඉන්නේ. ජාතික ජනබලවේගය වැඩි පිරිසක් ඉන්නවා. මේ ප්‍රෙද්ශයේ ගොඩක් වැඩ තියෙනවා. කාර්මික නිලධාරි ගිහින් බලපුවත් තියෙනවා. ඉදිරියේදි වැඩකරන්න පුළුවන් විධිහට ධනාත්මකව බලලා සහාය දෙන්න. මේ යෝජනා ක්‍රියාත්මකද කියලා තොරතුරු ඉදිරි සභාවලදි දෙන්න. සභාවට කරන්න බැරි තරමේ විශාල සංවර්ධන යෝජනාත් තියෙනවා. ඒවා අදාල තැන් වලට යොමු කරන්න. ගියවරත් මම වැඩප්‍රමාණයක් විවිධ අමාත්‍යාංශවලට ගිහින් කලා. ඒ වගේ මේ ඇතැම් යෝජනා රාජ්‍ය අංශයේ ප්‍රතිපාදන අරන් කලහැකි ඒවා. විශාල යෝජනා වලට මුදල් වෙන් විම දුර්ලභයි. දාන යෝජනා වලට සාධාරණයන් නැත්නම් දාලා වැඩකුත් නෑ. නමට වැඩක් නෑ. නමට මන්ත්‍රිලා නෙමේ අපි. ඇතැම් සංවර්ධන කටයුතු වලදි මගේ අතිනුත් මුදල් වියදම්. ඒනිසා අපි සභාවක් ලෙස එකට කටයුතු කරමු. විපක්ෂ නායක ලෙස තනතුරක් නෑ. 46 එක්ක වැඩකරමු. හොඳ දේට එකතුයි. වැරදි දේ පෙන්නනවා. කිරිඇල්ලට අවධානය දෙන්න. මම ගියවර කිව්වා කිරිඇල්ලේ නිරික්ෂනයන් යමුකියලා. අපි දන්නෙත් නැතිව ගිහින්. අපි කැමතිනෑ ඒ වැඩ වලට. දැනුවත් කලේ නෑ. සද්භාවයෙන් කටයුතු කරද්දි කොන් කර කර සමගිව කටයුතු කරන්න බෑ. ඒ නිසා කටයුතු කරමු. සමගිව. සංවර්ධන යෝජනා විතරක් නෙමෙයි ජනතාවට තියෙන්නේ. ජනතාවගේ වෙනත් ප්‍රශ්ණ ගැටළු තියෙනවා. අවධානය දිය යුතු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

මංගල මන්ත්‍රීතුමා ගිය වසරවල ලක්ෂ 30 ක විතර වැඩකලා වසමට. දේවින්ද මන්ත්‍රීතුමාත් වැඩ කලා. ඉස්සර ජේවීපී එකෙන් නමුත් අපිට හොරු කියලා කිව්වා. පස්සෙ 2025 දි අනිත්

පිරිසකුත් අපිට හොරු කිව්වා. ඩබල්හොරු. හොර කලානම් කල හොර කියන්න. පෙන්වලා දෙන්න. සනාථ කරන්න. නිතර කියනවා පාර හදනනේ නැතුව මුදල් ගත්තළු. වෛර කරනවා නෙමේ. ඇත්තටම එහෙම කලා නම් ඒ විස්තර දෙන්න. තරහා ගන්නත් එපා. මේක ඉවරයක් වෙන්න ඕනි. කලා නම් ඔප්පු කරන්න පුළුවන් වෙන්න ඕනි. කොහොම උනත් අපි මේ සභාවට වැටෙන්න දෙන්නැ. උපරිම සහාය දෙනවා. ඒවගේම මම කියන්නේ වැඩ නොකර මුදල්ගත්තා නම් පෙන්වන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේ සභාවේ 46 ක් ඉන්නවා. සියළු දෙනා මහජන සේවයට ඇවිත් ඉන්නේ. පාරේ බෝක්කු දමන එක නෙමේ ඊට වැඩි සේවයක් ගුණාත්මක සේවයක් කරන්න ඕනි. සභාව ආරම්භක අවධියේ මම යෝජනා කල බඳුවත්ත හන්දියේ මස් කඩය රු. 145000 .00 කට දුන්නා. හාමුදුරුවරු තරහා උනා. මා එක්ක. නාගල ගමේ අයට වතුර දුන්නා. සමහරු හැමවෙලේම මුදල් ඉල්ලනවා කිව්වට නගරේ ගැටළු වෙනකොට මුලින්ම හිටියේ අපි. 2026 වසරට අයවැයක් එනවා. සංවර්ධන යෝජනාත් කෙටුම්පත් වෙනවා. ආදායම් උත්පාදන මාර්ග ඕනි. ඒ ආදායමින් සංවර්ධනය කරන්න බෙදාහදාගමු. එවැනි ක්‍රම නිර්මාණය කරමු. ඒවගේම එදා ඉඳන් අද බලන කොට විශාල ආදායම් වර්ධනයක් තියෙනවා.මේ තත්වයට ගන්න කව්රුත් දායක උනා. ඒනිසා හැකි තරම් ආදායම් උත්පාදන මාර්ග දෙන්න. 2026 අයවැයට. ප්‍රදේශයේ සංවර්ධනයට වැදගත්. විවිධ ආයතන තියෙනවා සංවර්ධනයට අත්වැල්බැඳගතහැකි. ඒ අයවත් එකතු කරගෙන අපි බෝපත් ඇල්ල වගේ සංවර්ධනය හා ආදායම් වැඩිකිරිමට කටයුතු කරමු. 2026 ට විශාල මුදලක් දෙන්න බැරිවෙයි. අපි හිඟ වරිපනම්, හිඟ බදු ආදිය රැස්කරමු. කිරිඇල්ල ආදායම් උත්පාදන මාර්ගයක් වැඩිකරමු. සියළු මන්ත්‍රි යෝජනා අරන් අපි සභාව පෝෂණය කරමු. වෛරකරගන්න එපා. ලැබෙන දෙයක් නෑ. පුද්ගලිකව මට ඇති දෙයක් නැ. ඉගෙන ගත්ත දේ තියෙනවා. සභාවේ වංචා වෙලානම් ඒකට හොයන්න ආයතන තියෙනවා. ඒවාට යොමු කරන්න. සභාවේ හොරා කීවාට ඇති පලක්නෑ. නඩුවක් දාන්නත් පුළුවන්. එදා ඉඳන් කව්රුත් දන්නවා. මල්කැකුළ සභාපතිතුමාත් දේවින්ද මන්ත්‍රිතුමාත් යාළුවෝ. සමිප අය. දැන් මෙහෙමඋනේ දේශපාලන තීන්දු නිසා. මම කා සමගවත් තරහක් නෑ. සභාවක් විධිහට නැගී සිටිමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා -</u>

යෝජනා ආවාම නිතරම වැරදි ප්‍රතිචාර. මම යෝජනාත් කලේ මුල් යෝජනාවෙන් ආදායම වැඩිවිමක් තමා අනවශ්‍ය වියදම් කපා හැරීම. අපි මුලින් සභාවට එනකොට සභාවේ ගිණුමේ රු. 5000.00 ත් විතර තිබුණේ. නමුත් අපි පසුකාලිනව ආදායම් වැඩිදියුණු කරලා සභාවට කැබ් රථයක්, ට්‍රැක්ටර්, පුටු ආදි උපකරන සියල්ල ගත්තා. දැන් තත්වය ඊටත් වැඩි දියුණුයි. මේ වෙන කොට මේ සභාවේ මන්ත්‍රිවරයෙකුට ජනතා වගේ සංවර්ධන කටයුතු වෙනුවෙන් දියහැකි ප්‍රතිපාදන මුදලක් සම්බන්ධව ගරු සභාපතිතුමා දැනුවත් කරන්න. තියෙන මුදල් තත්වය අනුව.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

සභාවේ සියළු මන්ත්‍රිතුමන්ලාගේ දායකත්වයෙන් සියළු සංවර්ධන කටයුතු කරමු. පක්ෂ විපක්ෂ භේදයක් නෑ. සියළු කොට්ඨාශවලට වැඩ කරමු. මට එක් අයෙකුට වෙන්කලහැකි ලෙස

මුදලක් කියන්න බෑ. දැනට කියන්න බෑ. ලක්ෂ 10 ගානේ වෙන් කලත් කෝටි හතක් යනවා. ඒ නිසා අපි හැමෝම සමානව නියෝජනය වන පරිදි ප්‍රතිපාදන වෙන්කිරිමට කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාව අනුව සභාවේ පවතින මූල්‍ය තත්වය අනුව 2025 ඉදිරි කාලය සඳහා ප්‍රාදේශිය සභාවේ නියෝජිතවරුන්, නියෝජිත වරියන් සඳහා සංවර්ධන කටයුතු සඳහා සමාන මුදලක් වෙන් කිරීම සම්බන්ධයෙන් සියළු මන්ත්‍රිතුමන්ලාට සමානව නියෝජනයක් ලැබෙන පරිදි ප්‍රතිපාදන වෙන් කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා -</u>

**06- 20.** එපිටවෙල ග්‍රාම සේවා වසමේ එපිටවෙල හන්දියේ පලමු බෝක්කුව අසල මාර්ගයේ තාර දැමූ කොටස ගැලවී ඇති අතර එම එපිටවෙල පල්ලෙක් කන්ද මාර්ගයේ අබලන් වී ඇති කොටස් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා ගේ යෝජනාව අනුව එපිටවෙල ග්‍රාම සේවා වසමේ එපිටවෙල හන්දියේ පලමු බෝක්කුව අසල මාර්ගයේ තාර දැමූ කොටස ගැලවී ඇති අතර එම එපිටවෙල පල්ලෙක් කන්ද මාර්ගයේ අබලන් වී ඇති කොටස් සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා</u>

**06– 21.** එපිටවෙල ග්‍රාමසේවා වසමේ වරකාගොඩකන්ද ඉහලකොටස දෙවක්කරවත්ත මාර්ගයමිටර් 30 ක් කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අජිත් නන්දසිරි මනම්පේරි මහතා ගේ යෝජනාව අනුව එපිටවෙල ග්‍රාමසේවා වසමේ වරකාගොඩකන්ද ඉහලකොටස දෙවක්කරවත්ත මාර්ගය මිටර් 30 ක් කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  අජිත් නන්දසිරි මනම්පේරි මහතා -

**06- 22.** මුණසිංහපුර ග්‍රාමසේවා වසමේ මුණසිංහ පුර සල්ගහ ඉදිරිපිට පාරේ ආරණ්‍ය සේනාසනය දෙසට යන මාර්ගය හා දම්මුල්ලට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  අජිත් නන්දසිරි මනම්පේරි මහතා ගේ යෝජනාව අනුව මුණසිංහපුර ග්‍රාමසේවා වසමේ මුණසිංහ පුර සල්ගහ ඉදිරිපිට පාරේ ආරණ්‍ය සේනාසනය දෙසට යන මාර්ගය හා දම්මුල්ලට යන අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  ජී. මහින්ද ගුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  ජී. මහින්ද ගුණසිංහ මහතා -

**06-23.** තලාවිටිය වසමේ එගොඩ ගැමිදිරිය ශාලාවේ ජල පහසුකම් ලබාගැනිම හා වැසිකිලියක් ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  මහේෂ් නිරෝෂන නාපාවල මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  ජී. මහින්ද ගුණසිංහ මහතා -

මේ ශාලාවේ පේෂකර්ම පුහුණු වැඩසටහන් සිදු කෙරෙනවා. මේ අවශ්‍යතා අත්‍යවශ්‍යයි.

ගරු සභාපති  එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මේ සම්බන්ධව  කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන  ඒ අනුව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  ජී. මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව තලාවිටිය වසමේ එගොඩ ගැමිදිරිය ශාලාවේ ජල පහසුකම් ලබාගැනිම හා වැසිකිලියක් ඉදිකිරිම සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන  ඒ අනුව ඉදිරි කටයුතු  සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. මහින්ද ගුණසිංහ මහතා -

**06-24.** පොද්දෙනිය තිලක් මහතාගේ නිවස අසල සිට පියසේන මහතාගේ නිවස දෙසට වන හික්ගහ වත්ත දෙවැනි පටුමග කොන්ක්‍රිට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව පොද්දෙනිය තිලක් මහතාගේ නිවස අසල සිට පියසේන මහතාගේ නිවස දෙසට වන හික්ගහ වත්ත දෙවැනි පටුමග කොන්ක්‍රිට් කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. මහින්ද ගුණසිංහ මහතා -
**06-25.** පොද්දෙනිය කනත්තපාර කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. මහින්ද ගුණසිංහ මහතා -

ජනතාව බහුලව භාවිතා කරන මාර්ගයක්. අත්‍යවශ්‍යතාවක්.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව පොද්දෙනිය කනත්තපාර කොන්ක්‍රිට් අතුරා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -
**06- 26.** පරණගම මිගහවත්ත මාර්ගයේ කැඩී ගිය කොටසේ පැති බැම්ම ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -

මේ මාර්ගය සභා මාර්ගයක්. අධික වර්ෂාවට බාදනය වෙලා. බරවාහනත් යනවා. කොයිවෙලාවේ හරි කඩාගෙන ගිහින් අනතුරක් සිදුවිය හැකියි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා ගේ යෝජනාව අනුව පරණගම මීගහවත්ත මාර්ගයේ කැඩී ගිය කොටසේ පැති බැම්ම ඉදිකිරීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -

**06- 27.** දෙහෙරගොඩ දියරතඹලාව මාර්ගයේ අබලන්වී ඇති කොටස කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා ගේ යෝජනාව අනුව දෙහෙරගොඩ දියරතඹලාව මාර්ගයේ අබලන්වී ඇති කොටස කොන්ක්‍රිට් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -

**06- 28.** ඉහලගම මඩතියවත්ත මාර්ගයේ වෙලමැද මාර්ග කොටස කොන්ක්‍රිට් කිරිමට හා පැතිබැම්ම ක් යෙදීමට ඇති හැකියාව සළකා බලා පැතිබැම්මක් යෙදීමට ද යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී. චූලා ශාන්ති මිය -

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා ගේ යෝජනාව අනුව ඉහලගම මඩතියවත්ත මාර්ගයේ වෙලමැද මාර්ග කොටස කොන්ක්‍රිට් කිරිමට හා පැතිබැම්ම ක් යෙදීමට ඇති හැකියාව සළකා බලා පැතිබැම්මක් යෙදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -
**06-29.** කැකුළගම පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -

ගෙවල් 32 ක් පමන ප්‍රතිලාභ ලැබිය හැකියි. ගෙවල් අටක් විතර මෝටරයක් දාලා වතුර ගන්නවා. ඇලවල් දෙකක් ආසන්නයේ තිබුනත් ලිං කැපුවට ඒ ජලය ප්‍රයෝජනයට ගන්න බෑ. මේක පොදු ළිඳක්. ප්‍රතිසංස්කරණය කළොත් පාණිය ජලය දෙන්න පුළුවන්.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
**1991** දි රෙපෙයාර් කලා. නැවත කරනවට ස්තුතියි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා ගේ යෝජනාව අනුව කැකුළගම පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -

**06-30.** ගෝනපිටිය පාර ධර්මදාස මයාගේ නිවස අසල සිට රාජපක්ෂ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -
ගෙවල් අටකට යන මාර්ගයක්. අත්‍යවශය මාර්ගයක්. සංවර්ධනය කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා ගේ යෝජනාව අනුව ගෝනපිටිය පාර ධර්මදාස මයාගේ නිවස අසල සිට රාජපක්ෂ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -</u>

**06-31.** මලව බිලූ සැෆායර් වෙන්දේසි ඉඩමේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -</u>
මේ මාර්ගයේ ගෙවල් හතරකට යන මාර්ගයක් වගේම බිලූ සැෆායර් වෙන්දේසි ඉඩමේ ප්‍රවේශය. ප්‍රතිසංස්කරණය කල යුතු තත්වයට පත්වෙලා.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා ගේ යෝජනාව අනුව මලව බිලූ සැෆායර් වෙන්දේසි ඉඩමේ ප්‍රවේශ මාර්ගය ප්‍රතිසංස්කරනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා විසින් කරනු ලබන යෝජනා</u> -

**06- 32.** වත්තකඩේ -උතුරු ගලුකාගම මාර්ගයේ අංක 3 වතු නිවාස වල ට පිවිසෙන මාර්ගය හා කාණුව කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>
මේ දැනට තියෙන කාණුව ප්‍රමාණවත් නෑ. කුඩා කාණුවක් කුඩා ප්‍රෙද්ශයක විතරයි තියෙන්නේ. විශාල වතුර ප්‍රමාණයක් ගලනවා. ඒ සියළු වතුර පාරේ ගලාගෙන යන්නේ. මේක අත්‍යවශ්‍යතාවක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>
උතුරු ගලුකාගම ගෙවල් 300 විතරතියෙන ජනතාව 600ක් 70 විතර ඉන්න ප්‍රෙද්ශයක් මේ. හැම නිවසකටම වාහනයක් තියෙනවා. මෙයාලා භාවිතා කරන පාර මේක. වතතෙකඩේ

හන්දියේ උස් ස්ථානයක වතු නිවාස පැත්තට යනකොට බැවුම. මෙතන කාණුව බාගෙට හදලා නතර කලා. වැස්සට වාහනයක් යන්න බෑ. වතු නිවාස වල ජනතාව වත්තකඩේට තමයි බස් එකට එන්නේ. පාසල් ලමයි එනවා. මේකට ලොකු වියදමක් යන එකක් නෑ. මිටර් 60 ක් විතර තියෙනවා හදන්න. කාගේ නමින් හරි වෙන් කරලා හදන්න. කාණු සේරම වැහිලා තියෙන්නේ. ලයිම් පහටම යන පාර මේක. මිනිස්සු යන එන පාර මුදල් වෙන්කරලා මේ කටයුත්ත කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා ගේ යෝජනා අනුව වත්තකඩේ -උතුරු ගලුකාගම මාර්ගයේ අංක 3 වතු නිවාස වල ට පිවිසෙන මාර්ගය හා කාණුව කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>

**06- 33.** සාන්ත ජෝකිම්වත්ත අංක 5 වතු නිවාස වලට පිවිසෙන මාර්ගයේ ඇති කාණුව කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>

මේ යෝජනාවත් ඉහත ගැටළුවමයි. අංක 5 වතු නිවාස වලට යන මාර්ගයේ කානුවත් සකසා දෙන්න.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා ගේ යෝජනාව අනුව සාන්ත ජෝකිම්වත්ත අංක 5 වතු නිවාස වලට පිවිසෙන මාර්ගයේ ඇති කාණුව කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>

**06- 34.** රත්නපුර ශාන්ත ජෝකිම් දෙමල විද්‍යාලයේ මායිමේ පිහිටි කානුව කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>
මේ මායිමේ කාණුව කැඩිලා නිසා නිසා පිට්ටනියටත් වතුර එනවා. මේ කටයුත්ත අත්‍යවශ්‍යයි.

කානුව කොන්ක්‍රිට් කරලා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>
මන්ත්‍රීතුමා යෝජනා තුනක් විදිහට දාලා. ස්ථාන හඳුනාගෙන යෝජනා තුනක් විධිහට. මේ පේලි නිවාස වල සුද්දගේ කාලේ සංවර්ධනය කලාට පස්සේ නැවත සංවර්ධනයක් උනේ නෑ. වත්තේ සංවර්ධනයක් නෑ. මාර්ග සංවර්ධනයක් නෑ. කාණු කොහෙත්ම හදන්නෑ. මේ ඉවුරු කැඩුන තැන් හදලා මේ කටයුත්ත කරමු. මේ මන්ත්‍රී තුමා යෝජනාව දමිල ජනතාව වෙනුවෙන්. යම් මුදලක් වෙන්කරලා මේ කටයුතු කරන්න. මාත් අවුරුදු ගානක් මේ කටයුතු වලට ප්‍රතිපාදන ඉල්ලුවා. දැන්වත් මේ ජනතාව වෙනුවෙන් ඉටුකරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා අරන් ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා ගේ යෝජනාව අනුව රත්නපුර ශාන්ත ජෝකිම් දෙමල විද්‍යාලයේ මායිමේ පිහිටි කානුව කොන්ක්‍රිට් කිරිම සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා ගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>

**06-35.** කුරුවිට සිට එරත්න දක්වා ඇති මාර්ගයේ නාය කොස්ගහ යට යන ස්ථානයේ නිරන්තරයෙන් රථවාහන අනතුරු සිදුවන ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති අතර එම අනතුරුදායක තත්වය හේතුවෙන් එම ස්ථානයට සුදුසු ආරක්ෂිත වැටක් ඉදිකිරීම සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>
මෙම ස්ථානය කඳුකර මාර්ගයක තියෙන අනාරක්ෂිත ස්ථානයක්. මේ වන විට රජයක් ලෙස මෙවැනි අනාරක්ෂිත ස්ථාන වල ඇති විය හැකි අනතුරු වලක්වා ගැනිමට මේ වන විට ක්‍රමවේද සකසමින් පවතිනවා. ඒ යටතේ මාර්ග ආරක්ෂාව සඳහා වන සැලසුම් අනුව කඳුකර ප්‍රදේශ වල පවතින මාර්ග හා අදාල තොරතුරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය හරහා කටයුතු සිදු කරමින් පවතිනවා. මහජන නියෝජිතයින් ගේ අදහස් ද එකතු කරමින් අනාරක්ෂිත ස්ථාන වලට පිලියම් යොදමින්, අනතුරක් සිදු විමට පෙර ප්‍රථම විසඳුම් ගමු. සැළසුම් කරලා පළාත් සභා, අමාත්‍යංශ හරහා ප්‍රතිපාදන ලබාගෙන මේ අනතුරු වෙන්න පෙර පියවරක් ගමු. මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් දීලා කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

එරත්න ප්‍රධාන මාර්ගයේ සියයට අනුවක් විතර කාපට් කරලා තියෙන මාර්ගයක්. මේ කියන ස්ථානය ඉතාමත් දුෂ්කර , නාය යාමට ලක් උන ස්ථානයක්. එතන සිට අඩි 100 ක් විතර තියෙනවා ඒ හරිය කාපට් කරලා නෑ. වැසි කාලෙට මේ ස්ථානයේ ගල් පෙරලෙනවා. පාරත් ඉතාම පටුයි. එරත්න මාර්ගයේ තියෙන විශාලම බෑවුම. රජයේ වැඩසටහනට මේ ස්ථානයත් ඇතුලත් කරලා කඩිනමින් පියවර ගන්න. ඒ වගේමයි සූදාගල අර කණු පාලම. ඒ පිළිබඳවත් අවධානය දක්වන්න. ඉදිරියේදි සිරිපා සමය එනවා. විශාල වාහන තොගයක් යනවා. ඒ සම්බන්ධවත් අවධානය දක්වන්න.

මේ වන විට රත්නපුර පළාත් මාර්ග නඩත්තුව නිසි පරිදි සිදුවෙන්නේ නෑ. හල්පෙ, තෙප්පනාව මාර්ගයේ තණකොළ කපනවා. හල්පෙ මාර්ගයේ වලක් තියෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් පියවරන් ගන්නේ නෑ. මාර්ග සංවර්ධන අධිකාරියෙන් නම් නඩත්තු කරනවා. නමුත් පළාත් මාර්ග එක වැඩක් කරන්නෑ. බදුවත්තෙත් එහෙමයි. හවස පහ හය වෙනකොට වාහන යන්න බෑ. තදබදය. නාගොඩ පාරෙත් වලක් තියෙනවා. විශේෂ ඉල්ලීමක් කරනවා මේ පාරවල් ගැනත් විස්තර දෙන්න. ඇහැලියගොඩ පාරෙත් එහෙමයි. හවසට පාරේ විශාල තදබදයක්. මාර්ගය පළල් කරන්නත් තැන් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා -

තෙප්පනාවේ පරණ ගල් බෝක්කු 4 ක් තියෙනවා. ඒවා හදන්න වෙලා. තණකොළ කපනවා හතර දෙනෙක් දාලා. පාරේ කාණුවේ වැලි ටිකක් පිරිලා තිබුනත් අරන් දාන්නෑ උදැල්ලෙන්. විශාල අතු පාරට නැමිලා. ඒ මොනාවත් කපන්නෑ. ටෙලිකොම් එකෙන් කපන්නෙත් නෑ. කාණු අවහිර වෙලා. වාහන වලට යන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්. කපිල මුණසිංහ මහතා -

කඩිනම් ව පියවර ගත යුතුයි. මා පදිංචි ස්ථානයේ සිට කිලෝ මීටර් බාගයක් විතර ඇති. දිනකට වාහන 3000 ක් විතර යනවා. නායයාම සිදුවෙන ස්ථානයක්. ලංගම බස් රථයක් පෙරලිලා මියයාම් සිදු උන තැනක්. මේ පිළිබඳව දැඩි අවධානයක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -

පළාත් මාර්ග සම්බන්ධව කතා කරනකොට මේ සභාව ඉදිරිපිට මාර්ගයේ කාණු පද්ධතිය හදලා නමුත් ගැඹුරට තියෙන මාර්ගයේ වැසුම්පත් දාලා නෑ. කම්බි මතුවෙලා තියෙන්නේ. ඉතාම අනුතුරුදායකයි. වහිනකොට මුළු පාරේම වතුර පුස්තකාලය ලගින් පාර හරහා ගිහින් ක්‍රීඩා පිටියට ගලා බහින්නේ. මේ සම්බන්ධයෙන් කඩිනම් ව ක්‍රියාත්මක වෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -

මේ ප්‍රදේශයේ විශාල අනතුරු සිදු උනා. බසයක් පෙරලෙන්න ගිහින් අසීරුවෙන් බේරුණා. ත්‍රි විල් අනතුරු සිදු අනා. එරත්න මාර්ගයේ අනතුරු ස්ථාන කිපයක්ම තියෙනවා. සූදාගල පාලමේ ඇන්ද, ඒක අපි දින හතරකට පෙර ප්‍රධාන අමාත්‍යංශයේ තාක්ෂණික නිලධාරි සමග ගිහින් ඇස්තමේන්තු සකස් කලා. අපි ඒක කඩිනමින් කරනවා. ශ්‍රීපා වන්දනා සමයේ මාර්ග පහසුකම් අවශ්‍යයි. ආරක්ෂිතබව තිබිය යුතුයි. අපි ඒ ගැන අවධානය දුන්නා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

විශේෂ අවධානයක් දියයුතුයි. අපි මහාමාර්ග ඇමතිතුමාත් සමග සාකච්ඡාවක් තිබුණා පසුගිය දිනක. එහිදි මේ ගැටළු සම්බන්ධයෙන් පුළුල්ව කතා කලා. මේ මාර්ග ආරක්ෂණය පිලිබඳව කඩිනමින් කටයුතු කරනවා. එක් එක් ප්‍රදේශ වලට අදාලව මේ සම්බන්ධ තොරතුරු ගන්න කමිටු පත් කලා. පොලිසිය, ජනතා නියෝජිතයින්, පාසල් විදුහල්පතිවරු, ඇතුළුව විවිධ ක්ෂේත්‍ර නියෝජිතයින් ඇතුලත්. මට මේ මෑතක කතා කලා එරත්න ත්‍රිවිල් එකක් පොලිසියෙන් අල්ලා. දරුවන් වැඩිපුර පටවාගෙන ගිහින්.එතරම් දරුවන් ප්‍රවාහනය කරනකොට එක රථයක වගකීමට ගැටළුවක්. දඩුවම් කරයි. දෙමාපියොත් අවධානය දෙන්න ඕනි. අපිට මේ මාර්ග අනතුරු නැවත්විමට කටයුතු කිරිම එකවර බැරිවෙයි කරන්න. නමුත් අපි ටික ටික මේ ගැන ක්‍රියාත්මක වෙනවා. පැය 4 කට වතාවක් අපේ රටේ අනතුරකින් ජීවිතයක් විනාශ වෙනවා. අපි මාර්ග ආරක්ෂන කමිටුව හරහා ඉදිරියේදි මෙම අනතුරු නැවැත්විම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙමු. අනතුරු බහුල මාර්ගවල ස්ථාන සම්බන්ධයෙන්ද අවශ්‍ය අංශ දැනුවත් කර කඩිනම් පියවර ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතාගේ යෝජනාව අනුව කුරුවිට සිට එරත්න දක්වා ඇති මාර්ගයේ නාය කොස්ගහ යට යන ස්ථානයේ නිරන්තරයෙන් රථවාහන අනතුරු සිදුවන ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇති අතර එම අනතුරුදායක තත්වය හේතුවෙන් එම ස්ථානයට සුදුසු ආරක්ෂිත වැටක් ඉදිකිරීම සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කිරීමට ඒකමතිකව සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා-

**06- 36.** එම්.ජී.ගුණරත්න මහතාගේ නිවස අසලින් ආරම්භ වී කි.මි.1 කණුව අසල උදේකුමාර මයාගේ නිවස අසලින් අවසන් වන උදාකල ගම හරහා ඇති පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා-

මේ පාරේ තියෙන්නේ ඉතාමත් පැරණි පාලම් බෝක්කු. සුසානභූමිය තියෙන්නේ ඒ පිවිසුම එක්ක. ඒ කටයුතු වලටත් යන්න අපහසුයි. මේ මාර්ගය සංවර්ධනය කිරිමට අත්‍යවශ්‍ය මාර්ගයක්.

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා ගේ යෝජනාව අනුව එම්.ජී.ගුණරත්න මහතාගේ නිවස අසලින් ආරම්භ වී කි.මී.1 කණුව අසල උදේකුමාර මයාගේ නිවස අසලින් අවසන් වන උදාකල ගම හරහා ඇති පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව සභා තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා-</u>**

**06- 37. කොක්ඔිවිට බිලින්ගස්වත්ත හරහා මැදවත්ත පාරට පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා-</u>**

**මේ මාර්ගය කෙටි මාර්ගයක් ලෙස සංවර්ධනය කිරිම ඉතාම වැදගත්. විශාල දුර ප්‍රමාණයක් යන එක මේ මාර්ගය මිටර් 50 ක් සංවර්ධනයකලොත් ජනතාවට පහසුවෙන් අඩුකාලයක් තුල යන්නපුළුවන්.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා ගේ යෝජනාව අනුව කොක්ඔිවිට බිලින්ගස්වත්ත හරහා මැදවත්ත පාරට පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා-</u>**

**06-38. මීරියගොඩ පාලමෙන් එගොඩ ලෙල්ලගොඩ ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා-

පාලමෙන් එහා ගොඩක් අබලන් වෙල තියෙන කොටස. විශාල ජනතාවක් භාවිතා කරන මාර්ගයක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා

මේ මාර්ගය ලෙල්ලගොඩට, මිල්ලවිටයට යන්න පුළුවන් අතුරුපාරක්. ලේලගොඩ ප්‍රජාව වැඩිපුරම භාවිතා කරන පාරක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඩී. එන්. අධිකාරම් මහතා ගේ යෝජනාව අනුව මීරියගොඩ පාලමෙන් එගොඩ ලෙල්ලගොඩ ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මිය විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මිය -

**06- 39.** එනසාල්දොළ පුවක්හේන මාර්ගය 200 මිටර් දුරක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මියගේ යෝජනාව අනුව එනසාල්දොළ පුවක්හේන මාර්ගය 200 මිටර් දුරක් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මිය -

**06- 40.** මහින්දාරාම පන්සල දෙසට යන මාර්ගයේ බෝක්කු හා පැති බැම්ම සැකසිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මියගේ යෝජනාව අනුව මහින්දාරාම පන්සල දෙසට යන මාර්ගයේ බෝක්කු හා පැති බැම්ම සැකසීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මිය -

**06- 41.** එනසාල් දොළ නිශාන්තගේ නිවස අසල සිට ඉදිරියට යන මාර්ගයේ 200 මීටර් දුරක් කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා

එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මිය -

මේ මාර්ගයේ වලවල් හැරිලා, පාර කැඩිලා ගිහින්. පාර කොන්ක්‍රීට් කරදෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉරෝෂා උදයංගනී මියගේ යෝජනාව අනුව එනසාල් දොළ නිශාන්තගේ නිවස අසල සිට ඉදිරියට යන මාර්ගයේ 200 මීටර් දුරක් කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්. ගයාන් වික්‍රමසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා-

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්. ගයාන් වික්‍රමසූරිය මහතා

**06- 42.** කුරුවිට ප්‍රාදේශිය සභාවේ මහජන ක්‍රීඩාංගනය සඳහා තණකොළ කපන යන්ත්‍රයක් මිලදීගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බි.එච්. ගයාන් වික්‍රමසූරිය මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන ක්‍රීඩාංගනය සඳහා තණකොළ කපන යන්ත්‍රයක් මිලදීගැනිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බි.එච්. ගයාන් වික්‍රමසූරිය මහතා -</u>

**06- 43.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන ක්‍රීඩාංගන යේ කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයට මුහුණ ලා ඇති කොටස දැල් ආවරණයක් මගින් ආවරණය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චුලා ශාන්ති මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බි.එච්. ගයාන් වික්‍රමසූරිය මහතා -</u>
මේ ස්ථානය ක්‍රිඩා පිටියට ප්‍රධාන ප්‍රවේශයේ තියෙන්නේ. ෂෙඩ් එක ළග. මේ කොටස ආක්‍රමණයට ලක්වෙමින් තියෙන්නේ. කඩිනමින් සීමා ලකුණු කරලා වෙන් කරන්න. ගොවිජන සේවා එකෙන් ඉල්ලුවාට ඒ කටයුතු වලට වෙනත් ස්ථානයක් බලමු. අනුග්‍රාහකයෙක් හොයාගෙන අපි මේ ස්ථානය කොටස ක්‍රමවේදයක් අනුව දැල් ආවරණයක් මගින් ආවරණය කිරිමට කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බි.එච්. ගයාන් වික්‍රමසූරිය මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ මහජන ක්‍රිඩාංගන යේ කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයට මුහුණ ලා ඇති කොටස දැල් ආවරණයක් මගින් ආවරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බි.එච්. ගයාන් වික්‍රමසූරිය මහතා -</u>

**06- 44.** දෙල්ගමුව සද්ධාතිස්ස මාවත දෙවන පටුමඟ මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

යෝජනාව ක්‍රියාත්මක කිරීමට ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එච්. ගයාන් වික්‍රමසූරිය මහතාගේ යෝජනාව අනුව දෙල්ගමුව සද්ධාතිස්ස මාවත දෙවන පටුමඟ මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස සංවර්ධනය ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>

**06- 45.** හාන්දුකන්ද ප්‍රජා ශාලාව පුළුල් කර , වහලය ගසා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>
මේ ශාලාව වසර 45 ක් විතර පරණයි. එතන මාතෘ සායනය,ස්වේඡා සමිති , ජන්ද මධ්‍යස්ථානක් විදිහටත් භාවිතාවෙනවා. ජනතාව වඩාත් ගැවසෙන තැනක්. වහලය පැරණියි. මේ ශාලාව ප්‍රමාණවත් නෑ. ජනතාවට. ප්‍රජා ශාලාව පුළුල් කර , වහලය ගසා සංවර්ධනය කිරිමට කටයුතු කරන්න.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා</u>

වසර ගානක ඉඳලා මේ ස්ථානය පුළුල් කරන්න කටයුතු උනන්දුවෙනවා. මම සැළසුමකුත් හැදුවා. ඉදිරියේදී මේ කටයුතු කරමු.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මේක සභාවට පවරලා නම් අපිට කටයුතු කල හැකියි. නැතිනම් වෙනත් ප්‍රතිපාදන හොයා ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මියගේ යෝජනාව අනුව හාන්දුකන්ද ප්‍රජා ශාලාව පුළුල් කර , වහලය ගසා සංවර්ධනය කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදුකිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>

**06- 46.** හාන්දුකන්ද වයි.ආර්. නන්දාවතී මියගේ නිවස අසල සිට පී.වී. චිත්‍රලතා මියගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලිනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මියගේ යෝජනාව අනුව හාන්දුකන්ද වයි.ආර්. නන්දාවතී මියගේ නිවස අසල සිට පී.වී. චිත්‍රලතා මියගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය විසින් කරනු ලබන යෝජනා</u> -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය-</u>

**06-47.** කඳන්ගොඩ ජනපදය පන්සල අසල පහල කොටසේ ධනවර්ධන මහතාගේ නිවස ලඟ සිට මාර්ගය කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය ගේ යෝජනාව අනුව කඳන්ගොඩ ජනපදය පන්සල අසල පහල කොටසේ ධනවර්ධන මහතාගේ නිවස ලඟ සිට මාර්ගය කොන්ක්‍රිට් දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය-</u>

**06-48.** පැරඩයිස් වැව පෙදෙස අවට ශුද්ධ පවිත්‍ර කරගැනිම හා වැවේ ඇති කෙටල ඉවත් කර ගැනීමටත් මැදිහත් විමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය-</u>

මේ සම්බන්ධව කටයුතු කරන්න පසුගිය කාලසිමාවෙත් උත්සහා කලා. මේ වෙන කොට වැවේ කෙටල ගාලක් වෙලා. ගොවිජන සේවා එකයි, කෘෂි අංශ සම්බන්ධකරගෙන මේ කටයුත්ත කරමු. ආදායමක් එන ලෙස මෙතනට බෝට්ටුවක් දාන්නත් පුළුවන්. ගමට එන ස්ථානය. මෙතන ජනතාවට වැඩක් ඇති ලෙස සංවර්ධනය කරමු. මුලින් ම මේ පවිත්‍ර කිරිම කල යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා</u>
ගියවර වැව රක්ෂිතයේ ඇවිදින මංතීරු හදන්න උත්සහා කලා. ජනතාවගේ ඉල්ලීම්. පතලුත් කපලා ප්‍රශ්නත් ආවා. වැවේ ලොකුවට පතල් නෑ. අදහස් අරගෙන මේ කටයුත්ත කරමු. ඇවිදින

මංතීරු දාලා, මේ ස්ථානය සංචාරක ආකර්ශනය ලැබෙන විධිහට හදන්න හැදුවත් චෝදනා ආවා. මේ ස්ථානය සුන්දර තැනක්. 2026 ප්‍රතිපාදන අරන් කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>
කාලයක් තිස්සේ වැව ගැන කතා කලා. හැමවෙලේම මේක සංවර්ධනයකට අත්සාහා කලාට මැණික් ගරනවා කියලා ඒක නවතිනවා. ක්‍රමවේද තියේනම් ඒ කටයුත්තත් කරලා මේ සංවර්ධන කටයුතුත් කරමු. ඉස්සර අපි මේ සංවර්ධන කටයුතු කරන්නම හැදුවත් බැරිඋනා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

මේ යෝජනාව පෙරත් කලා. ඒ කොට්ඨාශෙ මන්ත්‍රිට විරුද්ධවත් බෙනර් දැම්මා. මමත් මෙතුමියටත් චෝදනා කලා. ඒ කාලේ පොහොට්ටුවේ. නමුත් මෙතුමිය සම්බන්ධ නෑ. පස්සේ එතන තිබුන අඹ ගහත් ගලවාගනෙ ගිහින් ඒ ළඟ තිබුන ඉල්ලං පැටෙව්වා. අපි උද්ගෝෂණලවටත් ගියා. ඒ තත්වය නවත්තන තැනට අපි පත් කලා. මේ යෝජනාව හොඳයි. වැව විනාශ නොකර මේ කටයුතු කරමු. ආයෙත් ගමේ මිනිස්සු ගහන්න එයි නැත්නම්. විනිවිදව කටයුතු කරමු. සහාය දෙනවා.
<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මීට පෙරත් මේවැනි යෝජනා ආවා. කතා කලා. චෝදනා ආවා. අපි මේවැඩේ ඒ අසල පදිංචි අයවත් සහාය කරගෙන හරියට කරමු. අදාල ආයතනත් දැනුවත් කරලා සහායකරගෙන කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය ගේ යෝජනාව අනුව පැරඩයිස් වැව පෙදෙස අවට ශුද්ධ පවිත්‍ර කරගැනිම හා වැවේ ඇති කෙටල ඉවත් කර ගැනීමටත් මැදිහත් විමට හා අදාල ආයතන දැණුවුත් කර ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය -</u>

**06-49.** කීරගල දෙනිත්ත ප්‍රධාන මාර්ගයේ සිට සුමතිපාල මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.කේ. දයා කස්තුරි මිය ගේ යෝජනාව අනුව කීරගල දෙනිත්ත ප්‍රධාන මාර්ගයේ සිට සුමතිපාල මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -</u>

**06-50.** පත්බේරිය බටහිර ග්‍රාමසේවා වසමේ කොට්ටුන්න ග්‍රාමයේ ඇති ප්‍රජා ශාලාවේ වහලය නවීකරණය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රතිපාදන ලැබෙන අයුරින් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා ගේ යෝජනාව අනුව පත්බේරිය බටහිර ග්‍රාමසේවා වසමේ කොට්ටුන්න ග්‍රාමයේ ඇති ප්‍රජා ශාලාවේ වහලය නවීකරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -</u>

**06-51.** පත්බේරිය නැගෙනහිර ග්‍රාමසේවා වසමේ මීගස්තැන්න සිට මෙනේරිපිටියට ඇති මාර්ගයේ ආරම්භක මිටර් 50 ක් පමන දුර ප්‍රමාණය අළුත්වැඩියා කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා ගේ යෝජනාව අනුව පත්බේරිය නැගෙනහිර ග්‍රාමසේවා වසමේ මීගස්තැන්න සිට මෙනේරිපිටියට ඇති මාර්ගයේ ආරම්භක මීටර් 50 ක් පමන දුර ප්‍රමාණය අළුත්වැඩියා කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා -</u>

**06-52.** පත්බේරිය බටහිර නාරද මධ්‍ය මහා විද්‍යාලය ඉදිරිපස සිට එකමුතු ප්‍රදේශය දක්වා ඇති මාර්ගයේ මීටර් 100 පමන කොටස අළුතෙන් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නිරෝෂණ නාපාවල මහතා ගේ යෝජනාව අනුව පත්බේරිය බටහිර නාරද මධ්‍ය මහා විද්‍යාලය ඉදිරිපස සිට එකමුතු ප්‍රදේශය දක්වා ඇති මාර්ගයේ මීටර් 100 පමන කොටස අළුතෙන් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවිර මහතා විසින් කරනු ලබන යෝජනා -</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවිර මහතා</u>

**06-53.** කොස්ගල කම්මල හංදිය ලඟ ඉදිකර ඇති වැඩ නිමකර නොමැති බහුකාර්ය ගොඩනැගිල්ල බිම් මහලේ වැඩ අවසන් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවිර මහතාගේ යෝජනාව අනුව කොස්ගල කම්මල හංදිය ලඟ ඉදිකර ඇති වැඩ නිමකර නොමැති බහුකාර්ය ගොඩනැගිල්ල බිම් මහලේ වැඩ අවසන් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවීර මහතා-

**06-54.** පුන්සිරිගම අබලන්වී ඇති ප්‍රජා ශාලාව අළුත්වැඩියා කර භාවිතයට සුදුසු පරිදි සකස්කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවීර මහතා-
මේ ප්‍රජා ශාලාවේ පැත්තක් කඩා වැටිලා. මේක අත්‍යවශ්‍ය කටයුත්තක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවීර මහතාගේ යෝජනාව අනුව පුන්සිරිගම අබලන්වී ඇති ප්‍රජා ශාලාව අළුත්වැඩියා කර භාවිතයට සුදුසු පරිදි සකස්කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවීර මහතා-

**06-55.** දොරළුබඩකනත්තට යන මාර්ගය කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -
අදාල ක්‍රමවේදය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී. ජස්ටින් රණවීර මහතාගේ යෝජනාව අනුව දොරළුබඩ කනත්තට යන මාර්ගය කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය -

**06- 56.** උතුරු එක්නැලිගොඩ වසමේ අත්වැල්පිටිය මාර්ගය මීටර් 350 ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -
අදාල ක්‍රමවේදය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය ගේ යෝජනාව අනුව උතුරු එක්නැලිගොඩ වසමේ අත්වැල්පිටිය මාර්ගය මිටර් 350 ක් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය -

**06-57.** උතුරු එක්නැලිගොඩ වසමේ පන්නම ඇලෙන් එගොඩ මාර්ගය මීටර් 300 ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය ගේ යෝජනාව අනුව උතුරු එක්නැලිගොඩ වසමේ පන්නම ඇලෙන් එගොඩ මාර්ගය මිටර් 300 ක් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය -

**06-58.** සූදාගල වසමේ පොල්ගහ මුකලාන අතුරු මාර්ගය මිටර් 150 ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -
අදාල ක්‍රමවේදය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන්කුමාරි මිය ගේ යෝජනාව අනුව සූදාගල වසමේ පොල්ගහ මුකලාන අතුරු මාර්ගය මිටර් 150 ක් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි සුධීරා සේමිණි ලියනගේ මිය විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි සුධීරා සේමිණි ලියනගේ මිය -

**06-59.** ගල්පුස්සැල්ල ප්‍රධාන මාර්ගය අබලන්වී ඇති ස්ථාන අළුත්වැඩියා කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දමින්ද නලින් අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි සුධීරා සේමිණි මියගේ යෝජනාව අනුව ගල්පුස්සැල්ල ප්‍රධාන මාර්ගය අබලන්වී ඇති ස්ථාන අළුත්වැඩියා කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි සුධීරා සේමිණි ලියනගේ මිය -

**06-60.** නෙළුගොල්ල 21 පාර සිතාරි වත්සලාගේ නිවස අසල සිට සෝමරත්න මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි කේ.ඩී. චූලා ශාන්ති මිය මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි සුධීරා සේමිණි මියගේ යෝජනාව අනුව නෙළුගොල්ල 21 පාර සිතාරි වත්සලාගේ නිවස අසල සිට සෝමරත්න මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි සුධීරා සේමිණි ලියනගේ මිය -

**06-61.** මැණික්තැන්න පාර අබලන්වී ඇති තැන් අළුත්වැඩියා කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සුධීරා සේමිණි ලියනගේ මියගේ යෝජනාව අනුව මැණික්තැන්න පාර අබලන්වී ඇති තැන් අළුත්වැඩියා කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා විසින් කරනු ලබන යෝජනා-

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

**06-62.** ර/ කිරිඇල්ල දේවරක්ඛිත ප්‍රාථමික විද්‍යාලය ඉදිරිපිට ප්‍රවේශ මාර්ගය පාසැලේ දරුවන්ට අනතුරු සහිත ස්ථාන මගඇරෙන සේ අත්වැටක් යොදා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.රන්ජන් ප්‍රදීප් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -
මේ සම්බන්ධයෙන් විදුහල්පතිතුමාත් නිතර දැනුම් දෙනවා.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -
අදාළ අංශ දැනුවත් කොට ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා ගේ යෝජනාව අනුව ර/ කිරිඇල්ල දේවරක්ඛිත ප්‍රාථමික විද්‍යාලය ඉදිරිපිට ප්‍රවේශ මාර්ගය පාසැලේ දරුවන්ට අනතුරු සහිත ස්ථාන මගඇරෙන සේ අත්වැටක් යොදා සංවර්ධනය කිරිම සම්බන්ධව අදාල අංශ දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

**06-63.** ර/ හාන්දුකන්ද විද්‍යාලය, (කිරිඇල්ල) ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -
දුෂ්කර ප්‍රදේශයක ඉන්න මේ දරුවන්ට වටිනා සම්පතක් මේ ක්‍රිඩා පිටිය. දරුවන්ගේ ඉදිරි අනාගතයට බලපාන තැනක්. සංවර්ධනය කිරිම ඉතාම වැදගත්.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
අදාළ අංශ දැනුවත් කොට ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා ගේ යෝජනාව අනුව ර/ හාන්දුකන්ද විද්‍යාලය, (කිරිඇල්ල) ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සමබන්ධව අදාල අංශ දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

**06-64.** ඉඩංගොඩ වසමේ අළුකැටිය වත්ත ප්‍රජා ශාලාව දැල්ගසා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

මේ ස්ථානයේ සමිති වලට අයිති භාණ්ඩ පවා තියෙනවා. ආරක්ෂාවක් නෑ. මේක අත්‍යවශය කරුනක්.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා ගේ යෝජනාව අනුව ඉඩංගොඩ වසමේ අළුකැටිය වත්ත ප්‍රජා ශාලාව දැල්ගසා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

**06-65.** කැන්දලන්ද ජයවර්ධන මහතාගේ නිවස දෙසට ඇති මාර්ගයේ අනතුරු ගස් ඉවත්කිරිම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

දැනට මාස 5 කට පෙර කැන්දලන්ද ජයවර්ධන මහතාගේ නිවසට යන අතුරු මාර්ගයේ අනතුරු ගස් ඉවත් කරන්න මුදල් බැඳලා රිසිට් අරන්. කාර්මික නිලධාරිත් බැළුවා. කොස් ගස් දෙකයි,මහෝගනි ගස් දෙකයි.ප්‍රාදේශිය ලේකම් හරහා හෝ දැව සංස්ථාවට යොමු කරන්න. අසනිප අය ඉන්න ගෙදරක්. ඒ යන මාර්ගය සංවර්ධනය කරන්න මේ ගස් බාධාවක්. මන්ත්‍රීවරයා ලෙස මම අපහසුතාවට පත් වෙනවා.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

අනතුරු ගස් ඉවත් කිරිම සභාවෙන්කල යුතුයි. සභාවේ ගස් කපන අය හිටියා කලින් ඒ අය දැන් නෑ. ඒ කම්කරු අයට ඒ හැකියාව තිබුනා. මේ සම්බන්ධව විෂය සොයා බලන්න. නැවත් සිහිකැඳවීම් යොමු කරන්න. ගස් කැපුවේ නැතිනම් ඒ අයදුම්පත්‍රය යොමුකල අය ඒ බව සභාවට දැනුම් දෙන්නත් ඕනි. කිරිඇල්ලේ ප්‍රාදේශිය ලේකම් එකටත් අනතුරු ගස් තියෙනවා. ගස් කපන බලය තියෙන්නේ අපිට. මේක නැවත සිහි කැඳවලා ඉදිරි කටයුතු කරන්න. ගිමන්හල ලගත් අනතුරු ගහක් තියෙනවා. ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

අක්කර 16 , රාජු මහත්තයාගේ අනතුරු ගස් තාම කපලා නෑ. වත්තේ ගස් වගයක්. ඒ ගැනත් කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -
යම් ක්‍රමවේදයකට ගස් කපන්න හැකි අයෙක් මේ කටයුත්තට යෙදවීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

ගස පරික්ෂා කරලා ගස් අයිතිකරුට ගහ කපන්න කියලා කපන්නේ නැත්නම් සභාවෙන් ගහ කපන්න ඕනි. පස්සේ ණයක් සේ සලකා ඒ මුදල අයකරගන්න. ගස් අයිතිකරු මුදලදෙන්නේ නැත්නම් නඩුකටයුතු , නීතිකටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

කරපිංච වත්තේ කඩේ හන්දියේ මාරගහ අවුරුදු 100 කට වැඩිය පැරණියි. මේ ගහ කැපුවේ කාගේ උවමනාවටද? කපලා දැන් පාරේ දමලා ගිහින් .කරපිංච පාරේ. දැව ටික දාලා. මාර්ගයේ වාහන යන්න බෑ. මම මාස දෙකකට කලින් කිව්වා. මම කොට තල්ලු කලා . පැරඩයිස් පැත්තේ පාරට. මේ ගැන සොයාබලන්න. වාහනයක් යන්න බෑ ජනතාවට.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා ගේ යෝජනාව අනුව කැන්දලන්ද ජයවර්ධන මහතාගේ නිවස දෙසට ඇති මාර්ගයේ අනතුරු ගස් ඉවත්කිරිම සම්බන්ධව සිහිකැඳවීම් සිදුකර ඉදිරි කටයුතු සිදු කිරීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

**06-66.** බටහිර කාහේන්ගම ඇළ මාර්ගය මේ වන විට අපවිත්‍රව ගැටළු සහගතව ඇති අතර මේ සම්බන්ධව පියවරක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

හිදැල්ලන ඔසන්ත මැණික් මගින් මේ ඇළ පුද්ගලික ධනයෙන් සුන්දරව නිර්මණය කළා. මේ ඇළට යුධහමුදා කඳවුරෙන් මලමූත්‍රා මුදා හරිනවා. සතෙකුටවත් ලගින් යන්න බෑ. අඹගස්හන්දිය මාර්ගයේ යන ගමේ අයත් කියනවා. මේ තැන කරපිංච පැත්තට කැම්ප් එක පිටුපස්සේ. කුඹුරු කාලෙට ඇළට බහින්න බෑ. ඇඟ කසනවා. පළු දානවා. විශාල ලෙස විශබීජ රැස් වුන තැනක්. අදාළ ස්ථාන දැනුවත් කරලා විකල්ප අරන් කටයුතු කරන්න. ගොවිතැන් කරන ජනතාවයි මේ ගමන් කරන ජනතාවයි වෙනුවෙන් ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -</u>
මහජන සෞඛ්‍ය පරික්ෂකට කියන්න. හයිඩ්‍රාමණී එක ඉදිරිපිටත් එහෙමයි. ගඳයි. සොයා බලන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මහජන සෞඛ්‍ය පරික්ෂක තුමාව දැනුවත් කරලා මේ ගැන ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා ගේ යෝජනාව අනුව බටහිර කාහේන්ගම ඇළ මාර්ගය මේ වන විට අපවිත්‍රව ගැටළු සහගතව ඇති අතර මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරික්ෂක දැනුවත් කර ඉදිරි පියවරක් ගැනීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -

**06- 67.** බටහිර මුදුන්කොටුව ග්‍රාම නිලධාරි වසමේ සරත් කඩේ අසල සිට දිද්දෙනියවත්ත පහල මාර්ගයේ චන්ද්‍රසිරි දිසානායක මහතාගේ නිවස දෙසට ඇති මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -
පාරේ තැනින් තැන සංවර්ධනය වෙලා තියෙන්නේ. මේ කොටසෙ යතුරුපැදියකටවත් යන්න බෑ.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා ගේ යෝජනාව අනුව බටහිර මුදුන්කොටුව ග්‍රාම නිලධාරි වසමේ සරත් කඩේ අසල සිට දිද්දෙනියවත්ත පහල මාර්ගයේ චන්ද්‍රසිරි දිසානායක මහතාගේ නිවස දෙසට ඇති මාර්ගයේ සංවර්ධනය නොවූ කොටස් සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -

**06- 68.** අකුරණ ග්‍රාම නිලධාරි වසමේ දැල්වත්ත ප්‍රධාන මාර්ගය ජයන්ත මයාගේ නිවස අසල සිට ඉදිරියටද ,අක්කර 10 නිමල් මහතාගේ නිවස අසල සිට හොරගහකැලේ වත්ත පාර මීටර් 100 ක් ද කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.හරිසිංහ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා ගේ යෝජනාව අනුව අකුරණ ග්‍රාම නිලධාරි වසමේ දැල්වත්ත ප්‍රධාන මාර්ගය ජයන්ත මයාගේ නිවස අසල සිට ඉදිරියටද ,අක්කර 10 නිමල් මහතාගේ නිවස අසල සිට හොරගහකැලේ වත්ත පාර මීටර් 100 ක් ද කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා -

**06–69.** මාටුවාගල වෙරළුගස්කොටලිය සංවර්ධනය නොවූ මාර්ගවල ඉතිරි කොටස් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.හරිසිංහ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී.සිරිල් කරුණාරත්න මහතා ගේ යෝජනාව අනුව මාටුවාගල වෙරළුගස්කොටලිය සංවර්ධනය නොවූ මාර්ගවල ඉතිරි කොටස් සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා විසින් කරනු ලබන යෝජනා-

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -

**06- 70.** අම්බවනාන කුඹුර මාර්ගය ( පින්නකනත්ත අතුරු මාර්ගය ) පැතිබැම්ම දමා කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා ගේ යෝජනාව අනුව අම්බවනාන කුඹුර මාර්ගය ( පින්නකනත්ත අතුරු මාර්ගය ) පැතිබැම්ම දමා කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -

**06-71.** දික්ගෙඩි ගහහේන අතුරුමාර්ගය අඩි 300 ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද අධිකාරම් මහතා -
මේ පින්නකනත්ත අතුරු මාර්ගය. පිවිසුම්ස්ථානයට ගැටළුවක්. දෙපැත්තේ බැමි. පාරට අවහිර ලෙස තියෙන්නේ. මේ මාර්ගය සංවර්ධනය කල යුතුයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා ගේ යෝජනාව අනුව දික්ගෙඩි ගහහේන අතුරුමාර්ගය අඩි 300 ක් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -

**06-72.** මැලේ බැද්දහේන සෝමේ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය ගල් ඉවත් කර අඩි 300ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

මේක ජනතාවගේ අත්‍යවශය කටයුත්තක්. මළ ගෙයක් වෙලා ඒ මළ ගෙදරට මරණය ගෙනිච්චේ කොට උඩින්. පාරේ යන්න බෑ. දමින්ද මන්ත්‍රී තුමාත් දන්නවා. ඉදිරි කාලගුණය අනුව මේ පාර තවත් අබලන් වෙයි. වැස්සොත් බාරේ යන්න බෑ. ඉක්මන් පියවරක් අවශ්‍යයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා ගේ යෝජනාව අනුව මැලේ බැද්දහේන සෝමේ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය ගල් ඉවත් කර අඩි 300ක් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටි.එම්. උමේෂා මල්කාන්ති මිය විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටි.එම්. උමේෂා මල්කාන්ති මිය-

**06-73.** දෙව්පහල හේන්යාය මල්කැකුල මාවත, හේන්යාය පාරෙන් සම්බන්ධ වන තැන මිටර් 150 ක් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්. උමේෂා මල්කාන්ති මියගේ යෝජනාව අනුව දෙව්පහල හේන්යාය මල්කැකුල මාවත, හේන්යාය පාරෙන් සම්බන්ධ වන තැන මීටර් **150** ක් කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්. උමේෂා මල්කාන්ති මිය-</u>

**06- 74.** දෙව්පහල දික්හේන ප්‍රජා ශාලාවට දැල් ගැසීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ටී.එම්. උමේෂා මල්කාන්ති මියගේ යෝජනාව අනුව දෙව්පහල දික්හේන ප්‍රජා ශාලාවට දැල් ගැසීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මිය විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මිය-</u>

**06-75.** දුම්මගේගොඩ උදේනි වීරසිංහ මහතාගේ නිවස අසල බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මියගේ යෝජනාව අනුව දුම්මගේගොඩ උදේනි වීරසිංහ මහතාගේ නිවස අසල බෝක්කුව ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මිය-</u>

**06-76.** ගල්අමුණගම රාමනායක මාවතේ කෙළවර මීටර් **80** ක් පමන මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මිය-

පවුල් 20 ක් විතර භාවිතා කරන මාර්ගයක්. මේවන විට මාර්ගය කැඩිලා. ගමන් කරන්න අපහසුයි.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් යෝජනාව ක්‍රියාත්මක කිරීමට ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මියගේ යෝජනාව අනුව ගල්අමුණගම රාමනායක මාවතේ කෙළවර මීටර් 80 ක් පමන මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මිය-

06- 77. රණසිංහ පෙදෙස ධර්මපාල මහතාගේ නිවස අසල සිට කුඹුර හරහා ඇති පාර පස් පුරවා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මිය-

පවුල් 40 ක් විතර භාවිතා කරන මාර්ගයක්. මීටර් 200 ට අඩු දුරක් තියෙන්නේ හදන්න.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් යෝජනාව ක්‍රියාත්මක කිරීමට ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ජී.ඒ.එස්. මදුභාෂිණී මියගේ යෝජනාව අනුව. රණසිංහ පෙදෙස ධර්මපාල මහතාගේ නිවස අසල සිට කුඹුර හරහා ඇති පාර පස් පුරවා මාර්ගය සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් කරනු ලබන යෝජනා-

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -

**06-78.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ කසළ එකතු කරන ට්‍රැක්ටර් රථය ඇල්ලගාව කැටකැඩැල්ල දක්වාත් යටිපච්ච පාංකඩය දක්වාත් ධාවනයේ යෙදවීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා --</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>
මේ ප්‍රෙද්ශයේ විශේෂ ස්ථාන රැසක් තියෙනවා. ඇහැලියගොඩ කසළ රථය මේ සීමාවට එනවා. ජනතාව අහන්වා ඇයි කුරුවිට රථයට එන්න බැරි කියලා. මේ කසළ එකතු කරන ට්‍රැක්ටර් රථය ඇල්ලගාව කැටකැඩැල්ල දක්වාත් යටිපච්ච පාංකඩය දක්වාත් ධාවනයේ යෙදවීමට කටයුතු කරන්න.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මේ ටැක්ටරය යෙදවීමේ හැකියාව සම්බන්ධව සොයාබලා ඉදිරි පියවර ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා ගේ යෝජනාව අනුව_කුරුවිට ප්‍රාදේශීය සභාවේ කසළ එකතු කරන ට්‍රැක්ටර් රථය ඇල්ලගාව කැටකැඩැල්ල දක්වාත් යටිපච්ච පාංකඩය දක්වාත් ධාවනයේ යෙදවීමට ඇති හැකියාව සොයාබලා ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>

**06-79.** මඩල පාලම අසල කරඳන ඇල නාන තොටුපල සඳහා පඩිපෙලක් ඉදිකිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඉනෝකා මල්ලවආරච්චි මිය --</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>

මේ නානතොට වියලා කාලවලදිත් ඉතාමත් වටින ස්ථානයක්. හැකි ප්‍රමාණයට හෝ පඩිපෙල හදමු.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් යෝජනාව ක්‍රියාත්මක කිරීමට ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා ගේ යෝජනාව අනුව මඩල පාලම අසල කරඳන ඇල නාන තොටුපල සඳහා පඩිපෙලක් ඉදිකිරිමට_ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -

**06- 80.** වල්බිහිවී ඇති මඩල හංදිය පොදු වැසිකිලිය පිළිබඳව තීරණයක් ගෙන ඉදිරි කටයුතු කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා --

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -

දැනට වල්බිහිවෙලා තියෙන්නේ. මාර්ග රක්ෂිතයේ තියෙන්නේ. මේ පිළිබඳව පරීක්ෂා කරලා ඉදිරි කටයුතු කරන්න.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

කාර්මික නිලධාරි වාර්තා අරගෙන ඉදිරි කයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා ගේ යෝජනාව අනුව වල්බිහිවී ඇති මඩල හංදිය පොදු වැසිකිලිය පිළිබඳව කාර්මික නිලධාරිවාර්තාගෙන , තීරණයක් ගෙන ඉදිරි කටයුතු කිරීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-

**06-81.** තෙප්පනාව ඉහලගම වසමත් මැදගම වසමත් යා වන කුරුබැටිය වත්ත ඉහලගම මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.හරිසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-

මේ මාර්ගයේ වැස්සට කාටවත් යන්න බෑ. 2018 දි විතර සංවර්ධන කටයුත්තක් කලත් අයේ අළුත්වැඩියාවක් උනේ නෑ. 2011 බෝක්කු දෙකක් දැම්මත් ගංවතුරට කඩන් ගියා. දැන් එතන ලයිට්කණු දාලා ඊට උඩින් යන්නේ. ත්‍රි වීල් පෙරලෙනවා. ගංවතුර වෙලාවට ගිලන්රථයක් වත් යන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.හරිසිංහ මහතා -

රෝහලට යන්න යන්නත් පුළුවන් ඒ මාර්ගයෙන්. මාර්ගයයි පාලමටයි ලක්ෂ 40 ක් විතර යයි. ලයිට් කණු දාලා දැනට යන්නේ. වාහන ඇලට වැටුනොත් දැඩි අවධානමක්. පළාත් සභාවෙන් හෝ මධ්‍යම රජයෙන් හෝ ප්‍රතිපාදන අරන් මේ කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව තෙප්පනාව ඉහලගම වසමත් මැදගම වසමත් යා වන කුරුබැටිය වත්ත ඉහලගම මාර්ගය සංවර්ධනය කිරිමට ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-

**06- 82.** තෙප්පනාව මැදගම බේකරිය මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩි.හරිසිංහ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-

බේකරිය ලඟින් වතුර පාර පහලට බහින්නේ. දෙපැත්තේ ඉඩම් යටවෙනවා. කාණුවක් ගන්න දෙන්නේ නෑ. කොන්ක්‍රිට් දැම්මොත් මිනිස්සුන්ට ආපදාවක් නැතිව යන්න පුළුවන්. මිටර් 100 ක් විතර.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව තෙප්පනාව මැදගම බේකරිය මාර්ගය සංවර්ධනය ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-
**06- 83.** තෙප්පනාව පහලගම මණ්ඩදෙනිය වත්තහේන මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩි.හරිසිංහ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-

මණ්ඩදෙනිය ලග ලගින් වතුර ටැංකිය ලඟ පාර. මේපාර අබලන්. වයසක අය ඉන්නවා. හිදිසියකට යන්න බෑ. අඩි 6 පාරක් තියෙන්නේ. බයිසිකලයක් වත් යන්න බෑ.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතාගේ යෝජනාව අනුව තෙප්පනාව පහලගම මණ්ඩදෙනිය වත්තහේන මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිසිර සේනාරත්න මහතා විසින් කරනු ලබන යෝජනා-</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිසිර සේනාරත්න මහතා-</u>

**06-84.** **එනසාල්දොල ට්‍රාන්ස්පෝමරය අසලින් වමට ඇති උඩ පාර පුවක්හේන හරහා පාතගම දක්වා මාර්ගය කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිසිර සේනාරත්න මහතාගේ යෝජනාව අනුව . එනසාල්දොල ට්‍රාන්ස්පෝමරය අසලින් වමට ඇති උඩ පාර පුවක්හේන හරහා පාතගම දක්වා මාර්ගය කොන්ක්‍රිට් කර සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිසිර සේනාරත්න මහතා-</u>

**06-85.** **එනසාල්දොළ පිං ලිඳ අළුත්වැඩියා කිරිමට යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිසිර සේනාරත්න මහතාගේ යෝජනාව අනුව . එනසාල්දොළ පිං ලිඳ අළුත්වැඩියා කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.හරිසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.හරිසිංහ මහතා</u>

**06-86.** **තෙප්පනාව රෝහල අසල සුසන්ත මයාගේ නිවස අසල අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.700000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී .හරිසිංහ මහතාගේ යෝජනාව අනුව තෙප්පනාව රෝහල අසල සුසන්ත මයාගේ නිවස අසල අතුරු මාර්ගය කොන්ක්‍රිට් කිරිමට රු.700000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.හරිසිංහ මහතා-

**06-87.** ගල්කඩ ඉදිගහලන්ද ජල පොම්පාගාරයට යන මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීමට රු. **1000000.00** ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩි.හරිසිංහ මහතාගේ යෝජනාව අනුව ගල්කඩ ඉදිගහලන්ද ජල පොම්පාගාරයට යන මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරීමට රු. 1000000.00 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.හරිසිංහ මහතා-

**06-88.** ආරාමේ කොබෝකැල්ල මාර්ගය සංවර්ධනය කිරිමට රු.**1000000.00** ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-

මේ පාරේ වහිනකොට ගහගෙන යන තරමට වුතුර. පතනවත්ත පාසැල ලගත් අබලන් වෙලා. ගෙවල් ගොඩකට යන පාර. වාහන යන්න බෑ. වතුර ඇතුලට යනවා. මේ වෙනකොට වතුර පාර රෝහල ලගට එකතු වෙනවා. මේ සම්බන්ධව පරික්ෂා කරලා ගැලපෙන ක්‍රමයකට සංවර්ධනය කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.හරිසිංහ මහතා

මුලින් සාකච්චා කල කසල ගැටළු සම්බන්ධව යමක් ප්‍රකාශ කල යුතුයි. සෞඛ්‍ය වෛදය කිලධාරි කාර්යාලය එක්ව මේ කටයුත්ත කලොත් පහසුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා පොලසියත් සමුපාකාරය, වෙළඳ සංගම් එක්ක සභාය ගමු. සමිති සමාගම් දැනුවත් කරමු. විවිධ ලෙඩරෝග වලට මුලක් මේ පොලිතින් දහනය කිරිම. ඒ පිලිබදව ජනතාව දැනුවත් කරමු. කලින් දිලිණි මැඩම් හිටිය කාලෙත් ටැක්ටර් ගිහින් නොදිරන දව්‍ය ගෙනාවා. ඒක සාර්ථක අනා. ඩෙංගු වැඩසටහන එක්ක කලේ. දේශිය දේට හුරු උනොත් මේ පොලතින් ප්ලිස්ටික් ගැටව අවම කරගන්න පුළුවන්. ජනතාව ඒකට හුරු කරවමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩි. හරිසිංහ මහතාගේ යෝජනාව අනුව ආරාමේ කොබෝකැල්ල මාර්ගය සංවර්ධනය කිරිමට රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා-

**06-89.** එරත්න වනුමැරේ ගම් සභා මාර්ගය පස් කපා ඉවත් කර සංවර්ධනය කිරීමට ලක්ෂ 06 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා-
කාර්මික නිලධාරි වාර්තා අරන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතාගේ යෝජනාව අනුව එරත්න වනුමැරේ ගම් සභා මාර්ගය පස් කපා ඉවත් කර සංවර්ධනය කිරීමට ලක්ෂ 06 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා-

**06-90.** දකුණු අඩවිකන්ද සජීව මහතාගේ නිවස අසල ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු. 400000.00 ක අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයනෙත්ති මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතාගේ යෝජනාව අනුව දකුණු අඩවිකන්ද සජීව මහතාගේ නිවස අසල ඇති මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු. 400000.00 ක අවශ්‍ය ද්‍රව්‍ය ලබාදීමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය විසින් කරනු ලබන යෝජනා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය-

**06- 91.** එල්ලාවල පහලගම මනන්ඇල්ල මඩල කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගනාත් විජේසුන්දර මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය-

මේ මනන් ඇල්ලට යන මාර්ගයක්. දෙස් විදෙස් සංචාරක ආකර්ශනයට ලන්වෙලා තියෙන ඇල්ලට යන පහසුකම සකසා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගනාත් විජේසුන්දර මහතා
මේ ඇල්ල විදෙස් ආකර්ශනයට ලක් උන තැනක්. ප්‍රවේශ මාර්ගය අබලන්. තාර කැඩිලා. මඩ වලවල්. සනිපාරක්ෂක කටයුතු වලට තැනකුත් නෑ. මේක වටිනා භූමියක්. සංවර්දනය කරමු. සභාවට ආදායමක් ගන්නත් පුළුවන්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය ගේ යෝජනාව අනුව_එල්ලාවල පහලගම මනන්ඇල්ල මඩල කොටස සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය-

**06- 92.** එල්ලාවල පහලගම වසමේ එගොඩ ලන්ද මාර්ගයේ ඉතිරි කොටස සම්පූර්ණ කිරිමට යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගනාත් විජේසුන්දර මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය ගේ යෝජනාව අනුව එල්ලාවල පහලගම වසමේ එගොඩ ලන්ද මාර්ගයේ ඉතිරි කොටස සම්පූර්ණ කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය-

**06- 93.** එල්ලාවල වසමේ ලියන්ගහවත්ත මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගනාත් විජේසුන්දර මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය ගේ යෝජනාවඅනුව එල්ලාවල වසමේ ලියන්ගහවත්ත මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

**06 - 94.** මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ බෝක්කුව හා මාර්ගය සංවර්ධනය කිරීමට රු.**2000000.00** ක ප්‍රතිපාදන ලබා දීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

මෙය අඩි 20 ක් පළල මාර්ගයක්. කාපට් ව්‍යාපෘතිය යටතේ නම් කරලා බැමි බැඳලා. වැඩ අතරතුර නතර කලා. හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානයටත් යන පාර. පවුල් දාහක විතර ජනතාව මේ පාර භාවිතා කරනවා. දිනකට වාහන සීයක් විතර යනවා. වසර කීපයක මුදල් එකතු කරලා හරි මේ පාර සංවර්ධනය කරන්න. කාර්මික නිලධාරි කියනවා මේ පාර එකවර කරන්න බැරිළු. අධියර කීපයකින් කරන්න වෙයි.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් යෝජනාව ක්‍රියාත්මක කිරීමට ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ බෝක්කුව හා මාර්ගය සංවර්ධනය කිරීමට රු.**2000000.00** ක ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධයෙන්, ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

**06- 95.** මෙනේරිපිටිය වසමේ තිරිවාන බඹරවැල්කැටිය ඇල අසල ඩෙන්සිල් මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට රු.**1000000.00** ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

ප්‍රදේශවාසීන්ගේ දැඩි ඉල්ලීමක් මේක. නොහැඳුණු මාර්ග දහයෙන් එකක් මේක.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

මාර්ගය තියෙන්නේ ඇළ අයින දිගේ. බයිසිකලයක් වත් යන්න බෑ. සංවර්ධනය කලයුතු අත්‍යාවශ්‍ය මාර්ගයක්.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව මෙනේරිපිටිය වසමේ තිරිවාන බඹරවැල්කැටිය ඇල අසල ඩෙන්සිල් මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -
06-96. විසල් රත්නපුර ජලයෝජනා ක්‍රමයේ මිල්ලවිටිය , පුස්සැල්ල හා මෙනේරිපිටිය වසම් තුළ නළ එලූ මාර්ග සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -
විසල් යෝජනා ක්‍රමය වසර ගාණකට පෙර මේ පළාතට ආවේ. ඒ යටතේ මේ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙද්දි පාරවල් වල නල එලන්න කඩපුවා. දැන් ඒවා තවත් කැඩිලා ගිහිල්ලා. සභාව විසිරෙව්වට පස්සේ මේවා ක්‍රියාත්මක වුනේ. ඒ යෝජනා ටික තියෙනවා. ඉටු කරලා දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -
කාහේන්ගම යුද හමුදාකඳවුර පාරේ විසල් ජල යෝජනා ක්‍රමය යටතේ පළුදු කර තවමත් සකසා නැති පාරවල් දෙකක් තියෙනවා. ඒ ස්ථාන සෝදාපාළුවට ලක්වෙලා. ඒ ස්ථාන පිලිසකර කර දෙන්න.
එසේම මලව, ශාන්තිපුර මාර්ගය සැකසුවත් එවකට හිටිය කාර්මික නිලධාරී වරයා ඒ මාර්ගයේ කානුව දැකලා නෑ. කාණුවට ඉඩ තියලා නෑ. අසල ගෙවල් වල අප ජලය කාණුවට එන්නේ. මේ මාර්ගයට කුඩා කාණුවක් අවශ්‍යයි. විසල් ජල යෝජනා ක්‍රමය යටතේ මේ මාර්ගයෙත් කටයුතු කලේ. මේ මාර්ග සම්බන්ධ කටයුතුත් සිදු කර දෙන්න.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

විසල් ජල යෝජනා ක්‍රමය යටතේ පළුදු කරන ලද සියළු මාර්ග සම්බන්ධ විස්තර ගමු. සංවර්ධන කටයුතු සිදු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව විසල් රත්නපුර ජලයෝජනා ක්‍රමයේ මිල්ලවිටිය , පුස්සැල්ල හා මෙනේරිපිටිය වසම් තුළ නළ එලූ මාර්ග සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා විසින් කරනු ලබන යෝජනා-</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා-</u>

**06- 97.** කදන්ගොඩ පොදු සුසානභූමිය හා එබේවල පොදු නාන ළිද සභාව සතු දේපලක් වන අතර පොදු ජනතාවට එහි ඇති අයිතිය ආරක්ෂාකර දෙන ලෙසට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා-</u>
කේ.එම්. හින් මහත්මයා කඳංගොඩ ජනතාවට ලබාදුන්න මේ වටිනා ඉඩම පොදු සුසානභූමිය හා පොදු ළිද තිබඅනේ. ජනතාව ඒක දන්නවා. නමුත් මේවන විට ඒ දේපල පතල් ව්‍යාපාරිකයින් මේ ක ව්‍යාපාර වලට ගත්තා. නඩුවක් කියලා මේපාරට සභාව මගින් පසුගිය 14 දා කම්බි ගහන්න උත්සහා කලත් බැරි උනා. ඒ ඉඩම වටේ කම්බි ගහන්න. පොදු අයිතිය ආරක්ෂා කරන්න. පොදු නාන ළිද. මගේ මහප්පා කේ.එම්.ගුණසේකර 1968 පමන ගමට දුන්න ළිඳක්. ඒක අබිලි ද්‍රවය දාලා වහලා. කාර්මික නිලධාරි පීඑච් අයි බලලා මේවා සභාවට ගන්න. ගොවියෙකුට මඩ හොදාගන්නවත් ඒ ළිදෙන් බෑ. දැන්. ඒ ලිද ව්‍යාපාරික මහතෙක් වහලා. ඒක නිරවුල් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා-</u>
ඒ සුසානභූමිය වටේ 26 වෙනිදාට කම්බි ගහනවා.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
සියළු සුසානභූමි පිලිබඳව මායිම් ගැටළු තියෙනවා. ඒවා පිලිබඟදව සොයා බලලා කටයුතු කරමු. ළිද සභාව සතු දේපලක් නිසා ඒගැන කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතාගේ යෝජනාව අනුව</u> කදන්ගොඩ පොදු සුසානභූමිය හා එබේවල පොදු නාන ළිද සභාව සතු දේපලක් වන අතර පොදු ජනතාවට එහි ඇති අයිතිය ආරක්ෂාකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදුකිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.ජයසේකර මහතා-

**06- 98.** මල්වත්ත ඕවිට පාලම කැඩී අබලන්වී ඇති නිසා එය අළුතෙන් සැකසීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ගයාන් වික්‍රමසූරිය මහතා-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.ජයසේකර මහතා-
මේ මාර්ගය පාලමේ පැතිබැම්ම අබලන්. රජමහා විහාරයටයි ජනතාවගේ තේදළු ගෙනියන්නයි මේ මාර්ගය වැදගත්. සාමාන්‍ය ජනතාව භාවිතා කරන මාර්ගය. සභා ප්‍රතිපාදන නැතිනම් වෙනත් ප්‍රතිපාදන අරන් හරි කරන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ගයාන් වික්‍රමසූරිය මහතා-

මේ පාලම ග්‍රාමීය සංවර්ධන අරමුදල් යටතේ ව්‍යාපෘතියට දකුණු කඳංගොඩින් ඉදිරිපත් කරලා තියෙන්නේ.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

අදාල අංශ දැනුවත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.ජයසේකර මහතාගේ යෝජනාව අනුව මල්වත්ත ඕවිට පාලම කැඩී අබලන්වී ඇති නිසා එය අළුතෙන් සැකසීමට අදාළ අංශ දැනුවත් කර කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.ජයසේකර මහතා-

**06- 99.** දෙල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ සද්ධාතිස්ස පලමු පටුමග මාර්ගය මීටර් 100 පමන තාර දමා සකස්කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මංගල ඩයස් මහතා-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි කේ.එම්.ජයසේකර මහතා-

මීට කලින් මේ පාර ප්‍රතිසංස්කරණය කලත් මේවන විට ගල් ගැලවිලා, වලවල් හැරිලා. අජිත් ශාන්තලාල් මහත්තයා හෙම ඉන්න පැත්තේ පාර. පවුල් 30 ක් විතර ඉන්නවා.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ගයාන් වික්‍රමසූරිය මහතා-

මේ මාර්ගය පිලිබදව අවධානය යොමු කරලා තියෙන්නේ. ඉදිරියේදි මාර්ග සංවර්ධන කටයුතු කරනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතාගේ යෝජනාව අනුව දෙල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ සද්ධාතිස්ස පලමු පටුමග මාර්ගය මීටර් 100 පමන තාර දමා සකස්කිරිම සංවර්ධන කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

06-100. සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023.01.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත් වල සැලසුම් පිලියෙල කිරිම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පලකිරිම පිලිබඳ නියෝග මාලාවේ කරන ලද නියම සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 2(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ මෙහි උපලේඛනයේ ඇතුලත් නාමලේඛනයේ දැක්වෙන පාරවල් හා පටු මාවත් කුරුවිට ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටුමාවත් ලෙස සැලකිය යුතු බවට කුරුවිට ප්‍රාදේශීය සභාවට යෝජනා කරමි. ඇමුණුම් 01 මගින් අදාල විස්තර ලබාදීලා තියෙනවා.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කුරුවිට ප්‍රාදේශිය සභා සීමාව තුල ඇති පාරවල් හා පටුමාවත් , කුරුවිට ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටුමාවත් ලෙස සැලකිය යුතු බවට අති විශේෂ ගැසට් පත්‍රයකින් ප්‍රකාශයට පත් කරනවා. මේ සම්බන්ධව වැඩිදුර කරුණු දැනගන්න මහා සභාව කාරක සභා අවස්ථාවකට පත් වෙමු.

මෙම අවස්ථාවේදි ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ ස්ථිරත්වයෙන් මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාවේදි විෂය නිලධාරී විසින් තොරතුරු ඉදිරිපත් කල අතර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය මගින් ලබාදුන් පුහුණු ව හා උපදෙස් මත 2022 අවසන් කාලය තුළ මෙම පාරවල් සිතියම්ගත කිරීමේ කටයුත්ත ආරම්භ කළ බවත් බල ප්‍රෙද්ශයේ A 8 ශ්‍රේණිය හා A4 ශ්‍රේණියට අයත් ප්‍රධාන මාර්ග වලට අදාල පාරවල් හා පටු මංමාවත් My track ඇප් එක මගින් මාර්ග වල දත්ත යොදාගෙන පාරවල් වලට අදාල තනි සිතියම් නිර්මාණය කල බවත්

දැනුම් දුන් අතර වැඩිදුරටත් සමීක්ෂන පත්‍රිකාවක් මගින් වීදි පහන් තොරතුරු, මාර්ග වල මතුපිට තත්වය, විදුලි කණු, බෝක්කු , මාර්ගයේ සාමාන්‍ය පළල, සංවර්ධිත පළල ,දිග ආදිය පිලිබඳව තොරතුරු ලබා ගත් අතර පසුව එම දත්ත උපයෝගී කරගෙන QGIS මෘදුකාංගය භාවිත කරමින් වෙන වෙනම මාර්ග වලට අදාල තනි සිතියම් නිර්මාණය කල බවත් දැනුම් දෙන ලදි.

මෙම අවස්ථාවේදී ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව නැවතත් මහා සභාව බවට පත් විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

නිලධාරින් මෙම කටයුත්තට දැඩි වෙහෙසක් අරන් කටයුතු කලා. දුෂ්කරතා මැද කටයුත්ත සිදු කළා. ගැටළුවකට තියෙන්නේ පාරේ සාමාන්‍ය පළල ලෙස සඳහන් කල දත්තය, පාරේ ආරම්භක ස්ථානයේ පළල ලෙස වෙනස් විය යුතුයි. පාරවල් වල ආරම්භයේ තියෙන පළල පාරේ හැමතැනම එකාකාරව නෑ. මැදදි වෙනස් වෙලා. තියෙන පාරේ පළල ගන්න පුළුවන්. මේ කටයුත්ත මෑතක ආරම්භ කල එකක්. මේ මාර්ගවල මුල් තොරතුරු ඉන්වෙන්ට්‍රි විධිහට ඇත්තේ. ඒ නිසා පාරේ දැනට තියෙන පළල ගත්තා නම් හරි. ගැසට් කරනකොට පාරේ ආරම්භක ස්ථානයේ පළල ලෙස දක්වන්න. කලින් මාර්ග ගැසට් කරද්දි සමහර දෝෂ නිසා මහජනතාව නඩු දැම්මා. පාරේ මුල අඩි 10 පලල තිබුනට මැදදි අඩි අටයි තියෙන්නේ. ඒ නිසා ඒ පාරේ පළල සම්බන්ධව, ආරම්භක ස්ථානයේ පළල ලෙස වචනය සංශෝදනය කරන ලෙස යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

ස්ථිර කරමි. මේ කටයුත්තේදි පොදු සිතියමට අමතරව වෙන වෙනම මාර්ග විස්තර ගන්න පුළුවන් උන එක වැදගත්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා -</u>

පාරවල් 25 ක් විතර තියෙනවා අපේ වසමේ.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අඩුපාඩු ඇති. ඒවා දෙවැනි වරට අවශ්‍ය පරිදි ගැසට් කර ගමු. මේ කටයුත්ත සිදු කරලා ඉදිරි පියවර ගමු. සංශෝධන ඉදිරිපත්කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

සභාව සතු මාර්ගවල ආරම්භය මනින්නේ. මේ වෙ කොට කොන්ක්‍රීට් කරලා නම් ඒ පළලද? ගලුකාගම සමන්දේවාලය පාරේ රුකුල්මුල්ල පාර පිළිබඳව. පාරට අඩි 17 ක් තියෙනවා නම් අඩි 8 කට නම් කොන්ක්‍රීට් කරලා තියෙන්නේ ඉතිරි ටික අතඇරලා දානවද? යම් දිනක පාර

පළලල කරන්න ගියොත් ගැටළු. ඒ වගෙමයි කරපිංච වත්ත වතු මැදින් ගම්මාන වලට තියෙන අතුරු මාර්ග මනින්න දෙන්නේ නෑ. සභාවට පවරලත් නෑ. විරෝධතා දාන්න පුළුවන්ද?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
දේවින්ද මන්ත්‍රීතුමා කිව්වා වගේ අඩි 24 පළල පාර අඩි අටට කොන්ක්‍රිට් කලාම විශාල ප්‍රමානයක් අඩු වෙනවා. ගම් ප්ලෑනේ විස්තර තියෙනවා. එසේම මාර්ගය ආරම්භය හා අවසානය කොතනද කියලත් විස්තර ගන්න පුළුවන්.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

තාක්ෂණ මෙවලම් භාවිතයෙන් කල කටයුත්තක්. ගැසට් කළාම අපිට මාර්ගයේ සිතියම විස්තර ඔන්ලයින් ක්‍රමවේදය ඔස්සේ ගන්න පුළුවන්. බොහෝ කටයුතු වලට මේක පිටුවහලක් වෙනවා. මේ ටික ගැසට් කර ගමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
වතු සමාගම් වලට අයත් මාර්ග වලට වෙනම ක්‍රියා පද්ධතියක් තියෙන්නේ. මේ මාර්ගවල ආරම්භක ස්ථානයේ පළල ලෙස යෙදීම සම්බන්දව පළාත් පාලන කොමසාරිස්වරයාව දැනුවත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අංක 2316/20 සහ 2023.01.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටු මාවත් වල සැලසුම් පිලියෙල කිරිම හා නාම ලේඛනය දක්වමින් දැන්වීම් පලකිරිම පිලිබඳ නියෝග මාලාවේ කරන ලද නියම සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 2(1) වගන්තියෙන් කරන ලද නියමය යටතේ මෙහි උපලේඛනයේ ඇතුලත් නාමලේඛනයේ දැක්වෙන පාරවල් හා පටු මාවත් කුරුවිට ප්‍රාදේශිය සභාව විසින් පවත්වාගෙන යනු ලබන පාරවල් හා පටුමාවත් ලෙස සැලකිය යුතු බවටත් සංශෝධනයක් ලෙස පාරේ පළල සම්බන්ධව, දක්වා ඇති සාමාන්‍ය පළල යන්න වෙනුවට ආරම්භක ස්ථානයේ පළල ලෙස වචනය සංශෝදනය කරන ලෙස ත් ඉල්ලිමක් සිදු කිරිමට මහා සභාවේ ඒක මතිකව තීරනය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-101.** කුරුවිට ප්‍රාදේශිය සභාවේ මිලියන 2 ට වැඩි සහ මිලියන 3 ට අඩු ඇස්තමේන්තු වටිනාකම් ඇති කර්මාන්ත පිරිනැම්ම සඳහා පුවත්පත් දැන්වීම් පල නොකරන අවස්ථාවලදි සුදුසු ක්‍රමයක් යටතේ කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනිමට මෙම කාර්යාලයේ ලියාපදිංචි

කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයක් නොමැති බැවින් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙන් හෝ සබරගමුව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇති ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙන්, රත්නපුර විධායක ඉංජිනේරු කොට්ඨාශයට අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් මගින් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

සබරගමුව පළාත් සභාවේ ලියාපදිංචි අයවළුන්ගෙන් ගන්න. සෞඛ්‍ය, ඉංජිනේරු, ආදී වෙන වෙනම දක්වලා තියෙනවා. ඒ අය ඒ ඒ ක්ෂෙත්‍ර වලට ලියාපදිංචි අය. පළාත් සභාවේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි අයත් ගන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>
ග්‍රාම සංවර්ධන සමිති, ගොවි සංවිධාන වලටත් පුළුවන්නේ.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ප්‍රජා පාදක පුළුවන් ලක්ෂ 20 දක්වා විතරයි. මේ මිලියන 2 ට වැඩි සහ මිලියන 3 ට අඩු ඇස්තමේන්තු සඳහා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

විවිධ මාදිලියේ තක්කඩි පුද්ගලයින් මේ කොන්ත්‍රාත් කරන්න එනවා. භාරගන්න වැඩේ හරියට නොකර අධික ලාභයක් අරන් යනවා. තෙප්පනාවෙත් ඉන්නවා. ගුලනගොඩ මාර්ගය මීටර් 20ක් කොන්ක්‍රීට් කරන්න පැයක් ගියේ නෑ. ජේවිපි මහත්තයෙක් වැඩ කලේ. මහජන මුදල් විශාල හානියක් කලා. ඒ වගේ අඩ වැඩ කරන අයත් ඉන්නවා. නමත් කියන්නම්. නිසි ලෙස වැඩ කරන අයව මේ වැඩ වලට ගන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
මාර්ග සංවර්ධන කටයුතු වල ප්‍රමිතිය බලන්න කාර්මික නිලධාරි මහතාව යවමු. පළාත් සභාවේ හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙන් ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

කුරුවිට ප්‍රාදේශිය සභාවේ මිලියන 2 ට වැඩි සහ මිලියන 3 ට අඩු ඇස්තමේන්තු වටිනාකම් ඇති කර්මාන්ත පිරිනැම්ම සඳහා පුවත්පත් දැන්වීම් පල නොකරන අවස්ථාවලදි සුදුසු ක්‍රමයක් යටතේ කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනිමට මෙම කාර්යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයක් නොමැති බැවින් රත්නපුර දිස්ත්‍රික් ලේකම්

කාර්යාලයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛණයෙන් හෝ සබරගමුව පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඇති ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙන්, රත්නපුර විධායක ඉංජිනේරු කොට්ඨාශයට අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා සබරගමු පළාත් සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමලේඛනයෙන් සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් මගින් කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-102.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේදයේ ඖෂධ සංයෝජක තනතුරේ සේවය කර ඇති නිලධාරිණිය විශ්‍රාම ගොස් ඇති බැවින් එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීමක් සිදුකිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි. දැනට ඉන්නේ බහුකාර්ය වැඩ ක්ෂේත්‍ර කම්කරු අයෙක්. ඇයට වෙනත් වැඩ තියෙනවා. අදාළ සුදුසුකම් තියෙන අයෙක් බඳවා ගමු. විවෘත කැඳවීමක් කරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

සුදුසුකම් ඇති අයෙකු නීත්‍යානුකූලව කොන්ත්‍රාත් පදනමට බඳවා ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේදයේ ඖෂධ සංයෝජක තනතුරේ සේවය කර ඇති නිලධාරිණිය විශ්‍රාම ගොස් ඇති බැවින් එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීමක් සිදුකිරීමට ඒකමතිකව මහා සභා තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-103.** රියදුරන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යංශ ලේකම්ගේ අංක **CM/AD21/11/16/03/VII** හා **2025.308.05** දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි මෙම සභාවට කොන්ත්‍රාත් පදනමින් අනුමත රියදුරු තනතුරු සඳහා ප්‍රාදේශීය සභා අරමුදලෙන් වැටුප් ගෙවීමේ පදනමින් අනුමත කර ඇති බැවින් , සේවා අවශ්‍යතාවය මත ට්‍රැක්ටර් රථ රියදුරු ලෙසද සේවය කිරිම සඳහා රියදුරන් දෙදෙනෙකු සේවයේ යොදවාගත යුතුය යන්න යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

කොන්ත්‍රාත් පදනමින් අනුමත රියදුරු තනතුරු සඳහා ප්‍රාදේශීය සභා අරමුදලෙන් වැටුප් ගෙවීමේ පදනමින් බඳවා ගැනීමට අනුමත කර ඇති බැවින් , සේවා අවශ්‍යතාවය මත ට්‍රැක්ටර් රථ රියදුරු ලෙසද සේවය කිරිම සඳහා රියදුරන් දෙදෙනෙකු සේවයේ යොදවා ගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
කම්කරු අය වාහන එලවන්නත් පුළුවන් අය ඉන්නවා. ඒ අය ගැනත් සලකා බලන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව රියදුරන් බඳවා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CM/AD21/11/16/03/VII හා 2025.308.05 දිනැති ලිපියෙන් දන්වා ඇති පරිදි මෙම සභාවට කොන්ත්‍රාත් පදනමින් අනුමත රියදුරු තනතුරු සඳහා ප්‍රාදේශීය සභා අරමුදලෙන් වැටුප් ගෙවීමේ පදනමින් අනුමත කර ඇති බැවින් , සේවා අවශ්‍යතාවය මත ට්‍රැක්ටර් රථ රියදුරු ලෙසද සේවය කිරිම සඳහා රියදුරන් දෙදෙනෙකු සේවයේ යොදවාගැනීමට ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

06-104. ගරු සභාපතිතුමාගේ ධූර කාලයට පමනක් සීමාවන පරිදි පෞද්ගලික ලේකම්වරයෙකු පත්කරගත යුතුව ඇති අතර පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/ 21/30 හා 2009.11.23 ලිපියේ සඳහන් නියමයන් හා පළාත් පාලන කොමසාරිස්ගේ 2/2018 ලිපියේ සඳහන් පරිදි සභාපතිවරයාට පෞද්ගලික ලේකම්වරයෙකු පත්කර ගැනීමට හා තනතුරේ රාජකාරී කටයුතු සඳහා පහසුකම් සැපයීමයට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපතිතුමාගේ ධූර කාලයට පමනක් සීමාවන පරිදි පෞද්ගලික ලේකම්වරයෙකු පත්කරගත යුතුව ඇති අතර පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/ 21/30 හා 2009.11.23 ලිපියේ සඳහන් නියමයන් හා පළාත් පාලන කොමසාරිස්ගේ 2/2018 ලිපියේ සඳහන් පරිදි සභාපතිවරයාට පෞද්ගලික ලේකම්වරයෙකු පත්කර ගැනීමට හා තනතුරේ රාජකාරී කටයුතු සඳහා පහසුකම් සැපයීමයට ඒකමතිකව මහා සභා තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 105.** **කුරුවිට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි විසින් සිදුකර ඇති ඉල්ලිම අනුව කුරුවිට ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අලෙවි සැල ඉදිකිරිම සඳහා කුරුවිට නගරයේ සමුපකාර පිරවුම්හල හා මහජන ක්‍රිඩාංගනය අතර ඇති බිම්තීරුව හෝ සුදුසු ඉඩකොටසක් ලබාගැනීම සම්බන්ධව මහා සභා තීරණයක් ලබාගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා -</u>**

**ක්‍රිඩා පිටිය අසල දෙන්න එපා. මේ ස්ථානය ක්‍රිඩා තරඟයක් තියෙන කොට ජනතාව ඉඳගෙන බලා ඉන්න තැනක්. මිට පෙරත් විවිධ ආයතන ඉල්ලුවා. ඊට මෙහා කඩ කාමර තියෙනවා. ක්‍රමවේද අනුව ඒ තාවකාලික කඩ කාමරයක් දෙන්න. මම මේ ස්ථානය දෙනවට විරුද්ධයි. අර තියෙන කඩ කාමරයක් ක්‍රමවේද අනුව දෙන්න.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**සුදුසු කඩ කාමරයක් හෝ වෙනත් ස්ථානයක් බලලා දෙමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව හා කුරුවිට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි විසින් සිදුකර ඇති ඉල්ලිම අනුව කුරුවිට ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අලෙවි සැල ඉදිකිරිම සඳහා කුරුවිට නගරයේ සමුපකාර පිරවුම්හල හා මහජන ක්‍රිඩාංගනය අතර ඇති බිම්තීරුව හෝ සුදුසු ඉඩකොටසක් ලබාදීම සම්බන්ධයෙන්, පරික්ෂා කර බලා සුදුසු කඩ කාමරයක් හෝ වෙනත් ස්ථානයක් ලබා දිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06- 106.** **පරකඩුව සුබෝධි මාවතේ ගම්වාසින්ගේ ඉල්ලිම අනුව පරකඩුව සුබෝධි මාවත පටුමග මාවත පුළුල් කිරිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි මහින්ද ජයලාල් පතිරණ මහතා -</u>**

***එම යෝජනාව ස්ථිර කරමි. සුබෝධි මාවතේ පලමු පටුමග පසුගිය අප්‍රේල් 12 දින යම් පුද්ගලයෙක් වැටක් ගහලා වහලා. වාහනයක් ගන්නත් බෑ. පැමිණිලි කලත් බැරි උනා ඒක අරින්න. පර්චස් භාගයක් පමන ප්‍රමාණයයි අවශ්‍ය. මෙක පටු මාවතක් වගේ තියෙන්නේ. ගෙවල් අටකට වගේ යන්න තියෙන් පාරක්. සාමකාමීව විසඳගන්න බැරිනම් නීත්‍යානුකූලව කටයුතු කරමු.***

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**මේ සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා අරන් නීත්‍යානුකූලව ඉදිරි ක්‍රියා මාර්ග ගමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව පරකඩුව සුබෝධි මාවතේ ගම්වාසීන්ගේ ඉල්ලීම අනුව පරකඩුව සුබෝධි මාවත පටුමග මාවත පුළුල් කිරීම සම්බන්ධව කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන නීත්‍යානුකූලව ඉදිරි ක්‍රියා මාර්ගගැනීමට ඒකමතිකව මහා සභා තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 107. කුරුවිට ප්‍රාදේශීය සභාවේ RW 4650 දරණ ජල බවුසරය අළුත්වැඩියා කිරීම සම්බන්ධව සභාතීරණයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

*එම යෝජනාව ස්ථිර කරමි.*

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

*මෙම ජල බවුසරය භාවිතයට ගත නොහැකි ලෙස පළුදු වෙලා. මෙය අළුත් වැඩියා කිරීම පිළිබඳව (නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා ) කාර්යාලයේ යාන්ත්‍රික ඉංජිනේරු මගින් නිර්දේශ ලබාගෙන ඇති අතර ඔහු විසින් මෙහි ටැංකිය අළුත් වැඩියා කිරීම ඵලදායී නොවන බවත් මෙහි ට්‍රේලරය යහපත් තත්වයේ ඇති බැවින් එම වැසිය සඳහා වෙනත් ටැංකියක් තබා අළුත් වැඩියා කිරීම සුදුසු බවත් නිර්දේශ කර ඇත. එසේම අළුතින් ටැංකියක් තියලා අළුත්වැඩියා කිරීම සඳහා රු.1381800.00 ක ඇස්තමේන්තුවක් යන්ත්‍රෝපකරණ අධිකාරියෙන් ඉදිරිපත් කරලත් තියෙනවා. ඒ නිසා මේක කාර්මික නිලධාරි පරීක්ෂා කරලා තව දුරටත් වෙන එකක් ගන්නවා නම් පළාත් පාලන කොමසාරිස් අනුමැතියෙන් ගමු. ප්‍රාදේශීය ලේකම් ලඟ තියෙන්නේ ආපදාවලට ගෙනාපු ඒවා. ඒ අය ඒ බවුසර් වලින් වෙනම සේවා සපයනවා. අපිට තියෙන්නේ වෙනත් කාර්යන්.*

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

*මෙය නඩත්තු කලොත් විශාල මුදලක් වැය වෙනවා. ඒකෙන් සෑහෙන වැඩ කළා. පායන කාලෙට වතුර දුන්නා. මෝල කැළය ජනතාවට වතුර නෑ. සිංහල අවුරුද්දෙත් අපේ සුළු සේවක මහත්තුරුත් ගිහින් , මාත් ගිහින් වතුර බෙදලා දුන්නේ. ඒ ටැංකි වතුර බොන්න බෑ. වෙනත් වැඩ වලට හොඳයි. රුවන් මන්ත්‍රීතුමත් ඒ ටැංකියෙන් වතුර ගිහින් දීලා තියෙනවා. ආයේ ගන්නවා නම් වෙන වෙන තැන්වලින් ටැංකි ඉල්ලලා ගන්නේ නැතිව අළුතෙන් ගන්න.*

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. කේ. රන්ජන් ප්‍රදීප් මහතා -

*ජල බවුසරය අළුත් වැඩියාවට රු. 1381800.00 ක් පමන වැයවන බව දන්වලා. ඒකෙන් සෑහෙන වැඩ කළා. දැන් ඒ ටැංකිය දිරලා තියෙන්නේ. මේ ටැංකිය පාස්සනවද? අළුතෙන් ගන්නවද?*

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

*නව ටැංකියක් ලක්ෂ 13 ක් විතර වෙයි. පාණීය ජලය දෙන්නත් පුළුවන්.*

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි. කේ. රන්ජන් ප්‍රදීප් මහතා -</u>

*වෙනත් ආයතන වලින් පරිත්‍යාග ලෙස හම්බු වෙන්නේ අර වින විශාල බවුසර්. ඒවා නඩත්තු කරගන්න අපිට බෑ. පායන කාලෙට බවුසරයක් අත්‍යාවශ්‍යයි. අත්‍යාවශ්‍ය කරුණක්.*

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -</u>

*මම මේ සම්බන්ධව මේ ජල බවුසරය පරික්ෂාකර බලලා නෑ.*

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>
*ඩෙක්මා එකෙන් විතරයි ඇස්තමේන්තු මිලක් දිලා තියෙන්නේ. වෙන ආයතන වලිනුත් ගන්න.*

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

*වෙන ආයතන වලිනුත් ගමු. නිත්‍යානුකූල ක්‍රමවේදයට යමු.*

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.**

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ RW 4650 දරණ ජල බවුසරය අළුත්වැඩියා කිරීම සම්බන්ධව ආයතන කීපයකින් ඇස්තමේන්තු මිළ ගනන් කැඳවීමටත් ,ටැංකියක් සඳහා වැයවන මුදල සළකා බලා සුදුසු පරිදි කටයුතු කිරිමටත් ඒකමතිකව මහා සභා තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 108.** නාගරික සංවර්ධන අධිකාරියේ දැනුම්දීම අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ බෝපත් ඇල්ල ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා විස්තරාත්මක මිනින්දෝරු සැලැස්මක් සැකසීමට හා ඒ සඳහා ගෙවීම් කටයුතු සිදුකිරිම ට මහාසභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

*ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා -*
*එම යෝජනාව ස්ථිර කරමි.*

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

*නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති කළමණාකරණ අංශය විසින් දැනුම් දී තියෙනවා ව්‍යාපෘතියේ ගෘහ නිර්මාණ කටයුතු සඳහා සහ ඉංජිනේරුමය සැළසුම්, ව්‍යුහාත්මක සැළසුම් සඳහා විස්තරාත්මක මිනින්දෝරු සැළසුමක් අවශ්‍ය බව. ඒ සැලැස්ම සැකසීමටත්,ඒ සඳහා ගෙවීම් කිරිමටත් සිදු වෙනවා.*

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

*ඇල්ලගාව තියෙන අක්කර භාගයක ඉඩම කව්රු හරි ප්‍රාදේශීය ලේකම්ට බදු ගෙවලා අරන්. එතන කැබලි කිපයක් තියෙනවා. ගැටළු පවතිනවා. ඇල්ල ඉඩම් ආශ්‍රිතව.*

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -
*ප්‍රධාන ගේට්ටුව අසල ඇත්තටම අශෝභනයි. ඒක අළුත්වැඩියා කළාද? එතන වාහනත් ගාල් කරනවා. ප්‍රවේශ ස්ථානය. ඒ ස්ථානය එතනට ගැලපෙන ලෙස සකසන්න. බෝපත් ඇල්ල කිව්වාම එතන යම් පෞරුෂයක් ඇතිවන ලෙස මේවා සකසන්න. මට හිතෙන විධිහට එතන ඉඩම මදි. මුදලක් වැයවෙයි. නමුත් කළ යුතුයි. නාගරික සංවර්ධන අධිකාරිය එක්කත් කථා කරලා ඇල්ල සුන්දරත්වයට හානි නොවන ලෙස මේ කටයුතු කරන්න. ගේට්ටුව, මුර කුටිය, ජිවිත ආරක්ෂාව ගැන වගකීම, එතන පහසුක්ම් වගේම භූමි අලංකරණයත් විය යුතුයි. බෝපත් ඇල්ල සංචාරක ආකර්ශණය වැඩි වන ලෙස මේ කටයුතු කරන්න.*

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

නාගරික සංවර්ධන අධිකාරියේ දැනුම්දීම අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ බෝපත් ඇල්ල ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා විස්තරාත්මක මිනින්දෝරු සැලැස්මක් සැකසීමට හා ඒ සඳහා ගෙවීම් කටයුතු සිදුකිරීම ට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-109. 1987** අංක **15** දරණ ප්‍රාදේශිය සභා පනතේ **19** වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ **174- iv** උප වගන්තිය යටත් සඳහන් විධිවිධාන අනුව සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයක් සමඟ ඇතිකරගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම්ගත විම සඳහා බලය දිම හා ඊට අදාල ගිවිසුම අනුමත කිරිම සඳහා වන බලතල ඉහත කී පනතේ **12** වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරා දිය යුතුය යන්න සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

*එම යෝජනාව ස්ථිර කරමි.*

*කමිටු වාර්තා වල නිර්දේශ විධිහට දාන්න. අත්‍යාවශ්‍ය දෙයක් විතරයි තීරණ ගන්නේ. අනෙක්වා මහා සභාවට දාන්න. කමිටු වාර්තා කෙටුම්පත් පමනයි. සභා අනුමැතියෙන් පස්සේ ක්‍රියාත්මක වෙන්නේ.*

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

**1987** අංක **15** දරණ ප්‍රාදේශිය සභා පනතේ **19** වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ **174- iv** උප වගන්තිය යටත් සඳහන් විධිවිධාන අනුව සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතියකට අදාළ දෙවන පාර්ශවයක් සමඟ ඇතිකරගත යුතු කොන්ත්‍රාත් ගිවිසුම්ගත විම සඳහා බලය දිම හා ඊට අදාල ගිවිසුම අනුමත කිරිම සඳහා වන බලතල ඉහත කී පනතේ **12** වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව වෙත පවරාදීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
**06-110.**
**2025.08.07** දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති පරිසර හා පහසුකම් කමිටුවේ ගෙන ඇති තීරණයක් අනුව කුරුවිට නගරයේ අවිධිමත් ලෙස සවිකර ඇති දැන්වීම් පුවරු සම්බන්ධව පියවරක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ සම්බන්ධයෙන් කුරුවිට ව්‍යාපාරික හමුව මගින් ඉල්ලීම පරිසර කමිටුව වෙත යොමු කරලා තියෙනවා. පරිසර කමිටුව මගින් මහා සභාවට යොමු කරලා. නගරයේ අවිධිමත් ලෙස තැන තැන තියෙන දැන්වීම් පුවරු පිළිබඳව පරික්ෂා කර සභාව වෙත අදාල ගෙවීම් සිදු කර ඇති පුවරු සියල්ල සුදුසු එක් ස්ථානයක ප්‍රදර්ශනය කල හැකි පරිදි සවි කිරිමට කටයුතු කරමු. ඩිජිටෙල් පුවරු , එසේම බැනර් ,කටවුට් , දැන්විම්, ආදී සියළු දැන්විම් වර්ග පොදු ප්‍රමිතියක් අනුව නිශ්චිත ස්ථානයක ප්‍රදර්ශනය කිරිමට කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

**2025.08.07** දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති පරිසර හා පහසුකම් කමිටුවේ ගෙන ඇති තීරණයක් අනුව කුරුවිට නගරයේ අවිධිමත් ලෙස සවිකර ඇති සියළුම වර්ගයේ දැන්වීම් පුවරු හා දැන්වීම් වර්ග විධිමත් සැළසුමක් අනුව , පොදු ප්‍රමිතියකින් යුතුව නිශ්චිත ස්ථානයක ස්ථානගත කිරිමට මහා සභාවේ ඒක මතිකව තීරනය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-111.**

**2025.08.07** දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති පරිසර හා පහසුකම් කමිටුවේ ගෙන ඇති තීරණයක් අනුව කුරුවිට නගරයේ මේ වන විට හඳුනාගෙන ඇති අනවසර ඉදිකිරිම් ඉවත් කිරිම සම්බන්ධව පියවරක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

මේ වන විට හඳුනාගත් අනවසර ඉදිකිරිම් අතර කුරුවිට නගර මධ්‍යයේ හා ආසන්නයේ අනවසර ඉදිකිරිම් ඇති බවට සඳහන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

අනවසර ඉදිකිරිම් ගනනාවක් නගරයේ තියෙනවා. නගරයේ සියළු අනවසර ඉදිකිරිම් ඉවත් කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

**2025.08.07** දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති පරිසර හා පහසුකම් කමිටුවේ ගෙන ඇති තීරණයක් අනුව කුරුවිට නගරයේ මේ වන විට හඳුනාගෙන ඇති අනවසර ඉදිකිරිම් සියල්ල ඉවත් කිරිමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-112.**

කුරුවිට ප්‍රාදේශිය සභාව හා වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කසළ කළමණාකරන ව්‍යාපෘතියේ , තනි මහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරිම ව්‍යාපෘතියේ වැඩ අවසන් බිල්පත ගෙවිම් කිරිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

පුද්ගලිකව මම මේ යෝජනාවට එකඟත්වයක් නොමැති බව සටහන් කරන්න. ඉදිරියේදි නීති ගැටළු එයි. මගේ අකැමැත්ත පල කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

ආණ්ඩුකාර අනුමැතියෙන් ආරම්භ කරලා කොටසක් ගෙවීම් කරලා. මේ අවසන් බිල්පතට අපෙන් අනුමැතිය ඉල්ලනවා. මේ කටයුත්තට සහාය දෙන්න බෑ. සභාවට අයත් නොවන බිමක කල ඉදි කිරිමක්. බන්ධනාගාරය තුල තියෙන එකක්. අධීක්ෂණයක් විතරයි අපෙන් වෙන්නේ.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මේ කටයුත්ත සිදු වෙලා තියෙන්නේ සභාව නොමැති කාලේ. ඒ නිසා මම ඉල්ලනවා මේ ගෙවීම සිදු කිරිමට පෙර පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ගන්න කියලා. විස්තර දෙන්න.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -

මේ සභා අරමුදල් යටතේ සිදුකල කර්මාන්තය රු.10585120.47 ක මුදලකට ගිවිසුම්ගත වෙලා. ව්‍යාපෘතියේ කටයුතු අවසන් වෙලා. කොන්ත්‍රාත් සිදුකල එල්.පී. කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් අදාළ ගෙවිම් ලබාගන්න යි වැඩ අවසන් බිල්පත ඉදිරිපත් කරලා තියෙන්නේ. පළමු කොටස් බිල්පත වශයෙන් 2024.09.19 දිනැතිව රු. 3058875.90 ක මුදලක් හා දෙවන කොටස් බිල්පත ලෙස රු. 2024.11.26 දින රු. 1750590.00 ක මුදලක් අදාල කොන්ත්‍රාත් කරු වෙත ගෙවලා.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

ලක්ෂ 57 කට වැඩි මුදලක් ගෙවීමට තියෙනවා. ආණ්ඩුකාර අනුමැතිය ගමු. ගෙවිමට පෙර කොමසාරිස්තුමාගේ මග පෙන්විම ද ලබා ගමු.

මෙම අවස්ථාවේදි ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා විසින් මෙම යෝජනාව සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු ලබා ගැනීම සඳහා මහා සභාව කාරක සභාවක් බවට පත් වන ලෙසට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවේදි ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා විසින් අදහස් දක්වමින් මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තු කාලය, ගිවිසුම්ගත විම ,ටෙන්ඩර් ක්‍රමවේදය, පිළිබඳව තොරතුරු ලබාදෙන ලෙස දැන්වූ අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා විසින් මෙම යෝජනාව කාගේ යෝජනාවක්ද යන්නත් තොරතුරු ලබාදෙන ලෙස දැනුම් දෙන ලදි. ගරු සභාපතිතුමා විසින් අදහස් දක්වමින් 2023.11.22 දින ආරම්භ කර ඇති ව්‍යාපෘතිය ලේකම් තීරනයක් ගෙන පළාත් ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබාගෙන ඇති බවත් සඳහන් කරන ලදි. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් අදහස් දක්වමින් මෙම යෝජනාව කවුරුන් විසින් ඉදිරිපත්කලේද ,තීරණය කලේ කෙසේද, අනුමැතිය ගත්තේ කෙසේද. කොන්ත්‍රාත් කරුවන් කොපමණ ඉදිරිපත් උනේද, ආදි සියළු විස්තර ඉදිරි මහා සභාවට ලබාදෙන ලෙස දන්වන ලදී.

නැවතත් ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහා සභාව බවට පත් විය.

<u>ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා -</u>

කුරුවිට ප්‍රාදේශිය සභාව හා වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කසළ කළමණාකරන ව්‍යාපෘතියේ , තනි මහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරිම ව්‍යාපෘතියේ වැඩ අවසන් බිල්පත ගෙවිම් කිරිම සම්බන්ධව ඉදිරි මහා සභාවට මෙම ව්‍යාපෘතිය පිලිබඳව සියළු විස්තර ඉදිරිපත් කරමු. එසේම පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ලබාගැනීමද සිදුකර ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාව හා වලදූර බන්ධනාගාරය එක්ව ක්‍රියාත්මක කසළ කළමණාකරන ව්‍යාපෘතියේ , තනි මහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරිම ව්‍යාපෘතියේ වැඩ අවසන් බිල්පත ගෙවිම් කිරිම සම්බන්ධව ව්‍යාපෘතියේ සියළු තොරතුරු පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කර එම උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කිරිමටත් ව්‍යාපෘතියේ සියළු තොරතුරු මහා සභාව වෙත ලබාදිමටත් ඒකමතිකව මහා සභා තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-113.** කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන 2025 ජාතික කියවිම් මාසය ට අදාලව සභාවේ මහජන පුස්තකාල මගින් ක්‍රියාත්මක කිරිමට නියමිත වැඩසටහන් සඳහා අනුමැතිය ලබාදීමට මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

*පුස්තකාල හතරට අදාල වැඩසටහන් දක්වා තියෙනවා. ඒ අනුව කුරුවිට මහජන පුසතකාලයට අදාලව පුස්තකාල මුහුණු පොත ඔස්සේ විවිධ කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් පිලිබඳව ප්‍රචාරය කිරිම, පුස්තකාල වැඩසටහන් පිළිබඳව දැන්වීම් පුවරු හා වට්ස්ඇප් මගින් දැනුවත් කිරිම, විද්‍යුත් මාධ්‍ය හරහා පාඨක නිර්මාණ සංසදයක් පිහිටුවිම, පෙර පාසල් හා පෙරපාසල් දෙමාපියන් සඳහා ජංගම පුස්තකාල සේවාවක් පැවත්විම බල ප්‍රෙද්ශයේ නිවෙස් ආශ්‍රිතව ගෘහස්ත පුස්තකාල ආරම්භ කිරිම, කියවීමේ මාසය නිමිති කොට ගෙන මෙතෙක් පුස්තකාල සාමාජිකත්වය ලබා නොගත් පාඨක යන් සඳහා ඔක්තොම්බර් මස 01 සිට 31 දක්වා නොමිලේ සාමාජිකත්වය ලබාදීමද අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන්, කතන්දර පැය වැඩසටහන, කියවීමේ කඳවුරු පැවත්වීම, බිත්ති පුවත් පත, හොඳම පාඨකයා තේරීමේ තරඟය, සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම ද ඇතුලත්.*

*දොඩම්පෙ මහජන පුස්තකාලයට අදාලව පෙරපාසැල් ළමුන් සඳහා ජංගම පුස්තකාල සේවා පැවැත්විමටද, ඔක්තොම්බර් 01 සිට 31 දක්වා නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දිම, බිත්ති පුවත් පත, ළමා නිර්මාණ අළුත් කිරීම, අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහනක් පැවැත්වීම, සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම ද ඇතුලත්.*

*නාමල්දෙනිය මහජන පුස්තකාලය සඳහා , සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම, පෙර පාසල් හා පෙරපාසල් දෙමාපියන් සඳහා ජංගම පුස්තකාල සේවාවක් පැවැත්විම, ඔක්තොම්බර් 01 සිට 31 දක්වා නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දිම, , අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහනක් පැවැත්වීම,*
*පුනරුදයක් සඳහා කියවමු තේමා කොටගෙන නිර්මාණ බිත්ති පුවත්පතේ පල කිරිම, පුස්තකාල දැන්වීම් පුවරුව හා වට්ස්ඇප් හරහා තොරුතුරු පාඨකයාට ලබා දිම,*

*කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා පුස්තකාල දැන්වීම් පුවරුව හා වට්ස්ඇප් හරහා පුස්තකාල තොරුතුරු පාඨකයාට ලබා දිම, ජංගම පුස්තකාල, කියවීම් කඳවුරු පැවැත්විම, කතන්දර පැය වැඩසටහන, සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම ද ඇතුලත් අතර සභා බල ප්‍රදේශය තුල සංස්කෘතිකමය වටිනාකම් ඇති ස්ථාන සම්බන්ධව පොතක් සකස් කිරිමද ඇතුලත්.*

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන 2025 ජාතික කියවීම් මාසය ට අදාලව සභාවේ මහජන පුස්තකාල මගින් ක්‍රියාත්මක කිරිමට නියමිත කුරුවිට මහජන පුස්තකාලයට අදාලව පුස්තකාල මුහුණු පොත ඔස්සේ විවිධ කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳව ප්‍රචාරය කිරිම, පුස්තකාල වැඩසටහන් පිළිබඳව දැන්වීම් පුවරු හා වට්ස්ඇප් මගින් දැනුවත් කිරිම, විද්‍යුත් මාධ්‍ය හරහා පාඨක නිර්මාණ සංසදයක් පිහිටුවීම, පෙර පාසල් හා පෙරපාසල් දෙමාපියන් සඳහා ජංගම පුස්තකාල සේවාවක් පැවුත්වීම බල ප්‍රෙද්ශයේ නිවෙස් ආශ්‍රිතව ගෘහස්ත පුස්තකාල ආරම්භ කිරිම, කියවීමේ මාසය නිමිති කොට ගෙන මෙතෙක් පුස්තකාල සාමාජිකත්වය ලබා නොගත් පාඨක යන් සඳහා ඔක්තොම්බර් මස 01 සිට 31 දක්වා නොමිලේ සාමාජිකත්වය ලබාදිමද අන්තර් ජ්ස්තකාල සහයෝගිතා වැඩසටහන්, කතන්දර පැය වැඩසටහන, කියවීමේ කඳවුරු පැවත්වීම, බිත්ති පුවත් පත, හොඳම පාඨකයා තේරීමේ තරඟය, සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම ද

දොඩම්පෙ මහජන පුස්තකාලයට අදාලව පෙරපාසැල් ළමුන් සඳහා ජංගම පුස්තකාල සේවා පැවැත්වීමටද, ඔක්තොම්බර් 01 සිට 31 දක්වා නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දිම, බිත්ති පුවත් පත, ළමා නිර්මාණ අළුත් කිරීම, අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහනක් පැවැත්වීම, සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම ද

නාමල්දෙනිය මහජන පුස්තකාලය සඳහා , සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම, පෙර පාසල් හා පෙරපාසල් දෙමාපියන් සඳහා ජංගම පුස්තකාල සේවාවක් පැවැත්විම, ඔක්තොම්බර් 01 සිට 31 දක්වා නොමිලේ පුස්තකාල සාමාජිකත්වය ලබා දිම, , අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහනක් පැවැත්වීම,
පුනරුදයක් සඳහා කියවමු තේමා කොටගෙන නිර්මාණ බිත්ති පුවත්පතේ පල කිරිම, පුස්තකාල දැන්වීම් පුවරුව හා වට්ස්ඇප් හරහා තොරුතුරු පාඨකයාට ලබා දිම, ද

කිරිඇල්ල මහජන පුස්තකාලය සඳහා පුස්තකාල දැන්වීම් පුවරුව හා වට්ස්ඇප් හරහා පුස්තකාල තොරුතුරු පාඨකයාට ලබා දිම, ජංගම පුස්තකාල, කියවීම් කඳවුරු පැවැත්විම, කතන්දර පැය වැඩසටහන, සාහිත්‍ය උත්සවය සඳහා චිත්‍ර, රචනා, කෙටිකතා, පද්‍ය, සදැස්, නිසදැස්, තරඟ පාසැල් හා විවෘත අංශ වලගින් තරඟ පවත්වා සාහිත්‍ය උත්සවය පැවැත්වීම ද ඇතුලත් අතර සහා බල ප්‍රදේශය තුල සංස්කෘතිකමය වටිනාකම් ඇති ස්ථාන සම්බන්ධව පොතක් සකස් කිරිමද යන වැඩසටහන් පැවැත්වීමට මහා සභාවේ ඒකමතිකව තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 114.** කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ **2025.08.21** දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අඩියර **2** කොටසින් ක්‍රවුන් ලේත් ඉංජිනියරින් ආයතනය වෙත වාණිජ කටයුතු සඳහා ඉඩම් කොටසක් දිර්ඝ කාලීනව බදූ ලබාදීම සම්බන්ධව මහාසභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මේ කටයුත්ත මීට ඉහතදි කලේ ඒකාබද්ද කමිටුවක් මගින්. ඒ විධිහට කමිටුවක් මගින් කටයුත් කිරිම තුලින් වැරදි විම් සිදු විම අවමයි. මේ ස්ථාන පරික්ෂාවේදි ඇතැම් තැන් ඉල්ලලා තියෙන කාරණයට නෙමේ දෙන්නේ. ඒ තැන්වල තියෙන්නේ වෙන වෙන දේවල්. සභාවේ අනුමැතිය දුන්නට පස්සේ ඒවායේ වෙන්නේ වෙනත් කටයුතු .

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

කාර්මික නිලධාරි අවශ්‍යයි. කමිටුවක් පත් කරන්න. මේ අනුමැතියට විවිධ අවශ්‍යතා අනුව කටයුතු කරනවා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

අපිට පුළුවන් කමිටුවක් පත් කරගන්න. මේ අවස්ථාවේ නම් කරගමු. ඒ කමිටුවේ නිර්දේශය අනුව අනුමැතිය ලබාදෙමු. සභාපතිවරයා ඇතුලත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා, කාර්මික නිලධාරි වරයා, ආදායම් පරිපාලක වරයා ඇතුලත්ව කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව හා කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ 2025.08.21 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අධියර 2 කොටසින් ක්‍රවුන් ලේත් ඉංජිනියරින් ආයතනය වෙත වාණිජ කටයුතු සඳහා ඉඩම් කොටසක් දිර්ඝ කාලීනව බදු ලබාදීම සඳහා පරික්ෂා කිරිමට සම්බන්ධව පත්කල කමිටුව වන ගරු සභාපතිවරයා ඇතුලත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා, කාර්මික නිලධාරි වරයා, ආදායම් පරිපාලක වරයා ඇතුලත් කමිටුවේ නිර්දේශය ලබාගෙන ඒ අනුව මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

06 -115. කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ 2025.08.28 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අධියර 2 කොටසින් මිනිපුර ග්‍රැනයිට් ආයතනය වෙත ඉඩම් කොටසක් වාණිජ කටයුතු සඳහා දිර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි. කමිටු නිර්දේශය ගමු.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව හා කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ **2025.08.28** දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අඩියර **2** කොටසින් මිනිපුර ග්‍රැනයිට් ආයතනය වෙත ඉඩම් කොටසක් වාණිජ කටයුතු සඳහා දිර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව සඳහා පරික්ෂා කිරිමට සම්බන්ධව පත්කල කමිටුව වන ගරු සභාපතිවරයා ඇතුලත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා, කාර්මික නිලධාරි වරයා, ආදායම් පරිපාලක වරයා ඇතුලත් කමිටුවේ නිර්දේශය ලබාගෙන ඒ අනුව මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06 –116.** කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ **2025.08.14** දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අඩියර **2** කොටසින් හිදැල්ලන ටි පැක්ටරි ආයතනය වෙත වාණිජ කටයුතු සඳහා ඉඩම් කොටසක් දිර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව මහාසභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි. කමිටු නිර්දේශය ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව හා කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ **2025.08.14** දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අඩියර **2** කොටසින් හිදැල්ලන ටි පැක්ටරි ආයතනය වෙත වාණිජ කටයුතු සඳහා ඉඩම් කොටසක් දිර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව සඳහා පරික්ෂා කිරිමට සම්බන්ධව පත්කල කමිටුව වන ගරු සභාපතිවරයා ඇතුලත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා, කාර්මික නිලධාරි වරයා, ආදායම් පරිපාලක වරයා ඇතුලත් කමිටුවේ නිර්දේශය ලබාගෙන ඒ අනුව මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 117.** කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ **2025.08.15** දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අඩියර **2** කොටසින් වලදූර වසමේ ගජනිත් ගමගේ ස්වර්ණලතා මිය හට කෘෂිකාර්මිත කටයුතු සඳහා ඉඩම් කොටසක් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව මහාසභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
**එම යෝජනාව ස්ථිර කරමි. කමිටු නිර්දේශය ගමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව හා කුරුවිට ප්‍රාදේශිය ලේකම්ගේ 2025.08.15 දිනැති ලිපිය අනුව පැරඩයිස් නාලන්ද එල්ලාවල කර්මාන්තපුරයේ අඩියර 2 කොටසින් වලදුර වසමේ ගජනිත් ගමගේ ස්වර්ණලතා මිය හට කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් කොටසක් දීර්ඝ කාලීනව බදු ලබාදීම සම්බන්ධව**
**පත්කල කමිටුව වන ගරු සභාපතිවරයා ඇතුලත්ව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා, කාර්මික නිලධාරි වරයා, ආදායම් පරිපාලක වරයා ඇතුලත් කමිටුවේ නිර්දේශය ලබාගෙන ඒ අනුව මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
**06-118. මලව, කුරුවිට, බී.ඩබ්.එම්. තිළින රශික කුමාර මයාගේ ඉල්ලීම අනුව ඔහු විසින් ආරම්භ කිරිමට නියමිත මාළු තොග සහ සිල්ලරට විකිණීමේ ව්‍යාපාරයේ , පැලියගොඩ තොග වෙළඳ මධ්‍යස්ථානයෙන් රැගෙන විත් කුරුවිට නගරයේ තොග හා සිල්ලරට විකිණීමට සුදුසු බිම් කොටසක් කුරුවිට නගරයේ ලොරි රථගාල පිහිටි ව්‍යාපාරික ස්ථානයේ බදු පදනම මත තාවකාලික ඉදිකිරිමක් සඳහා ඉල්ලීම් කර ඇති අතර මේ සම්බන්ධයෙන් මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
**තොග සහ සිල්ලර වෙළඳාමටයි ඉල්ලා සිටින්නේ. බදු පදනම මත**

**දැනට කුරුවිට නගරයේ මාළු වෙළඳ ස්ථාන තුනක් තියෙනවා. මේකත් දැම්මොත් හතරයි. මේ විදිහට ඉල්ලන ඉල්ලන කෙනාට දෙන්න ගියොත් නගරයේ පරිසරයට අපද්‍රව්‍ය බැහැරවීම හා පරිසරයට හානි විම වැඩි වෙනවා. මේ ස්ථානය, ලොරි රථ ගාල. එතන මාළු ලැලි දානකොට තවත් අය ඉල්ලුවොත් නවත්වන්න බෑ. කාගේ හෝ සබඳතාවක් මතයි මේවා වෙන්නේ. එරත්න, මිල්ලවිටිය කෙනෙක් ඉල්ලුවොත් දෙනවාද? මේ බාධාවක් කරනවා නෙමෙයි. හැමෝම ඉල්ලනවා තොග වෙළඳාමට. අනෙක් අයටත් සාධාරණයක් වෙන විදිහට කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -

මේවා ව්‍යාපාරික ඉල්ලීම්. තරඟකාරිත්වය වැඩිවීම තුලින් නගරයට එන ජනතාවටයි හොඳක් වෙන්නේ. මහජන සෞඛ්‍ය පරික්ෂක, පරික්ෂා කරලා සුදුසු තැනක් දෙන්න. තවත් ව්‍යාපාරිකයෙක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>
මාකට් එක යට මාළු කඩේ ගත්තේ නෑ.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
ඒක මාසෙට රු. 44000.00 ක් වෙනවා. ටොයිලට් එක ළඟ අවුරුද්දට රු. 1000.00 ක බලපත්‍ර ගාස්තුවක් විතරයි ගෙවන්නේ. ඒ ස්ථානය හොඳම තැනක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>
නඩුවක් කියලා ඒ අයට එතන දෙන්න උනා. නාගරික සංවර්ධන අධිකාරිය එක්ක කතා කරලා එතන භූමිය දුන්නේ.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>
මස් මාළු වෙළඳාමට සභා අනුමැතියක් ඕනි. ශබ්ද දූෂණය වායු දූෂණය වෙනවද බලනවා. පාරේ දෙපැත්තේ පීකර් දාගෙන කිරිඇල්ලේ මේවා කරන්නේ. කෑගහනවා තැනතැන. මේ ආදායම් සභාවට අයකර ගන්න. කඩ කුලිය ගන්න කතා කරලා. සෙනඟ ගැවසෙන ස්ථාන වල.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>
මේ ස්ථානය තව අය ඉල්ලලා නම් ටෙන්ඩර් කරමු. හැමෝටම අවස්ථාව එනවනේ.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
මාළු කඩේ සැලැස්ම ඕනි. සභාව සතු මාළු කඩේ ගන්නේ නැත්නම් වාර්තා අරන් ලංසුව අඩු කරමු. ඒ කටයුත්ත කරන්න. දේවින්ද මන්ත්‍රීතුමා කීවා වගේ ව්‍යාපාර වලට සහාය වෙන්න ඕනි. තරගකාරිත්වය වටිනවා. මේ වෙළඳාමට සුදුසු තැනක් වාර්තා අරන් දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>
අපේ එක තියෙද්දි වෙන එකක් කරන්න පුළුවන්ද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
අපි මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තා අරන් ආදායම් පරිපාලක වාර්තා අරන් මේ ඉල්ලීම පිළිබඳව සාකච්ජා කරලා වාර්තා අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගමු. දෙනවා නම් තක්සේරු කරලා ,ටෙන්ඩර් කටයුතු, නිත්‍යානුකූල ක්‍රමවේදය අනුව කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව හා මලව, කුරුවිට, බී.ඩබ්.එම්. තිළින රශික කුමාර මයාගේ ඉල්ලීම අනුව ඔහු විසින් ආරම්භ කිරිමට නියමිත මාළු තොග සහ සිල්ලරට විකිණීමේ ව්‍යාපාරයේ , පැලියගොඩ තොග වෙළඳ මධ්‍යස්ථානයෙන් රැගෙන විත් කුරුවිට නගරයේ තොග හා සිල්ලරට විකිණීමට සුදුසු බිම් කොටසක් කුරුවිට නගරයේ ලොරි රථගාල පිහිටි ව්‍යාපාරික ස්ථානයේ බදු පදනම මත තාවකාලික ඉදිකිරිමක්

සඳහා වන ඉල්ලීම සම්බන්ධයෙන් මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තා හා ආදායම් පරිපාලක වාර්තා ගෙන ඉල්ලීම පිළිබඳව සාකච්ඡා කර වාර්තා අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් ව්‍යාපාරික ස්ථානය ලබා දෙන්නේ නම් තක්සේරු කර ටෙන්ඩර් ක්‍රමවේදය අනුව නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරිමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 119.** පහලගම, එල්ලාවල බී.ඩී.එස් නන්දසිරි මහතාගේ ඉල්ලීම අනුව එල්ලාවල අමුන්දර පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි. මින් පසුව මෙම යෝජනා මන්ත්‍රීවරයෙකු මගින් සභාවට ඉදිරිපත් කරන්න.
ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව හා පහලගම, එල්ලාවල බී.ඩී.එස් නන්දසිරි මහතාගේ ඉල්ලීම අනුව එල්ලාවල අමුන්දර පාර සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-120.** පහලගම, එල්ලාවල ජනතාවගේ ඉල්ලීම අනුව පොදු සුසානභූමියට යන මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි. මින් පසුව මෙම යෝජනා මන්ත්‍රීවරයෙකු මගින් සභාවට ඉදිරිපත් කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් පසුව පහත තීරණය සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව හා පහලගම, එල්ලාවල ජනතාවගේ ඉල්ලීම අනුව පොදු සුසානභූමියට යන මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**07.** කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම -
**07 - 01. 2025.08.25** දිනැති මුදල් කමිටු වාර්තාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

කමිටු වාර්තාවේ අංක 7,8,9 යටතේ වන යෝජනා කාගේද? ඒවා ක්‍රියාත්මක කරලද?

<u>**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා**</u>

එම යෝජනා ආණ්ඩුකාර අනුමැතිය මත සිදු කර ඇති කර්මාන්ත.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -**</u>

සභාව නැති කාලේ යෝජනා ගෙනාවට දැන් සභාව තියෙනවා. විපක්ෂයකුත් තියෙනවා. තියෙන ප්‍රතිපාදන ප්‍රමාණවත්ද ?
මෙම අංක 07 යටතේ දක්වා ඇති තීරණයේ වචන වෙනස් වීම් මත වැඩ අවසන් හා ක්‍රියාත්මක කිරීමට නියමිත යන්න පිලිබඳව සාකච්ඡා කර නිරාකරනය කරගන්නා ලදී. එසේම මේ අවස්ථාවේදි මුදල් කමිටු වාර්තාව පිලිබඳව සාකච්චා කර ගැනීමට මහා සභාව කාරක සභාවක් බවට පත් විම **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා ගේ ස්පීරත්වයෙන් යුතුව සිදු කරන ලදී. ඒ අනුව කාරක සභා අවස්ථාවේදි මුදල් කමිටු වාර්තාවේ අංක 05,10,11, සාකච්ජා කර ගැටළු විසඳා ගන්නා ලදී. එසේම අංක 33 යටතේ වන මෙම සභාවේ 8405 ත්‍රි රෝද රථයේ අළුත්වැඩියා කිරිම් වෙනුවෙන් ගෙවීම් කිරිම පිළිබඳව සාකච්ජා කරන ලදී.**

නැවතත් කාරක සභාව මහා සභාව බවට **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා ගේ ස්පීරත්වයෙන් යුතුව සිදු කරන ලදී.**
**මෙම අවස්ථාවේදී මුදල් කමිටු වාර්තාවේ අංක 33 යටතේ සඳහන් ත්‍රි රෝද රථ අළුත්වැඩියාව, අංක 34 යටතේ සඳහන් ටැක්ටරයේ රේඩියේටරය අළුත්වැඩියාව පිලිබඳව දීර්ඝ ලෙස සාකච්ජා කල අතර වියදම් අවම කිරීම හා විනිවිද භාවය වෙනුවෙන් මිළ ගනන් කැඳවා කිසි ක්‍රමවේදය අනුව වාහන අළුත්වැඩියා කටයුතු ආදිය සිදු කල යුතු බවට අවධාරණය කරන ලදී.**

ඒ අනුව **2025.08.25** දිනැති මුදල් කමිටු වාර්තාව මහා සභාවේ සලකා බලන ලදී.

**07 –** 02. 2025.07 .29 දිනැති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව.<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -**</u>
සභාවේ කසළ වෙන් කරන ස්ථානයේ උද්‍යාණයක් ලෙස සංවර්ධනය කරන බව සඳහන් විය යුතුයි.
07. – 03. 2025.08.19 දිනැති කාර්මික කමිටු වාර්තාව.

2025.08.19 දිනැති කාර්මික කමිටු වාර්තාව පිලිබදව මහා සභාවේ සලකා බලන ලදී.

**08 .** ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා-
**08-01. 2025 අගෝස්තු මස ගෙවීම් වාර්තාව.**
**2025 අගෝස්තු මස ගෙවීම් වාර්තාව පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.**

**08-02. 2025 ජූලි මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව**
**2025 ජූලි මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.**

**08-03. 2025 ජූලි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.**
**2025 ජූලි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය මහා සභාවේ සළකා බලන ලදී.**

**08- 04. 2025 ජූලි මස ඒකාබද්ධ වැය සාරාංශය.**

**2025 ජූලි මස ඒකාබද්ධ වැය සාරාංශය මහා සභාවේ සළකා බලන ලදී.**

**09.** සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්
<u>**1.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමරත්න මල්කැකුළ මහතා -</u>

පරකඩුව මෙනේරිපිටිය අවමංගල්‍යාධාර සමිතියට ප්‍රජා ශාලාවකට ඉඩමක් පළාත් සභාවෙන් දුන්නා. ක්‍රීඩා පිටිය ආරක්ෂා වෙන විදිහට වෙන් කරලා පර්චස් 10 ක්. එවකට ගරු පළාත් සභා මන්ත්‍රී ජී.එම්.කරුණාපාල මහතා මේ සම්බන්ධව මුල් වී කටයුතු කලා. ඒ බිම් කොටස මැන වෙන්කර සැලසුම් සකස් කළ බවත් සඳහන්. ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කරන්න. ලිපිය ඉදිරිපත් කරමි.

<u>**2.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

ගරු ජනාධිපතිතුමා ලිකර් ෂොප් දානවට දැඩි සේ විරුද්ධ උන කෙනෙක්. විපක්ෂයේ ඉන්නකොට. නමුත් මේවන විට බල ප්‍රෙද්ශයේ බොහෝ ලිකර් ෂොප්. මත්පැන් අලෙවිසැල්. කුරුවිට ප්‍රධාන මාර්ගයේ මලංගමට යන කොට මාර්ගය දෙපස විතරක් 12 ක ට වැඩිය තියෙනවා. කිරිඇල්ල නගරයට මෙතුවක් කල් කිසිම රජයකින් අරක්කු බාර් ලබා නොදුන් නමුත් මේ වන විට බලපත්‍රයක් ලබාදීමට කටයුතු කරන්න යන බවට කිරිඇල්ලජනතාව විසින් ජනාධිපතිතුමාට යොමු කල ලිපියක පිටපතක් ලැබී තියෙනවා. මේ නැදුන් රජමහා විහාරය පිහිටි කිරිඇල්ල නගරයේ මෙවැන්නකට ඉඩ දෙන්න එපා කියලා ඉල්ලා තියෙනවා.
ඒ ලිපිය ඉදිරිපත් කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා -</u>

**මේ ලිපි නිර්ණාමික ඒවා. තොරතුරු අසත්‍යයි. මඩල එකයි. හැරණියාවන දෙකක් තියෙනවා. ඇමතිතුමා අනුමත කරන්නේ නෑ. මේ ලිපිය කව්රු ලිව්වද ඒ ගැන සොයමින් ඉන්නේ.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>
**මේ ස්ථානයේ බාර් පර්මිට් වලට ජනතා විරුද්ධත්වය තියෙනවා කියලා දන්වා හරිමු.**

**මෙදිනට නියමිත මහා සභාවේ කටයුතු අවසන් වූ අතර ගරු සභාපතිතුමා විසින් සභාවේ සියළු කටයුතු සඳහා සහාය දුන් සියළු ගරු මන්ත්‍රී තුමන්ලාට හා ගරු උප සභාපති තුමාට , මාධ්‍ය හිතවතුන්ට, කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කරන ලදි.**

**මහා සභා රැස්වීමේ කටයුතු ප.ව.7. 00 ට පමණ අවසන් කරන ලදී.**

එම්.විකසිත පුෂ්පසූරිය ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන්
සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන්
හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන
අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී